# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2013** නොවැම්බර් **26** වන අඟහරුවාදා
2013 நவம்பர் 26 செவ்வாய்க்கிழமை
Tuesday 26th November 2013

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல, ஸ்ரீ ஜயவர்த்தனபுர, டென்சில் கொப்பேகடுவ மாவத்தை, இல. 204 இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.40 ට පළාත් සභාව රැස් විය.**
மு.ப. 09.40 க்கு சபை கூடியது

The Provincial Council met at 09.*40* a.m.

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு. தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# සභාපතිවරයාගේ නිවේදන
## ANNOUNCEMENTS OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*i*

*"2013 ඔක්තෝබර් 08 වන දින සභා සම්මත 2013 අංක 06 දරන බස්නාහිර පළාතේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය (සංශෝධන) ප්‍රඥප්තිය සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් 2013 ඔක්තෝබර් මස 30 වන දින අනුඥාව සටහන් කර ඇති බව දැනුම් දෙනවා."*

*ii*

*"අද දින මා විසින් පිළිගන්වනු ලැබීමට නියමිත, 2013.11.05 දිනැති සභා කටයුතු පිළිබඳ කාරක සභා වාර්තාවේ පිටු අංක 04 හි 2014 වසරට අදාළ මුදල් ප්‍රකාශය පිළිබඳ විවාද කාල සටහනත් ඇතුළත්ව තිබෙන බව කාරුණිකව දැනුම් දෙනවා."*

# කාරක සභා වාර්තා
## COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2013.11.05 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම පිළිගන්වනවා.

***අදාළ වාර්තාවේ පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*Hon. Chairman declared that a copy of the relevant report is placed on the tables of the Hon. Members.*

# පෙත්සම්
## PETITIONS

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, නෑබඩ, වරකාගොඩ, අනුර බෙකරිය හි ඩී.එච්.ඩී. සිරිපාල යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***
*Petition Presented, ordered to refer to the Petitions committee*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රයේ අංක 01 යටතේ සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ගරු සෞඛ්‍ය අමාත්‍යතුමාට ඉදිරිපත් කිරීමට අවස්ථාව.

**ගරු ප්‍රසන්න රණතුංග** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකී රක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂයය භාර අමාත්‍යතුමා)
Hon. Prasanna Ranathunga (Chief Minister and the Minister of Finance and Planning, Law and Order, Land, Education, Local Government, Provincial Administration, Manpower and Employment, Economic Promotion, Power and Energy and Trade Affairs)

සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අදාළ න්‍යාය පත්‍රයට යොමු කරනවා.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ඇද්ද?

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

මම එහෙම නම් නැගිටින්නද? නැගිටලා ගණපූරණය අහනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා ඔබතුමා නිශ්ශබ්ද වෙන්න. උදේ පාන්දරම පටන් ගන්නවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

මම නොවෙයි පටන් ගන්නේ. අර පැත්තෙන්. මම මොනවා පටන් ගන්නද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා මන්ත්‍රීතුමා නිශ්ශබ්ද වෙන්න. මේක ඉතාම වැදගත් අවස්ථාවක්.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ අයවැය ලේඛනය ඉදිරිපත් කරන දවසේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට එන්න බැරි නම් අපි මොනවාටද මේක ගෙනියන්නේ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

හරි හරි, වාඩි වෙන්න කෝ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට බාධා කිරීම් කරන්න එපා. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු දැන ගන්න ඕනෑ තමුන්ගේ මන්ත්‍රීවරුන්ව ගෙන්වා ගන්න.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඉල්ලගෙන කන්න හදන්න එපා. (බාධා කිරීම්) ඔබතුමන්ලා මහ ඇමැතිතුමාට සලකන්නේ නැහැ. ඒකයි වෙලා තියෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වෙන්න. අනවශ්‍ය විවාදවලට යන්න එපා. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමන්ලාගෙන් මම ඉල්ලා සිටිනවා, විපක්ෂයට වැඩිය ඔබතුමන්ලා සභා ගර්භය තුළ පොඩ්ඩක් ආදර්ශවත් වෙන්න. විපක්ෂයට බාධා කිරීම් කරන්න එපා. අද ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ අයවැය ඉදිරිපත් කරන්න තිබෙන්නේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, දැන් සභාවේ ගණපූරණය තියෙනවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී සභාවේ ගණපූරණය තිබෙනවා.

න්‍යාය පත්‍රයේ අංක 02 යටතේ නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ගරු ප්‍රවාහන අමාත්‍යතුමාට ඉදිරිපත් කිරීමට අවස්ථාව.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා සභාව ඇතුළට ආවා. මම දැක්කා

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ප්‍රශ්නවලට උත්තර දෙන්න එන්නේ නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇත්ත වශයෙන්ම කනගාටු වෙනවා. විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් ප්‍රශ්නයක් ඇහුවාම සභාවේ ඉන්න ඕනෑ. එතුමා දැන් සභාවට ආවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, දැන් ඊළඟට අයවැය පටන් ගන්නවා. ඇමැතිතුමා ඇවිල්ලා එළියේ ඉන්නවා. නමුත් සභාව ඇතුළට එන්නේ නැහැ. අමාත්‍යවරයෙක් විධියට මන්ත්‍රීවරයෙක් අහන ප්‍රශ්නයකට උත්තර දෙන්න එතුමා සභාවට එන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. ඔබතුමාගේ ප්‍රශ්නය මම -

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, මේ පිළිබඳ විශේෂ අවධානය යොමු කරන්න කියලා ඔබතුමා හරහා මම මේ වෙලාවේ ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. අපි ප්‍රශ්නයක් ඇහුවාම උත්තර දෙන්න මේ අමාත්‍යවරයා සභාවට එන්නේ නැහැ. සාමාන්‍යයෙන් අපි අහපු හැම ප්‍රශ්නයකට එතුමා උත්තර දෙන්න තුන් හතර වතාවක් කල් අරගෙන තිබෙනවා. දැන් සභා පරිශ්‍රයට ඇවිල්ලා ඉන්නවා. සභාව ඇතුළට එන්නේ නැහැ. ඩුවෙල් සීම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ ප්‍රශ්නය ඊළඟ න්‍යාය පත්‍රයට ඇතුළත් කරනවා.

මම අමාත්‍යතුමන්ලාගෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. විශේෂයෙන් ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙන අවස්ථාවේ සභා ගර්භයේ රැදී සිටීම ඉතාම වැදගත් වෙනවා. න්‍යාය පත්‍ර යේ අංක 03 යටතේ නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්න ගරු ප්‍රවාහන අමාත්‍යතුමාට ඉදිරිපත් කිරීමට අවස්ථාව.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ප්‍රශ්නය ඉදිරිපත් කරනවා. ඉතිං නත්ථි මේ සරණං.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ සිද්ධිය සම්බන්ධයෙන් මම ඉතාම කනගාටු වෙනවා. ඒ ප්‍රශ්නයත් මම ඊළඟ න්‍යාය පත්‍රයට ඇතුළත් කරනවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඇමැතිවරයෙක් විධියට එතුමාව පත් කරන කොට මේක වෙයි කියලා අපි දැනගෙන හිටියා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රයේ අංක 04 යටතේ සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ගරු සෞඛ්‍ය අමාත්‍යතුමායට ඉදිරිපත් කිරීමට අවස්ථාව.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අදාළ න්‍යාය පත්‍රයට යොමු කරනවා.

## පෞද්ගලික පැහැදිලි කිරීම්
## PERSONAL EXPLANATIONS

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මේ කාලය ලබා දීම ගැන මම ස්තුතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, ඇත්තම කිව්වොත් කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය ඉතාමත් ප්‍රයෝජනවත්. මම හිතන්නේ, අපට අද ජා-ඇළ ඉඳලා

[ ගරු ශ්‍රීනාත් පෙරේරා ]

විනාඩි 08 කින් පැලියගොඩට එන්න පුළුවන්. ඉතින් අපි සන්තෝෂ වෙනවා කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය නිම කරලා ජනතාවට ලබා දීම ගැන. ඒත් එක්කම කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය විවෘත කිරීමත් සමඟම ජා-ඇළ නගර සභා ක්‍රීඩා පිටියේ ඊට අදාළ උත්සවය තිබ්බා, අපි දැක්කා. ඉතාමත් ආකර්ශනීය ලෙස. රුපියල් 1000 කුත්, බත් පැකට් එකකුත් දෙනවා කියලා පෝස්ටර් ගහලා තිබුණා. ලීප්ලට් බෙදුවා. බත් පැකට් එක කන්නත් සෙනග ආවා. නමුත් මේ හරහා ඒ ක්‍රීඩා පිටියට වුණු විනාශය අති විශාලයි ගරු සභාපතිතුමනි. මේ අවස්ථාවේදී ඒ පිළිබඳව මතක් කරලා දෙන්න ඕනෑ. මේ නගර සභා ක්‍රීඩා පිටියට අවුරුදු ගණනාවක් තිස්සේ නගර සභාවෙන්වත් කිසිම දෙයක් නොකරපු ක්‍රීඩා පිටියක්. මඩ වළක් වෙලා තිබුණේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා මට ඉදිරිපත් කරලා තිබෙන්නේ කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය මඟින් ජනතාවට ලැබෙන ප්‍රතිලාභ -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේකත් ප්‍රතිලාභයක් තමයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වෙන කාරණයක් ගැන නේ කියන්නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේකත් ප්‍රතිලාභයක් තමයි.

[සභාවේ ඝෝෂා]

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රතිලාභ ගැන කථා කරන්න ඉල්ලලා තිබෙන්නේ. හානිය ගැන කථා කරන්න ඉල්ලීමක් කරලා නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

හරි ඒකත් ප්‍රතිලාභයක් තමයි. මම කථා කරන්නේ ඒ අවට තිබෙන පරිසරය විනාශ වීම ගැන.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කෙටියෙන් කථා කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, ඒ අවට පරිසරයට වුණු හොඳ දේවල් වාගේම නරක දේවලුත් තිබෙනවා. ඒ නිසා තමයි මම කියන්නේ ජා-ඇළ නගර සභා පිට්ටනිය -

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මෙතුමා කිව්වා රුපියල් 1000 කුත්, බත් පැකට් එකකුත් දෙනවා කියලා පෝස්ටර් ගහලා තිබුණා කියලා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මේ ජා-ඇළ නගර සභා ක්‍රීඩා පිටිය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කලින් ප්‍රකාශයක් කළා රුපියල් 1000 ක් -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දැන් ඔබතුමා මහ ඇමැතිතුමා අහන ප්‍රශ්නයම මගෙන් අහනවාද? නැත්නම් ඔබතුමා මගෙන් ප්‍රශ්නයක් අහනවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ, එතුමා අහපු ප්‍රශ්නය නොවෙයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මහ ඇමැතිතුමා ඔබතුමාට කියලා, ඔබතුමා දැන් මගෙන් අහනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහ ඇමැතිතුමාගේ ප්‍රශ්නය නෙවෙයි.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මේක ප්‍රකාශයක්. මේක කාටවත් ප්‍රශ්න අහන්න පුළුවන් එකක් නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අහන්න පුළුවන්. ප්‍රශ්නයක් නැහැ. අපි එපැයි කියන්නේ නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ප්‍රශ්න අහන්න බැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

වරප්‍රසාද ප්‍රශ්නයක්. එතුමා ප්‍රකාශයක් කළා ගරු සභාපතිතුමනි, -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

වරප්‍රසාද ප්‍රශ්න අහන්න මම එතුමා ගැන මුකුත් කිව්වේ නැහැ නේ? එතුමා ගැන මම මුකුත් කිව්වේ නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට අවස්ථාව දෙන්න. අපි දන්නේ නැහැ නේ මොකක් ගැන අහනවාද කියලා. එතුමා 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නය යොමු කරන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

හරි, හරි. අහන්න.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** (කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත සහ පරිසර කටයුතු අමාත්‍යතුමා)
Hon. Udaya Prabhath Gammanpila (Minister of Agriculture, Agrarian Development, Minor Irrigation, Industries and Environmental Affairs.)

ගරු සභාපතිතුමනි, මහ ඇමැතිතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කථා කරන්න.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

පළාත් සභාවේ මහ ඇමැතිතුමා කථා කරන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මහ ඇමැතිතුමාටත් රීතියක් තිබෙනවා.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, ඒ වැඩ සටහන සංවිධානය (බාධා කිරීම්) කරන කොට ඒ කමිටුවේ මමත් හිටියා. ඒ නිසා මගේ වරප්‍රසාදයක් හැටියටයි මේක ඉදිරිපත් කරන්නේ ගරු සභාපතිතුමනි. රුපියල් 1000 යි බත් පාර්සලයයි දෙනවා කියලා එතුමා කිව්වා. පෝස්ටර් ගහලා, ලීෆ්ලට් බෙදලා, තිබෙනවා කියලා. මොකද, මම දන්නවා, ඒක එතුමන්ලාගේ සංකල්පය. නමුත් මම වගකීමෙන් කියනවා. එහෙම කිසිම දෙයක් සිද්ධ වුණේ නැහැයි කියලා. එතුමා ඒ කරපු ප්‍රකාශය වගකීමෙන් කරනවාද කියලා අහනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම කිව්වේ නැහැ නේ ගරු සභාපතිතුමනි, එතුමා දුන්නා කියලා.

[සභාවේ ඝෝෂා]

මම එහෙම කිව්වේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා ඒ ප්‍රකාශය -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ප්‍රසන්න රණතුංග මහ ඇමැතිතුමා බත් පැකට් එකක් දීලා, රුපියල් 1000 ක් දීලා ගෙනාවා කියලා අපි කිව්වේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා කරන ප්‍රකාශය -

**ගරු නිමල් ලාන්සා** (මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදි කිරීම්, ධීවර හා සංචාරක අමාත්‍යතුමා)
Hon. Nimal Lansa - (Minister of Road Development, Animal Production and Development, Housing and Construction, Fisheries and Tourism)

හැමදාම මෝඩයෙක් වගේ කථා කරනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම එතුමා කළා කියලා කිව්වේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට ඕනෑම ප්‍රකාශයක් කරන්න පුළුවන්. ගැටළුවක් නැහැ. නමුත් ඔබතුමා කරන ප්‍රකාශය වගකීමෙන් කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

වගකීමෙන් තමයි කියන්නේ.

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

මොකක්ද, වගකීමෙන් කියන්නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

බත් පැකට් එක දීලා, සල්ලිවලට ගෙන්න ගත්තා.

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

මොකක්ද, වගකීමෙන් කියන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කථා කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා වෙලාවට ආවා නම් ඒක අහගන්න තිබුණා.

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

මොකක්ද, වගකීමෙන් කියන්නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දැන් ඔබතුමා පරක්කු වෙලා ඇවිල්ලා මගෙන් ප්‍රශ්න අහනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා බාධා කිරීම් කරන්න එපා.

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

මම දන්නේ නැහැනේ UNP එකේ මෝඩයෝ ඉන්නවා කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු අමාත්‍යතුමා උදේ පාන්දරම අනවශ්‍ය විවාදවලට යන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, ඔය මෝඩයා, බූරුවා කියලා කෑගහන්නේ අපේ බස්නාහිර පළාත් සභාවේ අධ්‍යාපනය සම්බන්ධයෙන් පත් කරලා තිබෙන අය. කලාප අනුව අධ්‍යාපනය බලා ගන්න මහ ඇමැතිතුමා විසින් පත් කරලා තිබෙන අය. ඒ අය තමයි මේ මෝඩයා බූරුවා කියලා කෑගහන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා අනවශ්‍ය ප්‍රශ්නවලට යන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පැහැදිලිව කියන්න ඕනෑ, සමහර -

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගරු මහ ඇමැතිතුමා එහෙම කාවවත් පත් කරලා නැහැ. මෙතුමා ආවොත් බොරුමයි කියන්නේ. ගරු සභාපතිතුමනි, එතුමාට ඉඳගන්න කියන්න කෝ. එතුමා සභාව නොමඟ අරිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වන්න.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

තාත්තාට තිබෙන මොළේ පොඩ්ඩක්වත් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, එතුමාට බාධා කිරීම් කරන්න එපා. විනාඩි තුනයි තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමා ඔබතුමා විෂයයට අදාළව කථා කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමාට තාත්තාගේ මොළේ තිබෙනවා. ඒකනේ තිබෙන ඒවා ඔක්කොම කරන්නේ. තාත්තා කරපු ඒවා ටික.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා අනවශ්‍ය ප්‍රශ්නවලට යන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

තාත්තාගේ ව්‍යාපාර ඔක්කෝම කරගෙන යනවා. බය වෙන්න දෙයක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විෂයයට අදාළව කථා කරන්න කෝ.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

අපට ව්‍යාපාරයක් තිබෙනවා. රස්සාවක් තිබෙනවා. තමුන්නාන්සේ ජීවත් වෙන්නේ කොහොමද? තමුන්නාන්සේයි, තමුන්නාන්සේගේ තාත්තයි ජීවත් වෙන්නේ දේශපාලනයෙන් නේ? අපට ව්‍යාපාර, රස්සා තිබෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

තමුන්නාන්සේලා ජීවත් වෙන්නේ ගණිකා නිවාස දාලා.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

අපට ව්‍යාපාර තිබෙනවා. තමුන්නාන්සේලා කරන්නේ මහජනතාවගේ සල්ලි හොරකම් කිරීම නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මෙතුමා ජීවත් වන හැටි මම කියන්නම්. කියල දෙන්නද? ආයේ පාරක් අහගන්න ඕනෑද? තව පාරක් අහ ගන්න ඕනෑද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනවශ්‍ය විවාදවලට ඔබතුමා යන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඕනෑ නම් කියලා දෙන්නම්.

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ගිහිල්ලා හිඟා කනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

තමුන්නාන්සේ කරන වැඩවලට වැඩිය හොඳයි හිඟාකන එක.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා අනවශ්‍ය විවාදවලට ගියාම මෙම සභාව -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කැසිනෝ දාන එකට සන්තෝෂයි මෙතුමාට. මොකද මෙතුමාගේ කට්ටියත් එවන්න පුළුවන් එතකොට.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, අද අයවැය ඉදිරිපත් කිරීම තිබෙන්නේ. ඒ නිසා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ඔක්කෝම මේ ගැන හිතන්න ඕනෑ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමාගේ කට්ටිය පොඩ්ඩක් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු සංවිධායකතුමා අපි හැමෝම ඒක හිතන්න ඕනෑ.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රකාශය කරලා අවසන් කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම නොවෙයි නේ කරන්නේ. ඔබතුමන්ලාගේ කට්ටිය -

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ඔබතුමාගේ ප්‍රකාශය කරන්න කෝ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට තව විනාඩියයි තිබෙන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මට මෙපමණ වෙලා බාධා කළා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරන්න දෙයක් නැහැ. මට ඊට වැඩිය වෙලාව දෙන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මාර කථාවක් නේ.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

දෙකක් දීලා ඉවර කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තව විනාඩියයි ඔබතුමාට තිබෙන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, ඔබතුමා නීතියට වැඩ කරනවා නම් අපටත් මොනවා හරි කරන්න වෙනවා ඒ වාගේම.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

මොනවා කරන්නද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කථා කරන්න කෝ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, ඔබතුමා මාර්ගයෙන් ගරු මහ ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම ජා-ඇළ නගර සභා ක්‍රීඩා පිටියෙන් Highway එක සඳහා කෑල්ලක්

ගත්තා. ඒ කැල්ලට ලක්ෂ 200 ක් හම්බ වුණා. වන්දි වශයෙන් ලක්ෂ 200 ක් ජා-ඇළ නගර සභාවට හම්බ වුණා. නගර සභාවට හම්බ වුණු ඒ ලක්ෂ 200 න් ශත පහක වැඩක් ඒ ක්‍රීඩා පිටියට කළේ නැහැ. නමුත් ඒ ප්‍රදේශයේ ජනතාව එකතුවෙලා සල්ලි දාලා ක්‍රීඩා පිටියේ කොටසක් හදා ගත්තා. ඊට පස්සේ මේ Highway එකේ උත්සවය තියන්න නැවතවරක් මේ ක්‍රීඩා පිටිය වැලි දාලා, පස් දාලා පුරෝලා අද වැලි තට්ටුවක් දාල තිබෙනවා. කාටවත් සෙල්ලම් කරන්න බැරි තත්ත්වයකට අද පත් වෙලා තිබෙන්නේ.

ඒ නිසා ගරු සභාපතිතුමනි, ඔබතුමා මාර්ගයෙන් ගරු මහ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ ක්‍රීඩා පිටිය හරියට සෙල්ලම් කරන්න පුළුවන් විධියට, ජනතාවට ව්‍යායාම කරන්න පුළුවන්, පරිහරණය කරන්න පුළුවන් විධියට සකසා දෙන්නය කියලා. මොකද, ජනාධිපතිතුමාත් කිව්වා, මෙය ක්‍රීඩා පිටියක් හැටියට පමණක් පාවිච්චි කරන්න කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන්. කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කථාව අවසන් කරන්න දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට විනාඩි තුනක් දුන්නා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මට විනාඩි තුනක් දුන්නේ නැහැ නේ? මට දුන්නේ විනාඩි දෙකයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා විනාඩි පහක් විතර කථා කළා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මෙතුමන්ලා විනාඩියක් විතර බහුභූත ගැන කථා කළා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා විනාඩි 03 ක් කථා කළා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

සමහර අය මෝඩයෝ ගැන කථා කළා. ඔබතුමා ඒ සඳහා වෙලාව දෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. හරි. කරුණාකර වාඩි වෙන්න. යූ. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා. ඔබතුමාට විනාඩි තුනක කාලයක් තිබෙනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, මම මීට පෙරත් අවස්ථාවකදී කථා කළා, මේ බස්නාහිර පළාත් සභාවේ පෞද්ගලික පැහැදිලි කිරීම් අවස්ථාවේදී බියගම නිදහස් වෙළඳ කලාපයේ ඇන්සල් ලංකා ආයතනයේ වර්ජනය සම්බන්ධයෙන්. ගරු සභාපතිතුමා මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු ආමාත්‍ය මණ්ඩලයේ මැදිහත්වීමක් කරන්න කියන ඉල්ලීම කළා. මම දන්න විධියට නම් තවමත් විසඳුමක් ඒ වර්ජනය සම්බන්ධයෙන් ඇති වෙලා නැහැ. බස්නාහිර පළාත් සභාව කියන්නේ, ලංකාවේ පුංචි ආණ්ඩුව වාගේ. ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඉන්නෙත් ගම්පහ දිස්ත්‍රික්කයේ. එහි තිබෙන ආසනයක් තමයි බියගම ආසනය. බියගම ආසනයේ ප්‍රධාන වෙළඳ කලාපය තමයි, බියගම වෙළඳ කලාපය. එහි තිබෙන ප්‍රධාන ආයතනයක් තමයි ඇන්සල් ලංකා ආයතනය. සේවක සේවිකාවන් විශාල ප්‍රමාණයක් සේවය කරනවා. දැන් මාස දෙකකට ආසන්න කාලයක් මේ වර්ජනය පවතිනවා. මේ වර්ජනය සම්බන්ධව ගම්පහ දිස්ත්‍රික්කයේ පීඩිත ජනතාව මේ රැකියාව -

[සභාවේ සෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න. එතුමාට ප්‍රකාශය කරන්න අවස්ථාව ලබා දෙන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, මම කියන්න හදන්නේ මෙම ආයතනයේ රැකියාව කරන ජනතාවට යම් ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ඒ පාලක පක්ෂයේ, විශේෂයෙන්ම මානව සම්පත් කළමනාකාරතුමිය අනෝමා ද සිල්වා මැතිනියගේ ඒකාධිපති පාලනය නිසා තමයි මෙහෙම වෙන්නේ. ඒ පාලක පක්ෂය, කම්කරු කොමසාරිස් ජනරාල්තුමියවත්, කම්කරු අමාත්‍යතුමාවත්, කම්කරු කොමසාරිස්තුමාවත් කියන කිසිම දෙයක් අහන්නේ නැති තත්ත්වයට පත් වෙලා තිබෙනවා. අදට මාස දෙකකට ආසන්න කාලයක වර්ජනයක් බවට පත් වෙලා තිබෙනවා.

ඒ කෙසේ වෙතත් මම දකිනවා, පවතින රජයත් මේ සම්බන්ධව ඉතා මැලි භාවයක් දක්වන ආකාරය. ඒක නිසා තමයි මේ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ. සේවකයන් භාගයක් විතර තර්ජන මධ්‍යයේ දැනට රැකියාවට යන්න පටන් ගත්තත් යම්කිසි සේවකයන් 400 ක ප්‍රමාණයක් යන්නේම නැතිව ඉන්නවා. එම නිසා ඊයේ වන කොට වර්ජනයේ යෙදෙන සියලුම සේවකයන්ට ලිපියක් නිකුත් කරලා තිබෙනවා, සේවය අත්හැර ගියා සේ සලකන්න කියලා. ඒ නිසා මේ සම්බන්ධයෙන් ඉතාම විශාල අර්බුදයකුත් ඇති වෙන්න පුළුවන්. රතුපස්වල සිද්ධිය හා සමානමයි. ඒ ආසන්නයේමයි. මේ ආයතනයෙත් රසායනික ද්‍රව්‍ය භාවිතයේ තිබෙන ආයතනයක්. රතුපස්වල හා සමානමයි. ඒ නිසා මේ සම්බන්ධව මැදිහත්වීමක්, පාලක පක්ෂයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු අමාත්‍ය මණ්ඩලයෙන් ඉල්ලීමක් කරනවා, කැලණිය, බියගම, මහර ඉන්න එකම විපක්ෂයේ මන්ත්‍රීවරයා වශයෙන්. මටත් ඡන්දය දුන්න අය. අපි මහජනයාගෙන් පත් වුණු උදවිය වශයෙන් අපට කථා කරන්න තිබෙන්නේ මෙතැන. ඒ නිසා මේ සම්බන්ධව ඇස් අරින්න කියන ඉල්ලීම කරනවා. ගිය පාරත් මම කථා කළා. මාධ්‍යයෙන් කිසිම දෙයක් පළ වුණේ නැහැ. ඇන්සල් ලංකා ආයතනයේ වර්ජනය සම්බන්ධයෙන් ගියේ නැහැ. මේ සම්බන්ධයෙන් පාලක පක්ෂයේ ඇස් අරින්න මාධ්‍යයෙනුත් මම ඉල්ලීමක් කරනවා. මෙය පත්තරේ දාන්න. මේ වර්ජනය සම්බන්ධව කටයුතු කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ගරු සභාපතිතුමනි, පසුගිය දවසක අපේ රටේ අයවැය ලේඛනය අපේ රටේ අතිගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළා. මේ රටේ ජනතාව විශාල බලාපොරොත්තු තියාගෙන හිටියා, ඒ අයවැය ලේඛනය තුළින් යම්කිසි සහනයක් ජනතාවට ලැබෙයි කියලා. නමුත් අපි දැක්කා, බොහොම සුන්දරව ඉදිරිපත් කරපු අයවැයට පස්සේ අද රටේ ඇති වෙලා තිබෙන තත්ත්වය. විශේෂයෙන්ම අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල වක්‍ර ආකාරයට අද වන කොට ඉහළ ගිහිල්ලා තිබෙනවා. මේ සභාවේ ඉන්නවා, අපේ ගෘහණියෝ හැටියට කටයුතු කරන කාන්තා මන්ත්‍රීවරියන් තිදෙනෙක්. අශෝකා ලංකාතිලක මැතිනිය, ඒ වාගේම සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය සහ චන්ද්‍රිකා සකලසූරිය මැතිනිය. මම හිතන්නේ, ඒ අයටත් මේ ගැන දැනෙනවා ඇති.

විශේෂයෙන්ම අපට තව නොබෝ දිනකින් මේ පළාත් සභාව විසිරුවලා නැවත මැතිවරණයකට යන්න තිබෙනවා. ඒ යන්න තිබෙන කොට මේ අපි ඔක්කොම පක්ෂ විපක්ෂ අය කිසි භේදයක් නැතිව ජන හිතකාමී, ජන හිත හඳුනන, ජනතාවගේ දුක දන්න කියලා මේ විධියට තමයි පොස්ටර්වල ගහන්නේ. ඔය තියෙන ප්‍රකාශන ලියලා තමයි ගෙවල්වලට leaflet බෙදලා අපි ජනතාවගේ ආකර්ශනය දිනා ගන්න යන්න හදන්නේ. නමුත් ඇත්ත වශයෙන්ම ජන හද හඳුනනවා නම්, ජනතාවගේ දුක දන්නවා නම් මේ වෙලාව වන කොට අද මේ හිතපු නැති විධියට ඉහළ ගිහිල්ලා තිබෙන අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල කොත්තමල්ලි ඇටේ ඉදලා, අබ ඇටේ ඉදලා, මිරිස් කරලේ ඉදලා, සුදුරු ටික, අබ ටික කවුරු කිව්වත් නොකිව්වත් අපට පිළිගන්න සිද්ධ වෙනවා ඉතාමත් අසාධාරණ විධියට මේ සියලු දේවල්වල මිල ඉහළ ගිහිල්ලා තිබෙනවා කියලා. එහෙම කඩවලට ගිහිල්ලා මිල අහපුවාම අපට කියන්නේ, මේ අයවැය ලේඛනයේදී ඉදිරිපත් කරපු, වක්‍ර ආකාරයෙන් ඉදිරිපත් කරපු බදු නිසා තමයි අද මේ ආනයනික සහ දේශීය වශයෙන් තිබෙන කුළුබඩුවල සහ අනෙකුත් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල ඉහළ යන්න සිද්ධ වුණේ කියලා. ඒ නිසා අපි මේ සභාව මාර්ගයෙන්

අතිගරු ජනාධිපතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ. එතුමා රු. 1200/- ක් රජයේ සේවකයන්ගේ ජීවන වියදමට එකතු කළා. නමුත් මේ රටේ සමස්ත වැඩ කරන ජනතාව ඉන්නේ රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නොවෙයි. එදිනෙදා වේල හම්බ කර ගන්න මේ රටේ දහසකුත් ජනතාවක් ඉන්නවා. ඒ අයගේ ආදායම් තත්ත්වය කිසිම ආකාරයකින් වැඩි වීමක් සිද්ධ වෙන්නේ නැහැ. නමුත් එහෙම වැඩි නොවුණාය කියලා ඔවුන්ට නොකා නොබී ඉන්න බැහැ. කොයි විධියට තමන්ගේ වේතනය ලැබුණත් තමන්ට එදිනෙදා ජීවත් වෙන්න, තමන්ගේ ජීවන රටාව පවත්වාගෙන යන්න ඒ අවශ්‍ය කරන ආහාර ද්‍රව්‍ය සහ අනෙකුත් භාණ්ඩ අනිවාර්යයෙන්ම මිලදී ගන්න සිද්ධ වෙනවා. ඒ නිසා රජයේ සේවකයන්ට රු. 1200 ක් පඩි වැඩි කරලා, තව 2800 ක් විතර වක්‍ර ආකාරයෙන් බදු අය කර ගන්න ගමන්ම ඒක සත පහක්වත් හම්බ වෙන්නේ නැති මේ රටේ ඉන්න සමස්ත ජනතාවට ඒ සහනයවත් ලැබෙන්නේ නැහැ. ඒ නිසා අපි මේ වෙලාවේ කියන්නට ඕනෑ. මේ වක්‍ර ආකාරයට වැඩි කරපු බදු අද සමහර වෙලාවට වෙළඳ පොලේ මීටත් වඩා ඉතාමත්ම නරක විධියට ක්‍රියා කරනවා. විශේෂයෙන්ම මේ කුළු බඩුවල තිබෙන මිල, ආනයනික බඩුවල තිබෙන මිල - දැන් උදාහරණයක් හැටියට පසුගිය දවස්වල අපි දැක්කා, බී ළූණු කිලෝ එක රුපියල් දෙසිය පනහට ගියා. නමුත් අද වන කොට ප්‍රකාශ කරනවා. මම හිතන්නේ සමූපකාර ඇමතිතුමාත් ඉන්න නිසා හොඳයි. සමූපකාරයට එන්න. රුපියල් එකසිය විස්සට කිලෝ එක දෙන්නම් කියලා. එහෙම කිව්වාට අද වන කොට -

**ගරු උපාලි කොඩිකාර** (ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Upali Kodikara (Minister of Transport, Sports and Youth Affairs, Cultural and Arts Affairs, Cooperative Development, Food Supplies and Distribution and Rural Development)

මම දැන් කන්ටේනර් තුනක් ගෙන්වලා තිබෙන්නේ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

කන්ටේනර් තුන සමූපකාරවලට දෙයි. ඒක වෙනම දෙයක්. නමුත් හැබෑ වෙළඳ පොලේ අද වන කොට මේවාවල මිල ඔය කියන මිල ගණන් නොවෙයි.

ඒ නිසා මේ පොළොවට බැහැලා බලන්න. මැතිවරණයට විතරක් බොරුවට කොලේ ගහගෙන ගෙවල්වලට යන්න එපා. පොළොවට බැහැලා කඩේට ගිහිල්ලා බලන්න. අපි නම් තවමත් කඩේ යන මන්ත්‍රීවරු. ඒ නිසා ඒ ගැන කිසි ප්‍රශ්නයක් නැහැ. ඕනෑ කෙනෙකුට කියන්න පුළුවන් ඔය ආර්ථික මධ්‍යස්ථානයට, මහබාගෙට, වැලිසරට, කදානට අපේ නෝනාත් එක්ක ගිහිල්ලා ගෙදරට ඕනෑ කරන බඩු ගේන්නේ මම තමයි. ඒ නිසයි මම මේ ගැන දන්නේ. ඒ නිසා ඔය කියන සුන්දර කතාව එතැන නැහැ. ඇත්ත වශයෙන්ම සාමාන්‍ය වෙළඳ පොලේ අද වන කොට බී ළූණු රුපියල් දෙසීයට ඉහළට නැගලා. ඒ මේ වක්‍රව අය කරපු බදු නිසා. කෙළින්ම ගැහුවේ නැහැ. එහෙම නම් ජනාධිපතිතුමා අයවැය ලේඛනය කියද්දී ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු බොහොම ප්‍රීතියෙන් පිනා ගිහිල්ලා මේසයට තට්ටු කරන්න එපැයි. විපක්ෂයත් හිටපු නැති වෙලේ. කවුරුත්ම නැහැ. ඔක්කොම තුෂ්නිම්භූත වෙලා බලාගෙන හිටියා. මේ පැත්තෙන් දීලා අනික් පැත්තෙන් කෙළලා ඇරියා.

ඒ නිසා රටේ සාමාන්‍ය ජනතාවට අද වන කොට විඳින්න වෙලා තිබෙන මේ පීඩාවට බස්නාහිර පළාත් සභාවේ අපේ එක්සත් ජාතික පක්ෂ කණ්ඩායමේ විරෝධය පළ කරන අතරම, ඒ බඩු මිල අඩු කරන්න. මොකද ඉදිරියට එන්නේ නත්තල් කාලය. විශේෂයෙන්ම වත්තල, ජා - ඇළ, මීගමුව, කටාන වාගේ මැතිවරණ කොට්ඨාශවල ඉන්න ජනතාව උත්සවශ්‍රීයෙන් සමරන ඒ ආගමික උත්සවය එන්නේ. මේ සැරේ මහත් පීඩාවට පත් වෙලා තිබෙන්නේ. ඉතාමත්ම අමාරුවෙන් ජීවත් වෙන්නේ. කොහොමද මේ නත්තල සමරන්නේ? (බාධා කිරීමක්) මෙරිල්ට පුළුවන්. කිසි ප්‍රශ්නයක් නැහැ. මෙරිල්ගේ තිබෙන ආදායම අනුව මෙරිල්ට පුළුවන්, මුළු පේරලන්දටම කන්න දෙන්න. රාගමටම කන්න දෙන්න පුළුවන්. නමුත් ඒ හා සමානවම ඉන්න අනික් මිනිස්සුන්ට, ඒ ගේ අවට ඉන්න මිනිස්සුන්ට නත්තල් කන්න බැහැ. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ මාර්ගයෙන් ඉල්ලා සිටිනවා. අඩුම තරමින් මේ නත්තල ජනේරුව වෙනකල්වත් මේ රටේ සාමාන්‍ය ජනතාවට භුක්ති විඳින්න පුළුවන් ආහාර ටික සපයා ගන්න පුළුවන් වන විධියට මේ බඩු මිල අඩු කරන්න කියන ඉල්ලීම තමුන්නාන්සේගේ මාර්ගයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

ගරු සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට අද මේ සභාවේ මට මේ ප්‍රකාශය කිරීම ගැන ලජ්ජා වෙන්නත් ඕනෑ. ඒ මොකද, චමලි ගුණවර්ධන කියන්නේ, මේ රටේ කවුරුත් දන්නවා. එක්සත් ජාතික පක්ෂයේ අයත්, ජනතා විමුක්ති පෙරමුණේ අයත් මේ සියලු දෙනාම දන්නවා, මේ රටේ හිටපු හොඳ ඇමතිවරයෙක් බව. දැන පිරිසිදු ඇමතිවරයෙක් බව. ඒ ඇමතිවරයාගේ පිළිරුවක් කළුතර නගරයේ නැහැ. කළුතර අධිවේගී මාර්ගය චමලි ගුණවර්ධන මැතිතුමා ඉදි කරපු මාර්ගයක්. කළුතර මහ ලේකම් කාර්යාලය, කළුතර තැපැල් කාර්යාලය. මේ වාගේ විශාල සේවාවක් කරපු ඇමතිවරයෙක්. ඒ සමාජ සේවාවන් කරපු අය උදෙසා අද රටේ හුගාක් පිළිරු ඉදි වෙලා තිබෙනවා. මම මේ පිළිබඳව අපේ ගරු මහ ඇමතිතුමා දැනුවත් කරලා, මහ ඇමතිතුමා මාර්ගයෙන් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයට දන්වලා, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයෙන් නිර්දේශය දීලා ඒ ලිපිත් එක්ක මම මේ යෝජනාව කළුතර දිස්ත්‍රික් කමිටුවට 2013.04.01 වැනිදා ඉදිරිපත් කළා. ඒ දිස්ත්‍රික් කමිටුවේ ඉන්න සභාපතිතුමා වන කුමාර වෙල්ගම ඇමතිතුමා දුන්න නියෝගයක් අනුව - ප්‍රාදේශීය ලේකම්තුමාට එදා නියෝග කළා වහාම මේ ස්ථානය ලබා දීලා මේකට අවශ්‍ය පහසුකම් ලබා දෙන්නය කියලා. දැන් මේ එකොළොස්වන මාසය. අද වන තුරු කළුතර ප්‍රාදේශීය ලේකම්තුමා මේ පිළිබඳව නිරුවත්භාවය රකිනවා. මම ගිහිල්ලා කථා කළාම කිව්වා, දිස්ත්‍රික් කමිටුවට බලයක් නැහැයි කියලා ඔය නියෝග දෙන්න. මම මේ අවස්ථාවේදී ඔබතුමාගේ මාර්ගයෙන් මහ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, ප්‍රාදේශීය ලේකම්වරයා හිතාමතාම මේක මග හැරීම පිළිබඳව අවශ්‍ය පියවර ගන්නය, සොයා බලන්නය කියලා.

ඒ වාගේම ඒ ප්‍රාදේශීය ලේකම්වරයා ගැනත් අපට මෙතැනදී වචනයක් කථා කරන්න වෙනවා. 1989 දී ජනතා විමුක්ති පෙරමුණ ක්‍රියාත්මක වන කොට ඒ හරහා ඒ සංවිධානගත වැඩ පිළිවෙළේ හිටපු කෙනෙක් හැටියට අපි දන්නවා එතුමා වැඩ කරපු ආකාරය. ඒ නිසා 1989 දී ඉන්ද්‍රපාල අබේවීර මහත්මයාත්, මගේ සහෝදරයා විජේලාල් මෙන්ඩිස් මහත්මයාත් මරා දැමුවේ ජනතා විමුක්ති පෙරමුණ. ඇත්ත වශයෙන්ම අපේ නලින්ද ගරු මන්ත්‍රීතුමා ඒකට සම්බන්ධ නැහැ. මන්ත්‍රීතුමාට දැන් වයස තිස් පහක්වත් නැහැ. එතුමන්ලා මැරිලා අවුරුදු 25 ක් වෙනවා. මෙතුමාට තවම අවුරුදු තිස් පහක්වත් නැහැ. එතුමන්ලා අහිංසකයි. නමුත් ජනතා විමුක්ති පෙරමුණ කරපු ක්‍රියා කලාපය තවමත් හිතේ තිබෙනවා. ගතේ තිබෙනවා. ඒක තමයි මේ ප්‍රාදේශීය ලේකම්වරයා හිතාමතාම මේක මග හරින්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගරු මන්ත්‍රීතුමා, එතකොට නායකයෝ විමල් වීරවංශලා.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

දැන් මේ පැත්තට ඇවිල්ලා ඉන්නවා නේ එතුමන්ලාත්. එතුමන්ලා සත්‍ය තේරුම් අරන් ඉන්නවා. ඒ නිසා නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමාට අපට ඇඟිල්ල දික් කරන්න බැහැ. එතුමා හොඳ අදහස් තිබෙන මන්ත්‍රීවරයෙක්. එතුමා හෙට අනිද්දා වන කොට මේ පැත්තට එන්නත් පුළුවන්. ජනවාරි මාසයේ අතිගරු ජනාධිපතිතුමා අතින් මේ පිළිරුව විවෘත කරන්න පුළුවන් වන ආකාරයට එදා කුමාර වෙල්ගම ඇමතිතුමා දුන්න නියෝගය ක්‍රියාත්මක කරන්න. අනවසරයෙන් තිබෙන කඩ දෙක ඉවත් කරන්න ප්‍රාදේශීය ලේකම්වරයා මේ වන තෙක් ක්‍රියාත්මක වෙලා නැහැ. මම ගිහිල්ලා කථා කළාම කිව්වේ, දිස්ත්‍රික් කමිටුවට ඇති බලයක් නැහැයි කියලා. ඒ නිසා මේ පිළිබඳව ගරු මහ ඇමතිතුමා ඉඩම් ඇමතිවරයා හැටියට පළාත් සභාවට අයිති විෂයයක් හැටියට - පළාත් සභාවට අයිති ඉඩමක තමයි මේ පිළිරුව ඉදි කරන්න ලැහැස්ති කරලා තිබෙන්නේ. ඒ සඳහා ගරු මහ ඇමතිතුමා මේ පිළිබඳව සොයා බලා කටයුතු කරනු ඇතැයි කියලා විශ්වාස කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු අර්ෂාද් නිසාම්ඩීන්**
Hon. Arshad Nisaamdeen

ගරු සභාපතිතුමනි, බොහොම ස්තුතියි. 2010 මැයි මස 08 වැනිදා නාගරික සංවර්ධන අධිකාරිය මගින් කොම්පඤ්ඤ වීදියේ ගෙවල් 20 ක්, ඩිවුස් වීදියේ කඩා ඉවත් කළා. ඒ ගෙවල් 20 ට සින්නක්කර ඔප්පු තිබෙනවා. එම ගෙවල් 20 කඩා ඉවත් කිරීමෙන් පසුව ඒ මිනිස්සු සති දෙකක් විතර පාරේ සිටියා. ඊට පස්සේ නාගරික සංවර්ධන

අධිකාරිය සමඟ සාකච්ඡා කළා. ඒ සාකච්ඡාවේදී නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් ගැන විශ්වාසයක් නොමැති නිසා මේ ගෙවල්වල අයිතිකරුවන් ශ්‍රේෂ්ඨාධිකරණයට නඩුවක් ගොනු කළා. ඒ නඩුවේදී නාගරික සංවර්ධන අධිකාරිය පොරොන්දුවක් දුන්නා, බෙස්ලයින් පාරේ මහල් නිවාස සංකීර්ණයේ නිවාස හදලා දෙනවා කියලා. ඉන් පස්සේ ඒ මිනිසුන්ට කුළී නිවසකට යෑම සඳහා මාසිකව කුළී ගෙවීමක් කළා. අවුරුදු තුනක් විතර තිස්සේ මාසික කුළිය ගෙවීගෙන ආවා. ඒ වාගේම ගරු සභාපතිතුමනි, දැනට තිබෙන වාතාවරණය පිළිබඳව නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරින් සමඟ මම මීට පෙර කථා කළා. නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂක ප්‍රසාද් කියලා නිලධාරී මහත්මයෙක් සමඟ ඒ සම්බන්ධයෙන් මම කථා කළාම කිව්වා, දැන් ඒ ගෙවල් ඔක්කොම දීලා ඉවරයි. ඊට පස්සේ මම ඇහුවා, මම ආරක්ෂක ලේකම්තුමාත් එක්ක කථා කරන්නද කියලා. එතුමා ඒ සම්බන්ධව දන්නේ නැහැ. ගෙවල් ඔක්කොම දීලා ඉවරයි කියලා කිව්වා. ඊට පසුව ඒ නිවැසියන් සමඟ නැවත ශ්‍රේෂ්ඨාධිකරණයේ මෝසමක් මගින් නඩුවක් දැම්මා. නඩුව ගත්තායින් පස්සේ ගිය නඩුවාර දෙකේදීම - 18 වැනිදා නඩුව තිබුණා. ඒ නඩුවේදී නාගරික සංවර්ධන අධිකාරියට Contempt of court කියලා ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුතුමිය පැවසුවා. නමුත් නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන්ගේ අත්තනෝමතික ක්‍රියා නිසා ඒ මිනිසුන්ට දුන් පොරොන්දුව, ශ්‍රේෂ්ඨාධිකරණය දුන් පොරොන්දුව අද නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් විසින් කඩ කරලා මේ අයව රවට්ටලා තිබෙනවා කියලා මම කියන්නේ.

ඒ කියන්නේ, ඔවුන් ඊයේ ශ්‍රේෂ්ඨාධිකරණයට ඇවිල්ලා කිව්වා, ඒ ගෙවල් ඔක්කෝම දීලා ඉවරයි කියලා. මේ අයට වෙනත් ප්‍රදේශයකින් තමයි දෙන්න පුළුවන් කියලා. මම ඉල්ලා සිටින්නේ, මේ නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් අත්තනෝමතිකව ක්‍රියා කරනවා. ඉහළින් එන නියෝගය පවා ඔවුන් ගණන් ගන්නේ නැතිව නිවාස කඩපු අයට නිවාස ලබා දෙන්නේ නැතිව, සමහර දේශපාලනඥයන්ගේ ආධාරකරුවන්ට නිවාස ලබා දෙන්න, නාගරික සංවර්ධන අධිකාරිය ක්‍රියා කර තිබෙනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. අතිගරු ජනාධිපතිතුමාට මේ බව දන්වලා මේ මිනිසුන්ට සහනයක් ලබා දෙන්නය කියලා. මේ මිනිස්සුන්ව වෙනත් ප්‍රදේශයකට දාන්නේ නැතිව ඒ ප්‍රදේශයෙන්ම නිවාස ලබා දීලා සහනයක් ලබා දෙන්නය කියලා ඉල්ලමින් මම නිහඬ වෙනවා.

# පළාත් සභාවේ රැස්වීම
PROVINCIAL COUNCIL MEETING

**ගරු ජගත් අංගගේ** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා)
Hon. Jagath Angage (Minister of Health, Indigenous Medicine, Social Welfare and Women's Affairs , Probation and Child Care Services and Council Affairs)

ගරු සභාපතිතුමනි, *"2013.11.05 වන දින පැවැති පළාත් සභා රැස්වීම් එළැඹුණු සභා සම්මුතියට අනුව 2013 දෙසැම්බර් මස 03, 04, 05 හා 06 යන දිනයන් 2014 වර්ෂයේ මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදය හා ඒ සම්බන්ධ වැඩ කටයුතු සඳහා වෙන් කළ දිනයන් වන අතර එම දිනවල වැඩ කටයුතු සඳහා කාර්යපටිපාටි රීති අංක 50(5) හි සඳහන් කාලපරාසයන්ගෙන් කිනම් හෝ බාධාවක් සිදු නොවිය යුතු යැයි මම යෝජනා කරනවා."*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# පළාත් සභාවේ කටයුතු
PROVINCIAL COUNCIL AFFAIRS

**ගරු ජගත් අංගගේ** -අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ගරු සභාපතිතුමනි, *"2013.11.05 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභාවේදී ලද එකඟතාවයන්ට අනුකූලව අද දින න්‍යාය පත්‍රයේ විෂයය අංක VI ලෙස සඳහන් පොදු කටයුතු විෂයයන් වැඩ කටයුතුවලට පිවිසීමට පෙරාතුව විෂයය අංක VII ලෙසින් සඳහන් පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු නැමැති විෂයෙහි වැඩ කටයුතු නිමා කළ යුතුය යන යෝජනාව මම මෙම සභාවට ඉදිරිපත් කරනවා."*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :
# PRIVATE MEMBERS MOTION:

## කම්කරුවන් බඳවා ගැනීමේදී අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිටීම ප්‍රමාණවත් කිරීම.
## SITTING FOR G.C.E. (O/L) TO BE SUFFICIENT FOR RECRUITMENT TO LABOURER POSTS

***2013.10.22** වන දින නෙලුක් මල්ලව ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලදුව ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලද පහත සඳහන් යෝජනාව යළිත් සභාභිමුඛ කරන ලදී.*

*The following motion presented by Hon. Member Neluk Mallawa on 22.10.2013 and affirmed by Hon. Member Gunasiri Jayanath was tabled again.*

*"රාජ්‍ය සේවයට කාර්ය මණ්ඩල බඳවා ගැනීමේදී එම කාර්ය මණ්ඩලය තුළ සිටින පහළම තනතුර දරන්නා වන්නේ කම්කරුවායි. එම කම්කරුවා මීට පෙර තනතුරු සඳහා ඇතුළත්වීමේදී අවම අධ්‍යාපන මට්ටමක් පැවතියද, එය රාජ්‍ය සේවයට ඇතුළත්වීමට ප්‍රමාණවත් විය. නමුත් මේ වනවිට රජය තීරණය කර ඇති පරිදි කම්කරු තනතුරු ලබා ගැනීමේදී අ.පො.ස. (සා.පෙළ) පරීක්ෂණයෙන් විෂයයන් 06 සමත්වී (ගණිතය ඇතුළුව) සම්මාන සාමාර්ථ 02 ක් තිබිය යුතුය. මෙය රටේ සාමාන්‍ය පෙළ අපේක්ෂකයින්ගෙන් 50% කට පමණ සෘජු ලෙසම බලපාන තීන්දුවකි. මන්ද යත්, සාමාන්‍ය පෙළ පරීක්ෂණයේදී ගණිතය විෂයය අසමත්වන කණ්ඩායම 50% කට ආසන්නය. එයින් ගම්‍ය වන එක් දෙයක් වන්නේ, රටේ ශිෂ්‍ය ගහණයෙන් 50% කට රාජ්‍ය සේවයේ අවම රැකියාව හෝ ලබා ගැනීමට අවස්ථාවක් නොමැතිවීමයි. මෙය තුළ නිර්මාණය වන සමාජ අර්බුදය අනාගතයේ මහත් ව්‍යසනයක් ඇති කරනු ඇත. එම නිසා බස්නාහිර පළාත් රාජ්‍ය සේවාව සඳහා කම්කරු ශ්‍රේණියට බඳවා ගැනීමේදී අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සඳහා පෙනී සිටීම පමණක් සුදුසුකමක් සේ සලකා කටයුතු කරන ලෙස මෙම ගරු සභාව විසින් යෝජනා කර සිටින්නේය."*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාවේ එකඟතාවය අනුව අද දින න්‍යාය පත්‍රයේ අනුපිළිවෙළ සුළු වෙනස්වීමක් සිදු වෙනවා. ඒ අනුව පසුගිය සභා රැස්වීමේදී නිවේදනය කළ පරිදි ගණ පූරණය නොමැතිවීම හේතුකොටගෙන අද දිනට කල් දැමුණු නෙලුක් දර්ශන මල්ලව ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් යෝජනාවේ වැඩ කටයුතු අවසන් කිරීමටයි තිබෙන්නේ. ඒ අනුව එම යෝජනාව පිළිබඳව සභාවේ කැමැත්ත විමසීමේ අවස්ථාව දැන් එළැඹෙනවා. ඊට ප්‍රථමව කරුණාකර සීනුව නාද කරන්න.

නෙලුක් මල්ලව ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය ප්‍රකාශ කිරීමේ අවස්ථාව. ඒ අනුව එම යෝජනාවට සභාවේ එකඟතාවය විමසනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# ව්‍යාපාර නාම ප්‍රඥප්තිය : රීති
# BUSINESS NAMES STATUTE :RULES

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, *"2011 අංක 05 දරණ බස්නාහිර පළාතේ, වෙළඳ සංස්ථා හා සංස්ථාගත කරනු නොලැබූ වෙළඳ ආයතනයන්හි ව්‍යාපාර නාම ප්‍රඥප්තියේ 31 වගන්තිය සමග කියැවිය යුතු 32(1) වගන්තිය යටතේ බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන හා විදුලිබල හා බලශක්ති සහ වෙළඳ විෂයභාර අමාත්‍යවරයා වශයෙන් සාදනු ලැබ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1829/32 හා 2013.09.25 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද රීතීන්,*

*එනම්,*

*ව්‍යාපාර නාමයන් ලියාපදිංචි කිරීමේ සහතිකයක් හෝ ප්‍රකාශයක් නිකුත් කිරීම සඳහා අය කළ යුතු ගාස්තු පැනවීම.*

*ව්‍යාපාර නාම සහතිකයක් නිකුත් කිරීම හෝ ප්‍රකාශයක් නිකුත් කිරීම සඳහා භාවිතා කළ යුතු ආකෘති පත්‍ර හඳුන්වා දීම හා*

*ව්‍යාපාර නාමයක් ලියාපදිංචි කිරීම, වෙනස්කමක් සිදු කිරීම, හෝ අවලංගු කිරීම යන අවස්ථාවලදී ලබා ගත යුතු ලියවිලි නියම කිරීම.*

*යන කරුණු සම්බන්ධයෙන් වූ රීතින් ඉහත කී ප්‍රඥප්තියේම 32(3) වගන්තියේ විධි විධාන ප්‍රකාරව අනුමැතිය සඳහා මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව වෙත ඉදිරිපත් කරමි."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද ගැසට් නිවේදනය මම හිතන්නේ මේ වන විට ඔබතුමන්ලාගේ මේසය මත එම -

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපාර නාම ලේඛන ප්‍රඥප්තියට අදාළව ඉදිරිපත් කළ රීතීන් සම්බන්ධයෙන් අපට දැන ගැනීමට කරුණු කිහිපයක් තිබෙනවා. එතුමා ඉදිරිපත් කරලා තිබෙන රීතිවල පළමුවැනි වගන්තියෙන් කියැවෙන්නේ,

*ව්‍යාපාර නාමයන් ලියාපදිංචි කිරීමේ සහතිකයක් හෝ ප්‍රකාශයක් නිකුත් කිරීම සඳහා අය කළ යුතු ගාස්තු පැනවීම.දෙක,ව්‍යාපාර නාම සහතිකයක් නිකුත් කිරීම හෝ ප්‍රකාශයක් නිකුත් කිරීම සඳහා භාවිතා කළ යුතු ආකෘති පත්‍ර හඳුන්වා දීම හා තුන,ව්‍යාපාර නාමයක් ලියාපදිංචි කිරීම, වෙනස්කමක් සිදු කිරීම, හෝ අවලංගු කිරීම යන අවස්ථාවලදී ලබා ගත යුතු ලියවිලි නියම කිරීම.*

ගරු සභාපතිතුමනි, අපේ පළාත් සභාවට තිබෙන බලතල අනුව 2011 අංක 05 දරන බස්නාහිර පළාත් සභාවේ වෙළඳ, සංස්ථා, සංස්ථාපිත කරගනු ලැබීම පිළිබඳව ආයතන ව්‍යාපාර නාම ලේඛන ප්‍රඥප්තියට අදාළ සකස් කරන ලද රීති ඇතුළත් මේ ගැසට් පත්‍රය අපට න්‍යාය පත්‍රයත් එක්ක එවලා තිබෙනවා. බස්නාහිර පළාත තුළ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම මම හිතන්නේ, ලක්ෂ ගණනින් - මේ පළාතේ කළුතර, ගම්පහ සහ කොළඹ යන දිස්ත්‍රික්ක තුනේම ව්‍යාපාරයක් ආරම්භ කරනකොට නාමයක් සහතික කර ගැනීම සඳහා මේ බස්නාහිර පළාත් සභාව ආරම්භ කරන කොටම අය කරපු ගාස්තු දිහා අරගෙන බැලුවාම මුලින්ම තිබුණේ රුපියල් 5/- යි. මුල්ම පළාත් සභාවේ. ඊට පස්සේ රුපියල් 500/- යි. අද මේ ගැසට් පත්‍රයෙන් පෙන්වනවා වැඩි මුදලක්. මේ බස්නාහිර පළාතේ සපත්තු මහන කඩ, රබර් කිරි එකතු කිරීමේ ව්‍යාපාර, තේ දළු එකතු කිරීම, මාළු වෙළඳාම් කිරීම, පොල් වෙළඳාම් කිරීම වාගේ සුළු සුළු ව්‍යාපාර මේ පළාත ඇතුළේ ලියාපදිංචි කිරීම රුපියල් 500/- ට තිබුණේ. නමුත් මේ ගැසට් පත්‍රයෙන් අද පෙන්වනවා, මිල වැඩි කිරීමක්. ගැසට් පත්‍රයේ දෙක පිටුව.

2011 අංක 05 දරන පළාතේ වෙළඳ, සංස්ථා ස්ථාපිත කිරීම පිළිබඳව ආයතනයන්හි ව්‍යාපාර නාම ප්‍රඥප්තියේ 32(1) (අ) යටතේ, පහත සඳහන් එක් එක් කාර්යයන් උදෙසා සහතිකයක් හෝ ප්‍රකාශයක් නිකුත් කිරීම වෙනුවෙන් ඊට අනුරූපීව දක්වා ඇති ප්‍රමාණයන් යටතේ අය කළ ගාස්තු මෙයයි කියලා පෙන්වනවා.

ගරු සභාපතිතුමනි, මධ්‍යම ආණ්ඩුව මේ රටේ ජනතාව උපයන මුදල්වලින් 80% ක් ලෙස බදු අය කරගෙන තිබෙනවා. ජනතාවගේ ආදායමට අයිතියක් නැහැ. 100 ක් ගත්තා නම් 20 යි අයිතිය තිබෙන්නේ. 80 ක් රජය බදු ලෙස අය කර ගන්නවා. අද පළාත් සභාවට මේ පුංචි මිනිස්සුන්ගේ ව්‍යාපාර නාම ලියාපදිංචිය සඳහා මිල වැඩි කරලා ඉදිරිපත් වෙනවා. පළමුවැනි එක, තනි පුද්ගල ව්‍යාපාර නාමයක් ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කිරීම සඳහා රුපියල් 2,500 යි. අද මේ ගැසට් පත්‍රයෙන් පළාත් සභාවට ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඉදිරිපත් කරනවා. එහි දෙක. වෙළඳ සමාගමක් ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කිරීම සඳහා රුපියල් 3000/- යි. එහි තුන -

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

ඒක වැඩි නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සුමිත් ලාල් මෙන්ඩිස් ගරු මන්ත්‍රීතුමා. නිරන්තරයෙන්ම ඔබතුමා ඔය වැඩේ කරනවා. මයික්‍රෆෝනය භාවිතා කරලා බාධා කිරීම් කරනවා. කරුණාකර ඒ වැඩේ කරන්න එපා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, වෙනස්කම් ප්‍රකාශයක සහතිකයක් නිකුත් කිරීම සඳහා, තනි /හවුල් ව්‍යාපාරයකට රුපියල් 2000/- යි. නිකුත් කරන ලද ලේඛනයක සහතික පිටපතක් ලබා ගැනීම සඳහා, ලිපි ගොනුවක් පරීක්ෂා කිරීම සඳහා රුපියල් 1500/- යි. ගරු සභාපතිතුමනි, මම ඔබතුමාගේ මාර්ගයෙන් ගරු -

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ලිපි ගොනුවක් පරීක්ෂා කිරීම සඳහා රුපියල් 300/- යි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පරීක්ෂා කිරීම සඳහා රුපියල් 300/- යි.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

සමාවෙන්න. වැරදුණා. නිකුත් කරන ලද ලේඛනයක සහතික පිටපතක් ලබා ගැනීම සඳහා රුපියල් 1500/- යි. ලිපි ගොනුවක් පරීක්ෂා කිරීම සඳහා රුපියල් 300/- යි. එහෙම නම් ගරු සභාපතිතුමනි, මේ ව්‍යාපාරය පිළිබඳව - මේ පළාතේ ඉන්නේ ඉතාමත් අසරණ මිනිස්සු. ව්‍යාපාර ක්‍රියාත්මක කිරීමේ උවමනාවත් එක්ක විශාල ප්‍රමාණයෙන් ව්‍යාපාර නාම ලියාපදිංචි ගාස්තුව වැඩි වෙනවා. මම ඔබතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. මධ්‍යම රජයට මේක ප්‍රකාශ කරන්න. මෙය ප්‍රකාශ කරලා මේ අහිංසක කුඩා සුළු ව්‍යාපාරිකයන්ට සහනයක් ලබා දෙන්න. දැන් දිවිනැඟුම යටතේ අපි දැක්කා, මහ ආණ්ඩුවේ අයැවයෙන් විශාල එළවළු කොටු නිෂ්පාදනය කරන අයට, කුකුල් පැටව් නිෂ්පාදනය කරන අයට, සත්ත්ව ගොවිපලවල් ආරම්භ කරන අයට මේ සම්බන්ධයෙන් නමක් දාගන්න ඕනෑ. නමක් දාගන්න ගියාම මේ වාගේ අසරණ මිනිස්සුන්ටත් රුපියල් 2500/- ක් ගෙවන්න සිදුවීම ඉතාමත් අසාධාරණයි. එය අසරණ මිනිස්සුන්ට කරන ලොකු අසාධරණයක් හැටියට ඔබතුමාගේ මාර්ගයෙන් ගරු අමාත්‍යතුමාටත්, අමාත්‍ය මණ්ඩලයටත්, මධ්‍යම රජයටත් අපි පෙන්වා දෙන්න කැමැතියි කියන එක මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. එහෙමනම් මේ වේලාවේ බදු පිට බදු පටවන රජය, පළාත් සභාවේ අපේ තිබෙන විෂයයන්වලටත් තවත් බදු එකතු කරගෙන එනකොට ජනතාව රුපියල් 1000/- ක් හම්බ කළා නම්, ඒ රුපියල් 1000/- න් රුපියල් 150/- ක් විතර තමයි ඒ අයට අයිතියක් ලැබෙන්නේ. කන බොන, අඳින පළඳින සියලුම දේවල්වලටත්, විදුලි බිලට, ප්‍රවාහනයට අපෙන් රජය අය කරගන්න බදු ප්‍රමාණය බැලුවාම විශාල ප්‍රමාණයක්. ඒ සියල්ල සඳහා මුදල් ගියාම, මෙයත් පැටෙව්වොත් මිනිහා ණයකාරයෙක් වෙනවා කියන එක මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. ඔබතුමාගේ මාර්ගයෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. අපි මෙම බදු සංශෝධනය වෙනස් කර මීට වැඩිය සහනයක් මේ පළාතේ ජනතාවට බලපාන ආකාරයෙන් සුළු නාම ව්‍යාපාරිකයන්ට ලබා දෙන්නය කියන එක ඉල්ලමින් මගේ පැහැදිලි කිරීම මම මෙයින් අවසන් කරනවා. ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන ඇමැතිතුමා, ඔබතුමා ඒ සම්බන්ධයෙන් යමක් පැහැදිලි කරනවාද?

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, කාරණාව පැහැදිලි කරගත යුතු නිසා. මෙතුමාගේ ප්‍රකාශයේදී කිව්වා, 80% ක් රජය බදු ලෙස අය කරනවා කියලා. මම හිතන්නේ ඒක tobacco and Distilleries විතරයි. ඒ 80% අනික් ඒවට එන්නේ නැහැ. මම දන්නේ නැහැ. ඒක ඔබතුමා නිවැරදි කරගන්න. අනික ගරු සභාපතිතුමනි, මේ මුදල වාර්ෂිකව ගන්න මුදලක් නොවෙයි. ව්‍යාපාරයක් ලියාපදිංචි කරන්න විතරයි මෙය ගන්නේ. ගරු මන්ත්‍රීතුමා කියනවා වාගේ අසරණ කෙනෙක් කවදාවත්, බුලත්විට විකුණන කෙනෙක් ව්‍යාපාරයක් ලියාපදිංචි කරන්නේ නැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, ප්‍රාදේශීය සභාවේත් ලියාපදිංචි කරන්න ඕනෑ. මම කියන්නේ ව්‍යාපාරයේ නම. මෙහි තිබෙන්නේ නාම ලියාපදිංචි -

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මේක අපි කරන්නේ පළාත් ලියාපදිංචි -

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

නමක් දාන එක. දැන් ප්‍රසන්න රණතුංග මෝටර්ස් කියලා තිබෙනවා නම් ඒ නම ගන්න තමයි මේ ගණන අය කරන්නේ.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

නැහැ. නැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඔව්. ව්‍යාපාර නාම ලේඛන.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේදී රුපියල් 2500/- ක් ගෙවන්න බැරි නම් ව්‍යාපාරයක් ලියාපදිංචි කරන්නේ නැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ලොකු ඒවට -

**ගරු නිමල් ලාන්සා -** අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

එක පාරක් අලියාගේ පිටේ යන්න රීට වඩා ගන්නවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මම දැන් ලියාපදිංචි කළා. මෙහි තවත් එකක් තිබෙනවා. මම ඒක පස්සේ මතක් කරන්නම්. ඔබතුමා කියනවා, 2012.10.01 සිට කියලා. මම ව්‍යාපාරයක් අට වැනි මාසයේ Register කළා. ඒකටත් මේ ගණන ගත්තා. මම මීට පෙර මේ සභාවේ කථා කළා. මම පෙන්නුවා. මෙහි තිබෙනවා, දහවැනි මාසයේ පළමුවැනිදා සිට කියලා. අපි අටවැනි මාසයේ කියලා ගත්තාම මේ ගණනම අය කළා. මම ඒත් ප්‍රශ්න කළා, මොකක්ද මේ කරන්නේ කියලා.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, මේ කාරණය සම්බන්ධයෙන් තවත් ගැටලු ගණනාවක් පැන නඟින අවස්ථා කීපයක් පෙන්වා දෙන්න කැමැතියි. එකක් මේ වන විට පළාත් පාලන ආයතන විසින් - තමන්ගේ පළාත් පාලන ආයතනවල ආදායම උදෙසා ඒ අය ආදායම් පරීක්ෂකවරු මාර්ගයෙන් ආදායම් හඳුනාගෙන යනවා. මේ විධියේ පුංචි බයිසිකල් වැඩ කරන තැනක්. මිරිස් ටිකක් කොටලා පැකට් කරලා වෙළඳ පොළට නිකුත් කරන අය. ඒ නිසා මෙවැනි සුළු ව්‍යාපාර කරන එහෙම අය ව්‍යාපාර නාමය ගන්න ගියාම, ලියාපදිංචි කරගන්න පොඩියි කියලා කිව්වාට ඒ අයට සමහර වේලාවට ග්‍රාමීය බැංකුවෙන්, එහෙමත් නැත්නම් සමෘද්ධි බැංකුවෙන්, එහෙමත් නැත්නම් වෙනත් තැනකින් පුංචි ණයක් ගන්න ගියොත් ඒ ව්‍යාපාරය ලියාපදිංචි කරලාද නැද්ද කියලා අහනවා. ඒ වේලාවට ඒ අය ඒ පුංචි රුපියල් දහ පහළොස්දාහේ ණය වෙන්න පුළුවන්, තමන්ගේ ව්‍යාපාරය දියුණු කරගන්න. රුපියල් පන් හයදාහේ ණය වෙන්නත් පුළුවන්. තමන්ගේ ව්‍යාපාරය දියුණු කරගන්න. ඒ වේලාවට මෙහෙම ගියාම අපි කියන්නේ, එක පැත්තකින් මෙතැනින් ඒ බදු මුදල මිනිස්සුන්ට වදිනවා. අනික් පැත්තෙන් අදාළ පළාත් පාලන ආයතන තුළිනුත් මේ ස්වයං රැකියා වැඩ පිළිවෙළ කරන ඒවාට වදිනවා. රීට පස්සේ මෙහි අනික් කාරණය. නාගරික සංවර්ධන අධිකාරිය පැත්තෙනුත් බදු වදිනවා.

ඒ කියන්නේ ගරු සභාපතිතුමනි, ඔබතුමාට මතක් කරන්නේ. යම් සිල්ලර ව්‍යාපාරයක් හරි මොකක් හරි ව්‍යාපාරයක් ලොකුවට තිබුණා නම් එයා ඒක උත්සව ශාලාවක් විධියට පරිවර්තනය කරගන්න ගියාම මෙපමණ කල්, දැනට අවුරුද්දකට එහා පැත්තේ වනතුරු තිබුණේ වර්ග අඩියකට රුපියල් 4.50 ක් අය කරගන්නයි. දැන් ඒ ව්‍යාපාර නාමය වෙනස් කර ගන්න ගියාම නාගරික

[ ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා ]

සංවර්ධන අධිකාරිය එක වර්ග අඩියකට රුපියල් 45/- ක් ගන්නවා. එක වර්ග අඩියකට. ඒ නිසා මේ තත්ත්වය හැම තැනම බදු දාලා. හැම තැනම මිනිස්සුන්ට දියුණු වෙන්න තිබෙන උත්සාහය අඩාල වෙනවා. ඒ නිසා පළාත් පාලන ආයතන එක පැත්තකින් ගන්නවා. අනික් පැත්තෙන් අපේ පළාත් සභාව බදු ගන්නවා. ඒ වාගේම නාගරික සංවර්ධන අධිකාරියට යන්න ඕනෑ විවිධ ව්‍යාපෘති ආරම්භ කරන්න. මොකද, යම් ප්‍රශ්නයක් ආවොත් එහෙම, ඒ පිළිබඳව පැමිණිල්ලක් ආවොත් එහෙම යන අදාළ නිලධාරියා අහන්නේ මේක ප්‍රාදේශීය සභාවෙන් අනුමත කරලාද? ප්‍රාදේශීය සභාවේ කාර්මික කමිටුවේ, පරිසර කමිටුවේ අනුමත කරලා ඒ ව්‍යාපාර පවත්වාගෙන යන්නට ඕනෑ. ඒ නිසා ඒ නාමය වෙනස් කරන්න ගියාමත් මෙපමණ කල් රුපියල් 4.50 ට තිබුණු වර්ග අඩියකට අය කරන මුදල, මේ වන විට රුපියල 45/- දක්වා වැඩි කරලා තිබෙනවා.

ඒ නිසා මේ බදු බර මිනිස්සුනට දරන්න අමාරුයි. ඒ හින්දා මේ මුළු ආයතන සියල්ලම දුවන්න හදන්නේ ප්‍රාදේශීය සභාවේ ඉඳලා. පළාත් සභාව වේවා. මධ්‍යම ආණ්ඩුවේ වේවා. පුංචි මිනිස්සු රජ කරනවා කියලා කියමින්, පුංචි මිනිස්සුන්ගේ කරමත දාන්න තිබෙන සියලුම බදු දාලා ඔවුන්ට ස්ව ශක්තියෙන් නැඟිටින්න තිබෙන අවස්ථාව සම්පූර්ණයෙන්ම අහිමි කරනවා. ඒ නිසා අපි ඉල්ලීමක් කරන්නේ. බදු අවශ්‍යයි. ඒක පුද්ගලිකව පිළිගන්නවා. නමුත් මේ ආයතන එකට ඉඳගෙන සාකච්ඡා කරලා, එකම මිනිහාට ආයතන ගණනාවකින් බදු වදින ක්‍රමය නවත්වලා මොකක් හෝ සහනයක් ඒ මිනිස්සුන්ට සලසා දෙන්නය කියලයි අපි ඉල්ලීමක් කරන්නේ.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම අපේ ගරු මහ ඇමැතිතුමාගේ විෂයයක් යටතේ මෙම ව්‍යාපාර නාම ලියාපදිංචි සංශෝධන ඉදිරිපත් කරන වේලාවේ මමත් අදහස් කීපයක් ඉදිරිපත් කරන්න කැමැතියි. මුලින්ම කියන්න ඕනෑ, කනගාටුයි. විශේෂයෙන්ම, මේ නාම ව්‍යාපාර ලියාපදිංචි ස්ථානයට ගියාම අපට අවශ්‍ය විස්තර ගන්න බැහැ. මොකද, මම රෙජිස්ත්‍රාර්තුමියත් එක්ක කථා කළාම, ඒවා තවම මොනවත් computerized කරලා නැහැ. තවම ඒ අය අවුරුදු 25 කට, 50 කට කලින් තිබුණු විධියට තමයි එහි ලියවිලි සිදු වන්නේ. මම හිතනවා, බස්නාහිර පළාත් සභාව විශේෂයෙන්ම, මේ රටේ මූලික පළාත් සභාවක් යටතේ තිබෙන ආයතනයක්. ඒ වාගේම අපේ ගරු මහ ඇමැතිතුමා යටතේ තිබෙන ආයතනයක් හැටියට තවම එහි කිසිම දෙයක් computerized කරලාවත් අපට ඉල්ලපු ප්‍රමාණයෙන් ඒ දත්ත හා විස්තර ගන්න විධියක්වත් නැහැ. ඒ අය තවම අර පරණ ක්‍රමයට පොත්වල තමයි ඔක්කෝම ලියාගෙන යන්නේ.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

දැන් computerized කරලා තිබෙනවා.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

නැහැ. මම දැන් සුමාන දෙකකට කලින් ගියා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

දැන් කරගෙන යනවා.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

හරි. තව දෙයක් තමයි මම සංශෝධන හැටියට යෝජනා කරනවා. විශේෂයෙන්ම මේ නාම පුවරු ලියාපදිංචියේදී දැන් හුඟාක් අය තමන් ලියාපදිංචි කරන දේ නොවෙයි, ව්‍යාපාරය හැටියට පසුව කරගෙන යන්නේ. දැන් තමන් එක නමකින් ලියාපදිංචි වෙනවා, මේ වෙළඳාම කරනවා කියලා. නමුත් එයා කරගෙන යන්නේ, වෙන වෙළඳාමක්. එතකොට මම දැනගත්ත විධියට ඒවා නවත්වන හරි, ඒවාට නීති ක්‍රියාමාර්ග ගන්න හරි බලයක් නැහැ.

දැන් අපි උදාහරණයක් හැටියට ගත්තොත්, විශේෂයෙන්ම මම ගිය පළාත් සභා වාරයේදීත් කථා කළා, පෞද්ගලික පාසල් සම්බන්ධව. ලංකාවේ අධ්‍යාපන නීතිය අනුව පෞද්ගලික පාසල් ආරම්භ කරන්න නීතිමය බලයක් කාටවත් නැහැ. නමුත් සියලුම ව්‍යාපාරිකයන් මේ නාම ව්‍යාපාර යටතේ ජාත්‍යන්තර පාසල් කියලා ලොකු නමක් දාගෙන, එහෙම නැත්නම් අධ්‍යාපන Center කියලා නමක් දාගෙන, එහෙම නැත්නම් උපකාරක පන්ති කියලා නමක්

දාගෙන ප්‍රාථමික අංශයේ සිට ද්විතීයික අධ්‍යාපනය දක්වා පෞද්ගලික පාසල් පටන් අරගෙන තිබෙනවා, මේ කොළඹ නගරයේ. අද බස්නාහිර පළාත් සභාවේ පාසල් 250 ක් විතර වාගේ ප්‍රමාණයක් තිබෙනවා. නමුත් මේ ඉස්කෝලවල් පටන් ගන්න නීතිමය බලයක් නැහැ. මම එතකොට රෙජිස්ත්‍රාර්තුමියගෙන් ඇහුවා, මේකට මොකක්ද ගන්න ක්‍රියා මාර්ගය කියලා. එතුමිය කියනවා. ඒ අය Application එක දෙනකොටම ලියලා දෙනවා කියලා, ප්‍රාථමික අධ්‍යාපනය පටන් ගන්නත් බැහැ. ද්විතීයික අධ්‍යාපනය පටන් ගන්නත් බැහැයි කියලා. එහෙම තමයි Application එක භාර ගන්නේ. නමුත් ඒ අය ගිහිල්ලා ඉස්කෝලවල් පටන් ගන්නවා. අද එවැනි ඉස්කෝලවල් කොළඹ නගරයේ හැම තැනම තිබෙනවා. එතකොට මේක කොහොමද නවත්වන්නේ? එතුමිය කියනවා, එතුමියට මෙය නවත්වන්න නීතිමය බලයක් නැහැයි කියලා. මොකද එයා ලියාපදිංචි වෙන්නේ උපකාරක පන්ති පවත්වනවා කියලා. නමුත් ගිහිල්ලා පටන් ගන්නේ ඉස්කෝලයක්. එතුමිය කියනවා, මෙය නවත්වන්න එතුමියට නීතිමය බලයකුත් නැහැයි කියලා. මම හිතනවා, මෙය මෙහි තිබෙන ලොකුම අඩුපාඩුවක් කියලා. අනිවාර්යෙන්ම එයට නීතිමය තත්ත්වයක් අවශ්‍යයි.

මම හිතන්නේ අපි සාකච්ඡා කරලා, යම්කිසි නීතිමය රාමුවක් ගෙනෙන්න ඕනෑ. මොකද, ප්‍රාථමික, ද්විතීයික අධ්‍යාපනය කියලා කියන්නේ, මේ රටේ එහෙම විකුණන්න පුළුවන් දෙයක් නොවෙයි. ඒකට කිසිම නීතිමය බලයක් නැහැ. එහෙමනම් අපි මේකට අඩංගු කරන්න ඕනෑ, කාටවත් පාසල් පටන් ගන්න බැහැ. එහෙම පටන් ගත්තා නම් ඒවා නවත්වන්න පුළුවන් නීති රෙගුලාසි මම හිතන්නේ අපි පනවන්න ඕනෑ. ඒක හැම වෙළඳාමකටම තිබෙන්න ඕනෑ. මම කියන්නේ ඒකයි. දැන් සමහර අය පටන් ගන්න වෙළඳාම නොවෙයි, මෙතැන ලියාපදිංචි කරන වෙළඳාම නොවෙයි, ඒ අය කරගෙන යන්නේ. නමුත් මේ ආයතනයට කිසිම නීතිමය බලයක් නැහැ, ඒ වෙළඳාම ගිහිල්ලා නවත්වන්න. ඒක නීති විරෝධීයි කියලා කියන්න. ඒ හින්දා මම දකිනවා, මෙහි ලොකු අඩුපාඩුවක් තිබෙනවා. ඒක ඔබතුමාගේ මාර්ගයෙන් ගරු මහ ඇමැතිතුමාට ඉදිරිපත් කරනවා. මේ පිළිබඳව දැඩි අවධානය යොමු කරලා, ඒ සංශෝධනත් ක්‍රියාත්මක කරන්න කියලා. ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා, ගරු මන්ත්‍රීවරුන් කිහිපදෙනෙක්ම අදහස් ප්‍රකාශ කළා. ඔබතුමා ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරනවාද?

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීතුමා කරපු පෞද්ගලික ප්‍රකාශය සම්බන්ධයෙන් මේ වන විට කටයුතු කරන්න අපි අදාළ නිලධාරීන් එක්ක මූලික සාකච්ඡා කරලා ඊළඟ උපදේශක කාරක සභාවටත් යෝජනා කරලා තිබෙනවා, මේ පිළිබඳව සාකච්ඡාවට අරගන්න. මන්ත්‍රීවරුන්ගේ අදහස් ගන්න කියලා. මේ කියන නීති සම්බන්ධව කටයුතු කරන්න අපි ඉදිරි කාලයේදී ප්‍රඥප්ති හා නීති කාරක සභාවට ගිහිල්ලා ඒ සම්බන්ධයෙන් කටයුතු කළ යුතුව පවතිනවා කියලා. ගරු මන්ත්‍රීවරුන්ගේ වැදගත් අදහස්වලට ගරු කරමින් ඒ සඳහා ඉදිරියේදී කටයුතු කරන්න පුළුවන් ගරු සභාපතිතුමනි. නමුත් මම විශ්වාස කරනවා පළාත් සභාවක් හැටියට අපි නම් කරලා තිබෙන මේ මුදල් ප්‍රමාණය, අනිකුත් ආයතන සම්බන්ධයෙන් - ගරු මන්ත්‍රීවරු අදහස් ප්‍රකාශ කළා. මම දන්නවා. ව්‍යාපාරයකට එය යම් ප්‍රමාණයකට බලපානවා. නමුත් මම හිතන්නේ, රුපියල් 2500/- ක් කියන්නේ එක අවස්ථාවකදී විතරයි. පළාත් සභාවක් හැටියට ව්‍යාපාරයක් ලියාපදිංචි කරන කෙනෙකුට තමන්ගේ ව්‍යාපාරයේ බදු මුදල් ගෙවාගෙන, ඒ කටයුතු කරන කෙනෙකුට මේ වාගේ මුදලක් ඒ තරම් බලපාන්නේ නැහැයි කියලා මම හිතනවා. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා, මේ සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලෙස.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, මම තව දෙයක් මතක් කරන්න කැමැතියි. දැන් මෙහි තිබෙනවා, දහ වැනි මාසයේ 01 වැනිදා සිට ක්‍රියාත්මකයි කියලා. හැබැයි, මම මධ්‍යම පළාතේ සීගිරියේ අලි ව්‍යාපාරයක් ආරම්භ කරලා තිබෙනවා. රියා සෆාරි කියලා. අපි ඒක ලියාපදිංචි කරන්න ගියාම අට වැනි මාසයේත් මේ ගණන අරගෙන තිබෙනවා. ඒක නිසා මේක බොරුවක්. මෙතැන කියනවා, දහවැනි මාසයේ පළමුවැනිදා සිට කියලා. මේක අය කර ගත්තා.

[ ගරු කිත්සිරි කහටපිටිය ]

ගරු සභාපතිතුමනි, මම මෙය ඔබතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට සහ අමාත්‍ය මණ්ඩලයට සහ මන්ත්‍රීවරුන්ට මතක් කරන්න ඕනෑ. මේ වාගේ වැඩ පිළිවෙළවල් මධ්‍යම ආණ්ඩුව ක්‍රියාත්මක කරන කොට පළාත් සභාවත් එක්ක සාකච්ඡා කරලා, අදහස් අරගෙන මොනවාහරි කරලා ගෙනෙන්න ඕනෑ. එක තැනක පළමුවැනිදා සිට කියලා මෙතැන කියනවා. නමුත් අපේ සභාවට අදයි මෙය ආවේ. දැන් බලන්න. දහ වැනි මාසයේ පළමුවැනිදා සිට යන එක අද කීයද? අද එකළොස් වැනි මාසයේ 26 දා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා සීගිරිය කියලා කිව්වේ, දඹුල්ල පැත්තේ සීගිරිය නේද?

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඔව්. මධ්‍යම පළාතේ.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මෙතුමා කථා කරන්නේ මධ්‍යම පළාතේ අය කිරීමක් පිළිබඳව.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

නැහැ. නැහැ. පළාත් සභාවේම තමයි ඒක -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, -

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මධ්‍යම පළාතේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ බස්නාහිර.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඒක තමයි ඉතින්. මේක එතකොට බස්නාහිර පළාතට විතරද? එහෙම නම් බස්නාහිර පළාතේ අය ඒ පළාතට යයි ගණන අඩු නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. එහෙම වෙන්නේ නැහැ නේ? ඒ පැත්තේ Business කරන්න යන්නේ නැහැ නේ?

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මේක මධ්‍යම රජයෙන් කරලා තිබෙන්නේ. මුළු පළාත් 06 ටම මේ ගැසට් එක දීලා තිබෙන්නේ.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

දැන් ඔබතුමා කිව්වේ, අලියා ලියාපදිංචි කරන්න ගිය එක එහෙදී වුණා කියලා නේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මගේ පෞද්ගලික එකක්. මම කථා කරන්නේ නැහැ ඒ ගැන.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

එතකොට ඒ පළාතේ දැනටමත් මේ මුදල අය කරනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඔබතුමා අපරාදේ කාලය ගන්න එපා, නිකන් පෞද්ගලික කරුණු අරගෙන. මේක අපි රටේ පුරවැසියන්ට පොදුවේ බලපාන, පළාත්වල තිබෙන බලතල අනුව කරන අසාධාරණයක් පිළිබඳව අපි කථා කරන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒ කියන්නේ අලියා නාවන්න ගිහින් කියලා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

නැහැ. නැහැ. ඒවා වැඩක් නැහැ. අපට පෞද්ගලික ප්‍රශ්න වැඩක් නැහැ. මහජනතාව වෙනුවෙන් අපි කථා කරන්නේ.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු මන්ත්‍රීතුමා, පොඩි පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි. දැන් ඔබතුමා කිව්වා, දහවැනි මාසයේ පළමුවැනිදාට පෙර සිට බස්නාහිර පළාත තුළ මෙය අය කරගන්නවා කියලා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මෙහි තිබෙන්නේ, දහ වැනි මාසයේ පළමුවැනිදා සිට ක්‍රියාත්මක කරන්න. ඔබතුමාම කියලා තිබෙන්නේ.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ඔව්.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

එතකොට මේවා මේ අවුරුද්දේ පස් වැනි මාසයේ සිටම මේ මුදල ක්‍රියාත්මක වෙනවා.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

බස්නාහිර පළාතේත්?

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

බස්නාහිර පළාතේත්. ඔව්.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

මේ පළාතේ රෙජිස්ටර් කරද්දී?

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඔව්. බස්නාහිර පළාතේත් ක්‍රියාත්මකයි.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ඔබතුමා වගකීමෙන්ද ඒක කියන්නේ?

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඔබතුමා ආයතනයෙන් කථා කරලා අහන්න කෝ.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ඔබතුමා කියනවා නම් මට සොයලා බලන්න පුළුවන්.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

සොයලා බලන්න. එතකොට ඉවරයි.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, සොයලා බලලා කියන්නම්.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

සොයා බලලා සම්මත කරන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධයෙන් අපේ ගැටලුවක් නැහැ. නමුත් අපි කියන්නේ, ගරු ප්‍රධාන අමාත්‍යතුමා යටතේ තමයි බස්නාහිර පළාත් සභාව යටතේ තිබෙන සියලුම පළාත් පාලන ආයතන තිබෙන්නේ. දැන් මේ වන විට සමහර පළාත් පාලන ආයතන තීන්දුවක් අරගෙන තිබෙනවා. ඒ අය ආදායම් පරීක්ෂකවරු යොමු කරලා තිබෙනවා, පළාත් පාලන ආයතනවලට ආදායම් සොයා ගන්න. මේ විධියේ ගම් මට්ටමේ සුළු පරිමාණයෙන් විවිධ කර්මාන්තවල නියැලෙන උදවිය කවුද කියලා සොයාගෙන, හඳුනාගෙන ඒ අයගෙන් යම් අය කිරීමක් ගන්න කටයුතු සැලසුම් කරගෙන යනවා. ඒ හේතුව තමයි සභාවක් දුවන්නත් මුදල් අවශ්‍යයි. ඒ නිසා එහෙම මුදල් උපයන අය තෝරාගෙන ඒ අයගෙන් බදු අය කරගන්න මේ වන විට කටයුතු කරමින් යනවා. සමහර පළාත් පාලන ආයතවල. මෙය ගරු ප්‍රධාන ඇමැතිතුමාට සොයලාම

[ ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා ]

බලන්න පුළුවන්. සභාව තීන්දු අරගෙන මේ වන විට ක්‍රියාත්මක වෙනවා. එතකොට එකම පුද්ගලයා එක වේලාවකදී පළාත් පාලන ආයතනයට ඒ ව්‍යාපාරය වෙනුවෙන්ම ගෙවනවා. මේ සුළු ව්‍යාපාරිකයා. මහා පරිමාණයේ පුද්ගලයා නොවෙයි. ඊළඟට ඔහු මේ පළාත් සභාවට ගෙවනවා. අනික් පැත්තෙන් යම්කිසි පුද්ගලයෙක් තමන් කරන ව්‍යාපාරය අසාර්ථක වෙන්න පුළුවන්. ඒ අසාර්ථක වුණාම ඔහු කල්පනා කරනවා, මේ ව්‍යාපාරය වෙනත් නාමයකින් වෙනත් දෙයක් කරගෙන යන්නට ඕනෑය කියලා. අසාර්ථක වුණු පුද්ගලයෙක් කල්පනා කරනවා, මේකට මම යම් මුදලක් බැංකුවකින් හෝ වෙනත් තැනකින් ණයට ගන්නට ඕනෑය කියලා. එහෙම ගන්න ගියාම ඒක අනුමත කරන්නේ අදාළ පළාත් පාලන ආයතනය. ඒ පළාත් පාලන ආයතනයට ගියාම තමන්ගේ ඒ ව්‍යාපාරය පවත්වපු එක වෙනත් ව්‍යාපාරයක් විධියට පරිවර්තනය කරන්න ගියාම - මම ඒකයි මුලිනුත් මතක් කළේ, නාගරික සංවර්ධන අධිකාරිය මෙතෙක් තිබුණු මුදල වුණු රුපියල් 4.50, රුපියල් 45/- දක්වා වැඩි කරලා තිබෙනවා. ඉතින් අපි ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලන්නේ. මේ පිළිබඳව යම් විමසීමක් කරලා එකම පුද්ගලයාට ආයතන තුනකින් වෙන අසාධාරණය වළක්වලා තීන්දුවක් ගන්නය කියලයි. ඒකයි අපි කියන්නේ. එපමණයි.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

අපි විරුද්ධ නැහැ. අපි කියන්නේ අවම කර ගන්න කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද බස්නාහිර පළාතේ වෙළඳ සංස්ථා හා සංස්ථාගත කරනු නොලැබූ වෙළඳ ආයතනයන්හි ව්‍යාපාර නාම ප්‍රඥප්තිය යටතේ සාදනු ලබන රීති සම්බන්ධ යෝජනාවට මේ අවස්ථාවේදී ගරු මන්ත්‍රීතුමන්ලා අදහස් ප්‍රකාශ කළා. මම ඒ පිළිබඳව ස්තූතිවන්ත වෙනවා. ඒ පිළිබඳව සභාවේ බෙදීමක් තිබෙනවාද?

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු ජගත් අංගගේ -**අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ මම මෙම සභාවේ ගරු මන්ත්‍රීවරුන්ටත්, සභාවටත් බලපාන ප්‍රශ්නයක් පිළිබඳව ඔබතුමාට කරුණු පැහැදිලි කිරීමට අවසර ඉල්ලා සිටිනවා. මට අද උදේ සභාවට සහභාගී වෙන්න විනාඩි 16 ක කාලයක් පරක්කු වුණා. අද උදේ පාන්දර ගරු ප්‍රධාන ඇමැතිතුමා මට දුරකථනයෙන් කථා කරලා කිව්වා, අවිස්සාවෙල්ල රෝහලේ ඇති වෙලා තිබෙන ගැටලු සහගත තත්ත්වයක් පිළිබඳව. ඒ කරුණු සොයා බලලා ඒ පිළිබඳව සභාව දැනුවත් කිරීමට අවශ්‍යතාවයක් තිබෙන නිසා. ඒ නිසයි මට හදිසියේ ඒ සඳහා යෙදෙන්න සිද්ධ වුණේ.

ගරු සභාපතිතුමනි, ලංකාදීප පුවත්පතේ 06 වැනි පිටුවේ සඳහන් වෙනවා, අවිස්සාවෙල්ල රෝහලට සේලයින් දෙන්න වෙලා කියලා. මේ ප්‍රධාන ශීර්ෂ පාඨය යටතේ. මෙයට ප්‍රධානම කාරණාව වෙලා තිබෙන්නේ ගරු සභාපතිතුමනි, සේවක හිඟය. වෛද්‍යවරුන්ගේ හිඟය. හෙද නිලධාරීන්ගේ හිඟය. ඒ වාගේම පරිපූරක වෛද්‍ය සේවයේ හිඟය. මේ ආදී වශයෙන් සේවක කාණ්ඩවල හිඟය. විශේෂයෙන්ම දැන් මේ අධිකරණ වෛද්‍ය නිලධාරීවරුන් හතර දෙනෙකුගේ සේවය අවශ්‍ය කරන අවිස්සාවෙල්ල රෝහලට මේ වන විට ඒ සේවාවන් සැපයීමේ සේවක කණ්ඩායම්වල හිඟයක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, මම එය පිළිගන්නවා.

ගරු සභාපතිතුමනි, මේ සේවක ස්ථාන මාරු කිරීම් සහ සේවකයන් බඳවා ගැනීමේ කිසිදු පටිපාටියක පළාත් සභාව යෙදෙන්නේ නැහැ. එතකොට වාර්ෂිකව සිදුවන ස්ථාන මාරුවීම්වලදී , වෛද්‍යවරුන්ගේ ස්ථාන මාරුවීම් සඳහා වෛද්‍යවරුන් රෝහල් අතර ස්ථාන මාරුවීම් සිදුවන කාලපරිච්ඡේදයක්. මෙය අවිස්සාවෙල්ලට පමණක් නොවෙයි. සමස්ත අපේ රෝහල් පද්ධතියටම බලපාන කාරණාවක්. පසුගිය දවස්වල එක තැනක ලියැවුණා ගරු සභාපතිතුමනි, ගලපාත රෝහල වහලයි කියලා. දොඩම්ගොඩ රෝහල වහලයි කියලා. වහලා කියන්නේ ගරු සභාපතිතුමනි, වහලා නොවෙයි. මේ සේවය අඛණ්ඩව පවත්වාගෙන යෑමට තිබෙන බාධාවන්. පැය 24 අඛණ්ඩ සේවාවක් නිසා. දැන් වෙලා තිබෙන්නේ, අපි මේක මධ්‍යම රජයේ සෞඛ්‍ය අමාත්‍යාංශය දැනුවත් කරලා තිබෙනවා.

හෙද නිලධාරීන් පමණක් 100 කගේ විතර අඩුපාඩුවක් තිබෙනවා. දැන් බැලූ බැල්මට පෙනෙන්නේ, අවිස්සාවෙල්ල රෝහල පාලනය කරන්නේ පළාත් සභාව. ඒ නිසා මේ පළාත් සභාව මේ රෝහල පාලනය කිරීමේදී ඇති වෙලා තිබෙන ගැටලුවක් කියන ආකාරය තමයි නොදන්නා කෙනෙකුට පැහැදිලි වෙන්නේ. මෙයට වගකිවයුත්තා කවුද කියලා පුවත්පත් නිවේදනයේ සඳහන් වෙන්නේ නැහැ.

ඒ නිසා මම ඔබතුමාට ඉතාමත් ගෞරවයෙන් සිහිපත් කරනවා. මේ තත්ත්වය යටතේ අපට අඩුම ගණනේ වෛද්‍ය නිලධාරීවරුන් පස් දෙනෙකුගේ සේවය අවශ්‍යයි. අධිකරණ වෛද්‍ය නිලධාරියෙක් සහ සහයක වෛද්‍ය නිලධාරීන් හතර දෙනෙකුගේ සේවය අවශ්‍යයි, අවිස්සාවෙල්ල රෝහලේ මේ මෘත ශරීරාගාරයේ වැඩ කටයුතු නියම ආකාරයෙන් පවත්වාගෙන යන්න. නමුත් මේ වන විට අපට ඒ නිලධාරි පහසුකම් නැහැ. ඒ අපහසුව නිසා තමයි මෙවැනි චෝදනාවලට පළාත් සභාව, සෞඛ්‍ය අමාත්‍යාංශය ලක් වෙන්නේ. ඒක සමස්තයක් වශයෙන් පළාත් සභාවේ සියලු ගරු මන්ත්‍රීවරුන්ගෙන්, ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් ගරු මන්ත්‍රීවරුන්ගෙන් ප්‍රජාව ප්‍රශ්න කරන්න පෙළඹෙන ප්‍රශ්න. ඒ අයගෙන් අහන්න පුළුවන්. තමුන්නාන්සේලා යටතේ පළාත් සභාවට අයත් අවිස්සාවෙල්ල රෝහල පාලනය වෙන්නේ. මේ තත්ත්වය කොහොමද පාලනය කරන්නේ කියලා. ඉතින් මේ සේවක හිඟය තුළ නිර්මාණය වන ප්‍රශ්න ගරු සභාපතිතුමනි. ඒ එක්කම අපට කරන්න පුළුවන් ඒක දැනුම් දීම පමණයි. අපට සේවා ස්ථාන මාරු කිරීම් හෝ ඒ වාගේම මේ පුරප්පාඩු පිරවීමේ ක්‍රමවේදය තුළ නිරවද්‍ය භාවයෙන් සිදු වන්න නම් ස්ථාන මාරුවීම් වාර්තා කිරීමේදී එක් නිලධාරියෙක් ස්ථාන මාරු කිරීමේදී අදාළ නිලධාරියා සේවයට වාර්තා කිරීමෙන් අනතුරුව පමණයි ස්ථාන මාරුවක් සඳහා යෙදවිය යුතුයි කියන කාරණාව ඉතාමත් තදින් ක්‍රියාත්මක වෙනවා නම් මේ තත්ත්වය පාලනය කරන්න පුළුවන් කියලා මම ඔබතුමාට මේ අවස්ථාවේදී පැහැදිලි කිරීමක් කරනවා.

ගරු සභාපතිතුමනි, මේ හේතුව නිසාම සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා මා නිසා පොඩි අපහසුතාවයකට පත් වුණා. ගරු සභාපතිතුමනි, එතුමාගේ ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීමට ගරු ප්‍රධාන අමාත්‍යතුමා සති දෙකක කාලයක් කල් ඉල්ලා තිබෙනවා. මම කථා කරලා කිව්වා, මම මෙම කටයුත්තට සහභාගි වෙනවා කියලා. ගරු සභාපතිතුමනි, ඔබතුමා හා සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා මන්ත්‍රීතුමාගේ එකඟතාවය තිබෙනවා නම් - අපේ කාලපරිච්ඡේදයේ අවසාන අයවැය ලේඛනය අපට එන්නේ. ලබන පාර එන්නේ අයවැය. ඒ නිසා එතුමාගේ ප්‍රශ්නයට ඔබතුමා එකඟතාවය දෙනවා නම් පමණක් සභා සම්ප්‍රදායට, රීතියට අගෞරවයක්, හානියක් නොවෙනවා නම් පමණක් මට පුළුවන් ගරු සභාපතිතුමනි, මෙම පිළිතුරු සභාගත කරන්න. මෙයත් එවැනිම ප්‍රශ්නයක්. මෙම වෛද්‍ය නිලධාරිතුමිය පිළිබඳව දිගින් දිගටම - මෙතුමාගේ රෝහල විනාශ කළා. ඒ වාගේ ප්‍රශ්න කීපයකට තුඩු දුන්නා මේ වෛද්‍ය නිලධාරීතුමිය. සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා අහන්නේත් ඒකයි. ගරු සභාපතිතුමනි. අද වන කොට මේ වෛද්‍ය නිලධාරිතුමිය පමුණුගම රෝහලේ සේවය කරන්නේ. පමුණුගම රෝහලේ සමස්ත සේවක මණ්ඩලයත් එක්ක අර්බුද. කර කියාගෙන යන්නම බැහැ. ඒ නිසා ප්‍රජාවට වන අපහසුතා අපි දිගින් දිගටම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, ගරු මන්ත්‍රීතුමා මේ අවස්ථාවේදී සභා ගර්භයේ නැහැ. එතුමා ප්‍රශ්නය යොමු කළා. ගරු ප්‍රධාන ඇමැතිතුමා සති දෙකකට කල් ඉල්ලා ගත්තා. එම ප්‍රශ්නයට පිළිතුරු ටික සභාගත කරන්න ඔබතුමා සූදානම් නේද?

**ගරු ජගත් අංගගේ -**අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ලබන සභාවට මෙය ඉදිරිපත් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙනම් ලබන සභාවට ඉදිරිපත් කරන්න.

**ගරු ජගත් අංගගේ -**අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

පුවත්පත් නිවේදනය පිළිබඳ ප්‍රශ්නය මම ඉදිරිපත් කළේ ගරු සභාපතිතුමනි, සභාවේ ගෞරවය ආරක්ෂා කළ යුතු වීම මගේ යුතුකමක් හැටියට. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රයානුකූලව මීළඟට තිබෙන්නේ පොදු කටයුතු යටතේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් 2014 වර්ෂයට අදාළ මුදල් ප්‍රකාශය සහ ඊට අදාළ විසර්ජන ප්‍රඥප්තිය ඉදිරිපත් කිරීමේ අවස්ථාව. හරියටම පෙ.ව. 11.15 ට තව පැය භාගයකින් එතුමාට අවස්ථාව ලබා දෙනවා. ඒ නිසා කරුණාකර සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා පෙ.ව. 11.15 ට සභා ගර්භයේ රැඳී සිටින්න.

දැන් මෙම සභාව විනාඩි 30 කට උදැසන තේ විවේකය සඳහා කල් තබනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් පූ.භා. 11.18 ට යළිත් රැස් විය.***
*Sitting accordingly suspended until 11.18 a.m. and then resumed.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2014 වර්ෂය වෙනුවෙන් වූ මුදල් ප්‍රකාශ යෝජනාව ඉදිරිපත් කිරීමට ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ගෞරවයෙන් ආරාධනා කරනවා.

## 2014 වාර්ෂික මුදල් ප්‍රකාශය
ANNUAL FINANCIAL STATEMENT - 2014

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, *"2014 වර්ෂය වෙනුවෙන් වූ මුදල් ප්‍රකාශය අනුමත කළ යුතුය"* යන යෝජනාව මම ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අයවැය කථාව ඉදිරිපත් කිරීම සඳහා ගරු ප්‍රධාන අමාත්‍යතුමාට අවස්ථාව.

## අයවැය කථාව- 2014
BUDGET SPEECH - 2014

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, ගරු අමාත්‍යවරුනි, ගරු මන්ත්‍රීවරුනි, පළාත් සභාව තුළ විසි වසරකට ආසන්න කාලයක් කටයුතු කිරිමෙන් ලත් පළපුරුද්ද, අත්දැකීම් සහ දැනුම මත එළිදක්වන ලද උපාය මාර්ගික සංවර්ධන සැලැස්මේ දෙවන වර්ෂය සඳහා වූ ක්‍රියාත්මක සැලැස්ම ද, අප රටේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුව වන "මහින්ද චින්තන ඉදිරි දැක්මට" ද අනුගත වෙමින් පස්වන පළාත් සභාවේ පස්වන මුදල් ප්‍රකාශය ඉදිරිපත් කිරිමට හැකි වීම පිළිබඳව මා බෙහෙවින් සතුටු වෙනවා. ඒ සඳහා වූ 2014 වර්ෂයේ විසර්ජන ප්‍රඥප්තිය ද අද දින ඔබ හමුවේ තබනවා. ඒකීය රාජ්‍යයක් සහ යුද්ධයෙන් තොර සාමකාමී සමාජයක් තුළ කටයුතු කරන මෙවන් අවස්ථාවක අප පළාත් සභාවේ සැලසුම් අනුව කටයුතු කිරීමට රජයේ ඉහළ දායකත්වයක් ලැබීම සතුටට කරුණක්. රාජ්‍ය ප්‍රතිපත්තිය ලෙස ක්‍රියාත්මක වන ග්‍රාමීය පදනමක් මත එළි දක්වන ලද මහින්ද චින්තන ඉදිරි දැක්ම පළාත තුළ ක්‍රියාත්මක වන අවස්ථාවක පක්ෂ භේදයකින් තොරව එයට දායකත්වය ලබා දීම අපගේ වගකීමක් බවට පත්ව තිබෙනවා.

පළාත් සභා පිළිබඳව නොයෙකුත් මතවාද මෙම අවධියේ පවතිනවා. බස්නාහිර පළාත අප රටේ ප්‍රධාන පළාත වීමෙන් කුමන හෝ බලපෑමක් පළමුව දැනෙන්නේ අප පළාතටයි. ජාතික තලයේ සිදුවන හැල හැප්පීම්, දේශපාලන මතවාද, අභියෝග මෙන්ම ජාත්‍යන්තර තලයේ ප්‍රවනතාවලින් ද මුදවා ගෙන පළාතේ සංවර්ධනය ගැන වෙනම කථා කිරීමට හැකියාවක් නැහැ. ගස කොතරම් අකමැති වුවද සුළඟ හැමීම නතර කළ නොහැකිය. එබැවින් අප අවට පරිසරයේ ඇතිවන වෙනස්කම් අවබෝධ කර ගනිමින් අපේ කාර්යභාරය සැලසුම් කළ යුතුය. කථා කළ යුතුය. ක්‍රියා කළ යුතුය.

අපගේ සැලසුම් සකස් කිරීමේදී මා කලින් පෙන්වා දුන් පරිදි අපට හුදකලා ඒකකයක් ලෙස කටයුතු කළ නොහැක. බස්නාහිර පළාත් සභාව, ලංකාව තුළ එක් භූමි ප්‍රදේශයක්. ලංකාව, ලෝකය තුළ කුඩා රටක්. ඒ නිසා ලෝකය තුළ වෙනස්වීම් ද, අප රටේ ජනතාව මුහුණ දෙන සමස්ත ගැටළු

ද අපට අමතක කර කටයුතු කළ නොහැක. ජාතික ප්‍රතිපත්තිය අනුගමනය කිරීමට අප නීතියෙන් බැඳී සිටිනවා. විවෘත ආර්ථිකය ජනවාර්ගික ගැටළුව හා ඒ සඳහා රජයේ ප්‍රතිපත්තිය, රටක් වශයෙන් අප මුහුණ දෙන ආර්ථික හා සමාජමය ගැටළු, ජනතාවගේ හා රටේ ආරක්ෂාව, රජයේ ආර්ථික ප්‍රතිපත්තිය අපේ සැලසුම්වල කොටසක් කර ගත යුතු වෙනවා.

ගරු සභාපතිතුමනි, විවිධ ගෝලීය හා දේශීය අභියෝග හමුවේ වුවත්, ශ්‍රී ලංකා ආර්ථිකය 2012 වසර තුළ සියයට 6.4 ක සැලකිය යුතු වර්ධනයක් ඇති කරගෙන තිබෙන අතර අඛණ්ඩව සිව්වන වසරටත් උද්ධමනය තනි අංකයක පවත්වා ගෙන තිබෙනවා. මෙම තත්ත්වය පවත්වා ගැනීමට අප පළාතේ දායකත්වය විශාල පිටිවහලක් වී තිබෙන බව මාගේ විශ්වාසයයි.

මේ වන විට ශ්‍රී ලංකාව අඩු ආදායම්ලාභී රටක තත්ත්වයේ සිට පහළ මැදි ආදායම්ලාභී තත්ත්වයකට උසස් වී තිබෙනවා. ඒක පුද්ගල ආදායම අතින් ශ්‍රී ලංකාව අත්පත් කර ගැනීමට බලාපොරොත්තු වන ඉදිරි පියවර වන්නේ, 2016 වන විට ඉහළ මැදි ආදායම් රටක තත්ත්වයට පත් වීමයි. මේ සඳහා ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 4,000 ඉක්මවා යා යුතුයි. අප පළාතේ ඒක පුද්ගල ආදායම මෙම මට්ටමට ආසන්න වෙමින් පවතිනවා. ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 4,000 පසු කිරීම තීරණාත්මක කඩඉමක්. එය විශාල අභියෝගයක්. මෙම කඩඉමේදී ඇතිවන ගැටළු සහගත තත්ත්වයන් මැදි ආදායම් උගුල - Middle Income Trap ලෙස හඳුන්වනවා. ලෝකයේ සමහර රටවලට දිගු කාලයක් මෙම උගුලේ රැඳී සිටීමට සිදු වුණා. සිංගප්පූරුව, මැලේසියාව, කොරියානු ජනරජය, තායිලන්තය වැනි රටවල් සාර්ථකව මෙම උගුලෙන් මිදී ඉහළ ආදායම් මට්ටම දක්වා ගමන් කළා. ශ්‍රී ලංකාවද, අපේ පළාතද ඉහළ මැදි ආදායම් තත්ත්වයට ළඟා විය යුතුයි. ඒ සඳහා අප විසින් කළ යුතු කාර්යයන් රාශියක් පවතිනවා. වැඩි දියුණු කළ තාක්ෂණය නිරන්තරයෙන් හඳුන්වා දීම සහ වර්තමාන ශ්‍රම සූක්ෂම කර්මාන්ත, නවීන හා ප්‍රාග්ධන සූක්ෂම කර්මාන්ත ලෙස ඉහළ නැංවීම අනිවාර්යයයි. දළ දේශීය නිෂ්පාදනයට සියයට 11 ක දායකත්වයක් පවතින කෘෂිකාර්මික අංශයේ ඵලදායීතාවය ඉහළ නැංවීම අත්‍යවශ්‍යයයි. එසේ කළ විට එමඟින් ඇති වන ශ්‍රම අතිරික්තය වෙනත් අංශවලට අනුයුක්ත කිරීමේ හැකියාවක් පවතිනවා. එසේම අධ්‍යාපනය, පර්යේෂණ හා සංවර්ධනය වෙනුවෙන් කළ යුතු ආයෝජන වැඩි කළ යුතුයි. ඉදිරි වර්ෂය සඳහා අප විසින් සකසා ඇති සැලසුම් මේ සඳහා සුළු වශයෙන් හෝ දායක වේ යැයි මාගේ විශ්වාසයයි.

## උපාය මාර්ග සංවර්ධන ඉලක්කයන්
STRATEGIC DEVELOPMENT TARGETS

පසුගිය වර්ෂයේ අයවැය ඉදිරිපත් කරමින් මා නව වැදගත් සංවර්ධන ඉලක්ක පෙන්නුම් කළා. එම ඉලක්ක කරා අප ළඟා වෙමින් පවතිනවා. සියයට 6 ක් වූ විරැකියා අනුපාතය 2012 වර්ෂය අගවන විට සියයට 4 දක්වා අඩු වෙලා. සාක්ෂරතා අනුපාතය සියයට 96 දක්වා වර්ධනය වී තිබෙනවා. ඇමෙරිකානු ඩොලර් 3,750 ක් වූ පළාතේ ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 4,000 ට ආසන්න වී තිබෙනවා.

ගරු සභාපතිතුමනි, පසු ගිය අයවැයෙන් මා හඳුන්වා දුන් පස් අවුරුදු උපාය මාර්ගික සංවර්ධන සැලැස්ම යටතේ එක් එක් අමාත්‍යාංශ විසින් 2014 වර්ෂයේ දී ළඟා කර ගත යුතු ප්‍රධාන ඉලක්ක - Goals සහ ප්‍රමුඛ පරාසයන් - Thrust Areas පහත පරිදි හඳුනාගෙන තිබෙනවා.

අධ්‍යාපන අංශය යටතේ, සාක්ෂරතා අනුපාතය සියයට 96.8 දක්වා වර්ධනය කිරීම හා පාසල්වලට ශිෂ්‍යයින් ඇතුළත් වීමේ ප්‍රතිශතය සියයට 96.8 දක්වා වර්ධනය කිරීම.

කෘෂිකාර්මික අංශය යටතේ, ගොවීන්ගේ ආදායම සියයට 8 කින් ඉහළ නැංවීම හා වසවිෂෙන් තොර ගුණාත්මක ඵලවළු සහ පළතුරු ගෘහස්ථ මට්ටමේ භාවිතය වර්ධනය කිරීම.

ප්‍රවාහන සහ ග්‍රාම සංවර්ධන අංශ යටතේ, ගමනාගමනයට ගත වන කාලය අඩු කිරීම හා ප්‍රජාමූල සංවිධාන ශක්තිමත්

කර ග්‍රාමීය, නාගරික ප්‍රදේශ අතර ඇති අසමතුලිතතාවය අවම කිරීම.

සෞඛ්‍ය සේවය යටතේ, රෝහල්වල බාහිර රෝගී අංශවල ගත කරන කාලය විනාඩි 30 සිට 25 දක්වා අඩු කිරීම, රෝගියා රෝහලට ඇතුළත්ව පළමු පැය තුළ මිය යෑමේ ප්‍රතිශතය සියයට 15 කින් අඩු කිරීම හා බෝවන සහ බෝ නොවන රෝගවලින් සිදු වන මරණ සංඛ්‍යාව සියයට 10 කින් අඩු කිරීම.

මාර්ග අංශය යටතේ, රිය අනතුරු සංඛ්‍යාව සියයට 6 කින් අඩු කිරීම හා ස්වභාවික පිහිටීම අනුව මාර්ග අනතුරු ඇති වන ස්ථාන හඳුනාගෙන සිදු වන අනතුරු අවම කිරීම.

2014 සංවර්ධන සැලැස්ම යටතේ මුදල් වෙන් කිරීමේ දී ඉහත ඉලක්ක ළඟා කර ගැනීමේ අරමුණින් එම මුදල් යෙදවීම සෑම අමාත්‍යාංශයකම අරමුණයි. හඳුනාගත් ප්‍රමුඛ පරාසයන් සහ ඉලක්ක කෙරෙහි වර්ෂ අවසානයේ ළඟා වුයේ ද යන්න මැන ගැනීම සඳහා "ප්‍රධාන කාර්යය සාධක දර්ශක" ද දැනටමත් අප විසින් සකසා තිබෙනවා.

මාගේ මෙම අයවැය ප්‍රකාශය උපාය මාර්ගික සංවර්ධන සැලැස්මේ ඉලක්කයන් ඉටු කර ගැනීමේ මාර්ගය වශයෙන් සලකන ලෙස ගරු සභාවෙන් මා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, 2014 වර්ෂයේ ඇස්තමේන්තුගත මුළු වියදම රුපියල් මිලියන 43,707 ක් වන අතර ඉන් රුපියල් මිලියන 38,063 ක් පුනරාවර්තන වියදම්ය. රුපියල් මිලියන 5,644 ක් ප්‍රාග්ධන වියදම්ය. මෙම වියදම් පියවා ගැනීම සඳහා රජයෙන් ලැබීමට අපේක්ෂිත ජාතිය ගොඩනැඟීමේ බදු සහ මුද්දර ගාස්තු ඇතුළුව පළාත් සභාව රැස් කිරීමට අපේක්ෂිත ආදායම රුපියල් මිලියන 30,952 ක් වෙනවා. රුපියල් මිලියන 12,755 ක් ප්‍රදාන වශයෙන් රජයෙන් ලබා ගැනීමට අපේක්ෂිතයි. පුනරාවර්තන වියදම්, ආදායම් සහ ප්‍රදාන පිළිබඳ විස්තර පිළිවෙළින් පළමු, දෙවන සහ තුන්වන උපලේඛන වශයෙන් මේ සමඟ ඉදිරිපත් කරනවා.

**පුනරාවර්තන වියදම්**
RECURRENT EXPENDITURE

2013 වර්ෂයේ ඇස්තමේන්තු සමඟ සසඳන විට 2014 වර්ෂයේ පුනරාවර්තන වියදම් ඇස්තමේන්තුව රුපියල් මිලියන 2,992 කින් එනම් සියයට 8.53 ක වැඩිවීමක් පෙන්නුම් කරනවා. විශේෂයෙන් පුද්ගල පඩි නඩි වියදම 2013 වර්ෂයට වඩා 2014 වර්ෂයේදී සියයට 10.48 කින් වැඩිවීම මෙම තත්ත්වයට ප්‍රධානතම හේතුවයි. 2013 වර්ෂයට වඩා අපගේ කාර්යය මණ්ඩලය සියයට 4.19 කින් වැඩි වීම පුද්ගල පඩි නඩි වැඩි වීමට හේතු වී තිබෙනවා.

**ප්‍රාග්ධන වියදම්**
CAPITAL EXPENDITURE

2014 වර්ෂයේ අපේක්ෂිත ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන 5,644 කි. මෙය වර්ෂයේ දැරීමට අපේක්ෂිත මුළු වියදමින් සියයට 12.91 ක් වෙනවා. 2013 වර්ෂයේදී මුදල් කොමිෂන් සභාව පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සහ උපමාන පාදක ප්‍රදාන යටතේ රුපියල් මිලියන 1,636 ක් ලබා දුන් අතර 2014 වර්ෂයේදී මේ යටතේ ලබා දීමට එකඟ වී ඇති මුදල රුපියල් මිලියන 1,745 ක් වෙනවා.

ගරු සභාපතිතුමනි, විසි වර්ෂයකට වැඩි පළාත් සභා ඉතිහාසයේ මුළු ඇස්තමේන්තුගත වියදමින් ප්‍රාග්ධන වියදම සියයට 10 ඉක්ම වූ අවස්ථා ඉතා අල්පයි. පසුගිය වර්ෂ දෙකේදී සියයට 10 ඉක්මවා එය පවත්වා ගැනීමට අපට හැකි වුණා. 2014 වර්ෂයේද එම තත්ත්වය පවත්වා ගැනීමට හැකි වී තිබෙනවා. නොයෙක් අභියෝග හමුවේ වුවද අඛණ්ඩව වර්ෂ තුනක් සියයට 10 කට වැඩි ප්‍රාග්ධන වියදමක් පවත්වා ගෙන යාමට හැකිවීම අප ලද විශාල ජයග්‍රහණයක් ලෙස සලකනවා.

ගරු සභාපතිතුමනි, අපේ ප්‍රාග්ධන වියදම් රටාව තුළ දැකිය හැකි විශේෂ ලක්ෂණයක් තිබෙනවා. වර්ෂය මුල ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තු ප්‍රතිශතය වර්ෂය අග වන විට වැඩි කර ගැනීමට හැකි වීම එම තත්ත්වයයි. පරිපූරක ඇස්තමේන්තු මඟින් ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රතිපාදන සලසා ගැනීමට හැකි වීම එයට හේතුවයි. 2012 වර්ෂය ආරම්භයේ ප්‍රාග්ධන වියදම් ප්‍රතිශතය සියයට 14.09 ක් වුවත්, වර්ෂය අග වන විට එය සියයට 15.84 දක්වා වැඩි කර ගැනීමට හැකි වුණා.

මේ සම්බන්ධ පූර්ණ විස්තරයක් හතරවන උපලේඛනය වශයෙන් මේ සමඟ ඉදිරිපත් කරනවා. ඒ අනුව 2013 වර්ෂයද ඇතුළුව පසුගිය වර්ෂ තුන තුළ රුපියල් මිලියන 15,444 ක් පළාත තුළ ආයෝජනය කිරීමට සැලසුම් කළා. එම වර්ෂ තුන තුළ වර්ෂය ආරම්භයේ ඇස්තමේන්තු කළ වියදමට වඩා රුපියල් මිලියන 3,110 ක ප්‍රාග්ධන ප්‍රතිපාදන වර්ෂය අග වන විට සලසා ගැනීමට හැකි වී තිබෙනවා. ඒ අයුරින් 2014 වර්ෂය අවසාන වන විට ප්‍රාග්ධන වියදම් ප්‍රතිශතය වැඩි කර ගැනීම අපගේ බලාපොරොත්තුවයි.

**මානව සම්පත් කළමනාකරණය**
HUMAN RESOURCE MANAGEMENT

ගරු සභාපතිතුමනි, මහජනතාව වෙත සපයනු ලබන සේවාවන් නිසි පරිදි ඉටු කරමින් සංවර්ධන ක්‍රියාදාමය වේගවත් කිරීමට නම් පළාත් සියලු අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අනෙකුත් කාර්යාලවලට අවශ්‍ය මානව සම්පත් ලබා දීම සහ එය කළමනාකරණය කිරීම ඉතා වැදගත්. සේවා අවශ්‍යතාවයන්හි ඌනතාවයක් ඇති නොවන පරිදි පළාත් රාජ්‍ය සේවයට බඳවා ගැනීම සහ එහි පරිපාලන කටයුතු කළ යුතුයි. ඒ අනුව 2012 වර්ෂයේ නොයෙක් තනතුරු සඳහා නිලධාරීන් 3,289 දෙනෙකු බඳවා ගෙන තිබෙනවා. 2013 වර්ෂයේ දී 3,000 ක් පමණ බඳවා ගැනීමට බලාපොරොත්තු වුවත් පසුව ඇති වූ පුරප්පාඩු ද අනුව 4,122 ක් දැනටමත් බඳවා ගෙන අවසන්. එසේම 2012 සහ 2013 වර්ෂ තුළ උපාධිධාරී අභ්‍යාසලාභීන් වශයෙන් 890 ක් පළාත් රාජ්‍ය සේවයට ඇතුළත් කර ගෙන තිබෙනවා. මෙම වර්ෂය අවසන් වීමට පෙර ඔවුන් සියලු දෙනාම ස්ථිර තනතුර හිමි නිලධාරීන් බවට පත් කිරීමට මා බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමනි, දැනට අප පළාතේ 71,000 කට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටිනවා. එම අයගේ සුභසාධනය ගැන සොයා බැලීම ඉතා වැදගත්. සේවා නියුක්තිකයාට හෝ ඔහුගේ පවුලේ අයෙකුට ලෙඩක් දුකක් සැදුණ විට මූල්‍ය ආධාරයක් ලබා දීමේ ක්‍රමයක් මෙතෙක් පැවතියේ නැහැ. එය විශාල අඩුවක් සේ මා දකිනවා. එම නිසා රක්ෂණ ආයතනයක් සමඟ සාකච්ඡා කර රුපියල් 900 ක් වැනි ඉතාම අඩු වාර්ෂික රක්ෂණ වාරිකයක් ගෙවා රක්ෂණ ආවරණයක් සලසා දීමට අප කටයුතු කර තිබෙනවා. මෙමඟින් විශාල රෝග සංඛ්‍යාවකට, රුපියල් දස ලක්ෂයක උපරිමයකට යටත්ව රක්ෂණ වන්දි ලබා ගන්න පුළුවන්. රුපියල් 900 ක රක්ෂණ වාරිකයෙනුත් සේවකයා ගෙවිය යුත්තේ ඉන් භාගයක් වන රුපියල් 450 ක් පමණයි. ඉතිරි රුපියල් 450 පළාත් සභාවෙන් ගෙවීමට බලාපොරොත්තු වෙනවා. මෙම වැඩ සටහනේ මුල් පියවර වශයෙන් ගුරුවරුන් රක්ෂණය කිරීම දැනටමත් ආරම්භ කර තිබෙනවා.

මානව සම්පත් ඵලදායි ලෙස යොදවා ගැනීමට නම් නිරන්තර පුහුණුව සහ සංවර්ධනය අත්‍යාවශ්‍යයි. පසුගිය වර්ෂ දෙකේදී දේශීය සහ විදේශීය පුහුණුවීම් වඩාත් ඵලදායි ලෙස හැසිරවීමට අපට හැකි වී තිබෙනවා. 2013 වසර දේශීය පුහුණු වැඩ සටහන්වල වෙනසක් කළ වර්ෂයක් ලෙස දකින්න පුළුවන්. සාම්ප්‍රදායික පුහුණු රටාවෙන් මිදී වැඩිහිටි පුහුණු ක්‍රමවේද අනුගමනය කරමින් දේශන ශාලාවෙන් පිටත එනම් බැහැරගත ක්‍රියාකාරකම් සහිත වැඩමුළු පැවැත්වීම එම වෙනසයි. ආකල්පමය වෙනස්කම් ඇති කර ගැනීම එහි මූලික අරමුණයි. ඒ වගේම පුහුණුලාභීන්ගේ තාක්ෂණික කුසලතා - Hard Skills සහ මෘදු කුසලතා - Soft Skills හඳුනාගෙන ඒවා සංවර්ධනය කිරීමට ද කටයුතු කළ යුතුයි. 2014 වසරේදී ද එවැනි පුහුණු වැඩ සටහන් පැවැත්වීමට මා යෝජනා කරනවා.

පසුගිය දශක දෙකක් වැනි සුළු කාලයක් තුළ ලෝකයේ සමහර රටවල්වල විශාල පරිවර්තනයන් සිදු වෙලා. චීනය වැනි රටවල් පසුගිය කෙටි කාලය තුළ සීඝ්‍ර සංවර්ධනයක් ලබා තිබෙනවා. මෙම වෙනස්කම් අපේ නිලධාරීන් දැකිය යුතුයි. අවබෝධ කර ගත යුතුයි. ඒ සඳහා විදේශීය පුහුණුවීම් ඉතා වැදගත්. දැනට වර්ෂ හත අටකට පෙර කාලය සැලකුවහොත් පළාත් සභා නිලධාරීන්ට විදේශීය පුහුණුවීම් ලබා ගැනීමට තිබූ අවස්ථා ඉතා අල්පයි. නමුත් මාගේ පාලන කාලය තුළ ඒ සඳහා ඉඩකඩ සලසා දීමට හැකි වුණා. 2012 සහ 2013 යන වර්ෂ දෙක තුළ පමණක් නිලධාරීන් 300 කට වැඩි සංඛ්‍යාවක් විදේශීය රටවලට යවා පුහුණුවීම් කර ඔවුන්ගේ දැනුම වැඩි කර ගැනීමට ඉඩ ප්‍රස්ථාව සලසා දී තිබෙනවා.

ගරු සභාපතිතුමනි, අප පළාත් සභාව සතුව පුහුණු මධ්‍යස්ථාන පැවතියත් නේවාසික පුහුණු මධ්‍යස්ථානයක් නොපැවතීම විශාල අඩුවක්ව පැවතුණා. මෙම අඩුව සම්පූර්ණ කරමින් අංග සම්පූර්ණ නේවාසික පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකිරීම මෙම වර්ෂය තුළ ආරම්භ

කර තිබෙනවා. එහි ඇස්තමේන්තු මුදල රුපියල් මිලියන 1,000 ක් පමණ වන අතර වර්ෂ දෙකක් තුළ මෙහි වැඩ කටයුතු සම්පූර්ණයෙන් අවසන් කිරීම අපේ බලාපොරොත්තුවයි. මේ සඳහා ලබන වර්ෂයට අවශ්‍ය මුදල වන රුපියල් මිලියන 400 ක් මෙම මුදල් ප්‍රකාශයෙන් වෙන් කරනවා.

**තොරතුරු තාක්ෂණය**
INFORMATION TECHNOLOGY

ගරු සභාපතිතුමනි, වර්තමාන ලෝකයේ සංවර්ධනයේ නියමුවා තොරතුරු තාක්ෂණයයි. මේ නිසා තොරතුරු තාක්ෂණය සම්බන්ධයෙන් අප දක්වන උනන්දුව මීට වඩා වැඩි දියුණු කර ගත යුතු අතර එමඟින් අපට කාලය සහ මුදල් ඉතිරි කර ගන්න පුළුවන්. සියලු කාර්යයන් පරිගණක වැඩ සටහන් මඟින් කරන්නා සේ ම ඒවා ජාලගත කිරීම ඉතා වැදගත්. තොරතුරු තිබුණත් ඒවා සියලු දෙනා අතර ගලා යන්නේ නැත්නම්, එම තොරතුරුවල ඵලදායීතාවයක් නැහැ. අපගේ තොරතුරු තාක්ෂණ සංවර්ධන මධ්‍යස්ථානය සමඟ එක්ව ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් පළාතේ සියලු කාර්යාල අතර තොරතුරු ජාලගත කිරීමේ වැඩ සටහනක් දැනට සකසමින් පවතිනවා. එය ඉතා කෙටි කාලයක් තුළ අවසන් කර එම තොරතුරු අපගේ සියලු කාර්යයන් සඳහා ඵලදායීව යොදවා ගැනීම අපේ ඉලක්කයයි.

**කාර්යාල සඳහා යටිතල පහසුකම්**
INFRASTRUCTURE FACILITIES TO OFFICES

ගරු සභාපතිතුමනි, පසුගිය වර්ෂ ගණනාවක් තුළම නොයෙක් ගැටළු හේතුවෙන් කාර්යාලවලට නව වාහන ලබා දීමේ හැකියාවක් තිබුණේ නැහැ. සමහර කාර්යාලවල නිලධාරින් ප්‍රවාහන පහසුකම් නොමැතිව දැඩි දුෂ්කරතාවයන්ට මුහුණ දුන්නා. සංවර්ධන කටයුතුවලට ද එය බාධාවක් වුණා. මෙම තත්ත්වයට විසඳුමක් ලෙස වාහන 60 ක් මිල දී ගෙන එම කාර්යාලවලට ලබා දුන්නා. විශේෂයෙන් සෑම කලාප කාර්යාලයකටත්, සෑම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයකටත් ඩබල් කැබ් රථය බැගින් ලබා දීමට හැකි වුණා. පළාත් පාලන ආයතනවලට ද ප්‍රමාණවත් වාහන නොතිබීම, එහි ප්‍රධානීන්ගෙන් නිරන්තරයෙන්ම මා වෙත යොමු වූ කාරණයක්. එම නිසා භාණ්ඩාගාරයෙන් විශේෂ අනුමැතියක් ලබා ගෙන සෑම පළාත් පාලන ආයතනයකටම එක් රථය බැගින් ඩබල් කැබ් රථ 47 ක් ලබා දීමට කටයුතු කළා. මෙම සියලු රථ වෙනුවෙන් තීරු බදු රහිතව රුපියල් මිලියන 371 ක් වැය වූ අතර ඒවායේ වෙළඳ වටිනාකම රුපියල් මිලියන 861 ක් පමණ වෙනවා.

**දරුවන්ට විශ්ව දැනුම**
UNIVERSAL KNOWLEDGE TO CHILDREN

ගරු සභාපතිතුමනි, "නිදහස් අධ්‍යාපනය සඳහා අපේ දරුවන්ට ඇති අයිතිය කිසිසේත් අහෝසි නොකරමි" යන මහින්ද චින්තනයට අනුගත වෙමින් අප පළාතේ අධ්‍යාපන ප්‍රතිපත්තිය සකසා තිබෙනවා. විනය ගරුක සමාජයක, සාමකාමීව ජීවත් වීමට පුද්ගලයෙකුට අවශ්‍ය හැකියාවද, සිතුම් පැතුම් ප්‍රවර්ධනය කිරීම ද එමගින් බලාපොරොත්තු වෙනවා. ලෝකයේ සියලු රටවල් අතර අධ්‍යාපනයේ ගුණාත්මකත්වය අතින් ශ්‍රී ලංකාව 44 වන ස්ථානයට පත්ව ඇත. විද්‍යා සහ ගණිතය විෂයයන්ට අදාළව අධ්‍යාපනයේ ගුණාත්මක බව අතින් ශ්‍රී ලංකාව පිළිවෙළින් 41 හා 42 වන ස්ථානයේ පසු වෙනවා. ශ්‍රී ලංකාව මෙම තත්ත්වයට ගෙන ඒමට අපගේ රජය විශාල කැප කිරීමකින් කටයුතු කළ බව මාගේ විශ්වාසයයි.

මා බස්නාහිර පළාතේ අධ්‍යාපන අමාත්‍ය ධුරයේ වගකීම භාර ගත් 2009 වර්ෂයේ සිට මේ දක්වා කාලය තුළ උපාධිධාරි ගුරු පත්වීම් 7,795ක් ලබා දෙමින් පළාතේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ පැවති මානව සම්පත් ඌණතාවය අවසන් කළ බව සඳහන් කරනුයේ ඉමහත් සතුටින්. මෙම පත්වීම් ලබා දීමත් සමඟ 2011 වර්ෂයේ පළාතේ ලියාපදිංචි වූ උපාධිධාරීන්ගෙන් 3,200 කට පමණ රැකියා ලැබී තිබෙනවා. අප පළාතේ සාක්ෂරතාවය සියයට 96 ක මට්ටමක් දක්වා ගෙන ඒමට මෙය සෘජුවම දායක වුවා යැයි මාගේ විශ්වාසයයි. මෙයට අමතරව කළ යුතු අනෙකුත් කාර්යයන්ද හඳුනාගෙන පසුගිය අයවැය කථාවේදී මා සඳහන් කළ පරිදි 2016 දී සාක්ෂරතා අනුපාතය සියයට සියය දක්වා වර්ධනය කිරීමේ ඉලක්කයට අප ළඟා වෙනවා. ඒ සඳහා ඉදිරියේදී ඇති වන පුරප්පාඩු ද හඳුනාගෙන ඉදිරි වර්ෂ දෙක තුළ ලියාපදිංචි වී ඇති උපාධිධාරීන් 1,400 කට රැකියා ලබා දීම අපේ බලාපොරොත්තුවයි. එසේම 2009 වර්ෂයේ සිට මේ දක්වා අධ්‍යාපනය වෙනුවෙන් රුපියල් මිලියන 74,700 ක් පමණ ආයෝජනය කර තිබෙනවා. ඉන් සෘජු ප්‍රාග්ධන ආයෝජන පමණක්

රුපියල් මිලියන 4,630 ක් පසුගිය වර්ෂ 5 හි අධ්‍යාපනයේ ගුණාත්මක බව වැඩි කිරීමට මෙම ආයෝජනයන් හේතු වී තිබෙනවා.

ගරු සභාපතිතුමනි, සියලු දරුවන්ට විශ්ව විද්‍යාලවලට ඇතුළත් විය නොහැකි වුවත් අ.පො.ස.(සාමාන්‍ය පෙළ) සහ උසස් පෙළ සාර්ථක ලෙස සමත් විය යුතු බව මාගේ විශ්වාසයයි. ඉතා ඉක්මනින් අප එම තත්ත්වයට ළඟා විය යුතුයි. 2009 වර්ෂයේ සියයට 61 ක්ව තිබූ සාමාන්‍ය පෙළ විභාගය සමත් වී උසස් පෙළ විභාගය හැදෑරීම සඳහා සුදුසුකම් ලැබීමේ ප්‍රතිශතය 2012 වන විට සියයට 69 දක්වා වර්ධනය වී තිබෙනවා. වසර 2016 වන විට එය සියයට 74 දක්වා වර්ධනය කර ගැනීම අපගේ ඉලක්කයයි. දැනට සියයට 58 ක් වූ උසස් පෙළ සමත්වීමේ ප්‍රතිශතය වසර 2016 දී සියයට 65 දක්වා වැඩි කර ගත යුතුයි. මෙම ඉලක්ක දෙක ළඟා කර ගැනීමට අවශ්‍ය සියලු කාර්යයන් සිදු කරන ලෙස මාගේ නිලධාරින්ට මා උපදෙස් දී තිබෙනවා.

2011 වර්ෂයේදී සිදු කරන ලද "අපේ පාසල අපේ දෑතින් සුරකිමු" වැඩ සටහනට ගරු මන්ත්‍රීතුමන්ලාගේ විශාල ප්‍රසාදයක් හිමි වී තිබෙන බව මා දන්නවා. 2011 සහ 2012 යන වර්ෂ දෙක තුළදී රුපියල් මිලියන 190 ක් වැය කර සියලු පාසල්වල වර්ණාලේප කිරීම්, කඩතොළු පිළියම් කිරීම්, පදික වේදිකා සහ කාණු පිළිසකර කිරීම, වැටවල් සහ තාප්ප ප්‍රතිසංස්කරණය ආදී වැඩ කර තිබෙනවා. මෙම වර්ෂය තුළ රුපියල් මිලියන 90 ක් වෙන් කර නැවත වරක් පාසල් සියල්ලගේම මෙම වැඩ සටහන ක්‍රියාත්මක කරන අතර 2014 වර්ෂයේදී රුපියල් මිලියන 100 ක් වෙන් කිරීමට බලාපොරොත්තු වෙනවා.

සිසුන් 50 ට අඩු පාසල් 91 ක් අප පළාතේ තිබෙනවා. එය ධනාත්මක තත්ත්වයට පත් කරමින් 2016 වසර වන විට එම පාසල් සංඛ්‍යාව 17 ක් දක්වා අඩු කර ගත යුතුයි. මේ සඳහා මානව සම්පත් අවශ්‍යතාව සපුරමින් පාසල්වල ගුරු සිසු අනුපාතය ක්‍රමවත් කළ යුතුයි. මෙම පාසල්වල තොරතුරු තාක්‍ෂණය හා භෞතික පහසුකම් වැඩි දියුණු කර ආකර්ෂණීය පාසල් බවට පත් කිරීම සඳහා රුපියල් මිලියන 69 ක් වෙන් කර තිබෙනවා.

වර්තමානයේ දරුවන් ඒකාකාරී රටාවකට හුරු වෙලා. එය නිවැරදි කර අභියෝගවලට මුහුණ දිය හැකි දරුවන් බිහි කළ යුතුයි. ඒ සඳහා ගුරුවරයා දරුවාව මනෝ විද්‍යාත්මකව හඳුනා ගත යුතු වෙනවා. එසේ හඳුනා ගැනීමට නම් නිරන්තර ගුරු පුහුණුව සහ සංවර්ධනය ඉතා අත්‍යවශ්‍ය කරුණක් සේ මා දකිනවා. 2013 වර්ෂයේ අයවැය කථාව ඉදිරිපත් කරමින් අතිගරු ජනාධිපතිතුමා රුපියල් මිලියන 900 ක් ගුරු පුහුණුව හා සංවර්ධන කටයුතු සඳහා වෙන් කළා. ඉන් රුපියල් මිලියන 185ක් අප පළාතට වෙන් වී ඇති අතර දැනටමත් රුපියල් මිලියන 100 ක් ලැබී තිබෙනවා. මෙම ප්‍රතිපාදන පාදක කර ගනිමින් කලාප මට්ටමින් මධ්‍යස්ථාන රාශියක පැය 300 ක කාලයක් ආවරණය වන පරිදි දින 38 ක් පුරා මෙම පුහුණු වැඩමුළු ක්‍රියාත්මක කරනවා.

*ගරු සභාපතිතුමනි, මේ වැඩමුළුව ආරම්භ කරන කොට නොයෙකුත් අභියෝගවලට අපට මුහුණ දෙන්නට සිදු වුණා. මම පසුගිය සතියේ ගුරුවරුන්ගේ පුහුණුවීම් අවසන් වන වැඩ සටහනකට ගියා. එහිදී ඇති වුණු ප්‍රතිචාරය ගුරුවරුන්ගේ සටහන් පිළිබඳව දැක්කාම මම හිතන්නේ,මේ තත්ත්වය ගුරුවරු අවබෝධ කර ගෙන එදා අපට විරුද්ධව ගෙන ගිය ප්‍රචාර පරාජයට පත් වෙලා, ගුරුවරුන්ට හොඳ දැනුමක් ලබා ගැනීමට හැකි වී තිබෙන බව මා මේ අවස්ථාවේ දී මතක් කරන්න ඕනෑ.*

වර්තමානයේදී ලෝකය විශ්ව ගම්මානයක්. එහි දොරටුව අපේ දරුවන්ටද විවෘත කර දීමට නම්, ගණිතය, විද්‍යාව සහ ඉංග්‍රීසි යන හර විෂයයන්ගෙන් ඔවුන්ව පෝෂණය කළ යුතුයි. විශේෂයෙන් පුහුණු කරන ලද ගුරුවරුන් යටතේ විෂයය ප්‍රායෝගිකව අධ්‍යයනය කළ හැකි පරිදි ගණිතාගාර 89 ක් ආරම්භ කර ඒ සඳහා පහසුකම් සලසා දී තිබෙනවා. මෙම වර්ෂයේද තවත් ගණිතාගාර 30 ක් ආරම්භ කිරීමට පියවර ගෙන ඇති අතර 2014 වර්ෂයේදී මේ සඳහා ප්‍රතිපාදන සැලසීමට බලාපොරොත්තු වෙනවා.

ද්විතීයික පාසල් 1,000 සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පළාතේ පාසැල් 134 ක් තෝරා ගෙන ඇති බව අප කවුරුත් දන්නවා. 2014 වසර අවසන් වන විට මෙම පාසල්වල "මහින්දෝදය තාක්ෂණ විද්‍යාගාර" සෑදීමට දැනටමත් සැලසුම් කර ඇත. මෙම වර්ෂයේදී රුපියල් මිලියන 546 ක් වැය කරමින් පාසැල් 65 ක තාක්‍ෂණ විද්‍යාගාර ඉදි කරන

අතර ඉන් විද්‍යාගාර 15 කට පරිගණක 670 ක් මෙම වර්ෂය තුළ ලබා දෙනවා. 2014 වර්ෂයේදී ඉතිරි පාසල් 69 හි විද්‍යාගාර තනා අවසන් කිරීම අපේ ඉලක්කයයි.

ගරු සභාපතිතුමනි, පහ වසර ශිෂ්‍යත්ව විභාගයෙන් දිවයිනෙන්ම වැඩිම ලකුණු ලැබූ දරුවන් විසි දෙනා ගෙන් දහ හතර දෙනෙක්ම අප පළාතේ දරුවන්. ඒ අයට ලැප්ටොප් පරිගණකය බැගින් ලබා දීමටත්, පළාතේ පළමු ස්ථානය ලබා ගත් ශිෂ්‍යයාට රු 100,000 කුත් තවත් දරුවන් තිදෙනෙකුට රු 50,000 බැගින් ලබා දීමටත් අප තීරණය කළා. දරුවන් දිරිමත් කිරීමත්, කුඩා කළ සිට නවීන තාක්‍ෂණයට ඔවුන් යොමු කිරීමත් මෙම කාර්යයේ මූලික අරමුණයි.

ගරු සභාපතිතුමනි, පළාතේ මහජන ගැටළු අතුරින් විශාල ප්‍රමාණයක් අධ්‍යාපනයට අදාළව පවතිනවා. එම ගැටළුවලට කන් දීම සහ ඒවාට විසඳුම් ලබා දීම ඉතා වැදගත් කරුණක් සේ මා දකිනවා. සෑම බදාදා දිනකම පවත්වනු ලබන "මහජන දින වැඩ සටහන" සම්පූර්ණයෙන්ම පරිගණක තාක්‍ෂණය යොදා ගනිමින් විධිමත් කර ඇත. මෙමගින් ජනතාව ඉදිරිපත් කරන ගැටළු සඳහා කඩිනම් විසඳුම් ලබා දීම මාගේ අරමුණයි. මෙම වසරේ මාර්තු මස සිට සැප්තැම්බර් දක්වා වූ මාස 6ක කාලය තුළ ගැටළු 3,816 ක් මහජන දින වැඩ සටහනට ඉදිරිපත් වූ අතර ඉන් සියයට 80 ට වැඩි සංඛ්‍යාවකට සාර්ථක විසඳුම් ලබා දීමට හැකි වුණා. මෙම ක්‍රමය ලබන වර්ෂය තුළ සියලු පළාත් අමාත්‍යාංශවල ක්‍රියාත්මක කරවීමට මා බලාපොරොත්තු වෙනවා.

බස්නාහිර පළාතේ පාසල්වල සේවයේ නියුතු විදුහල්පතිවරුන්ගේ, ගුරුභවතුන්ගේ සුභසාධක කටයුතු සහ ආධ්‍යාත්මික සංවර්ධනය ගැන දැනට වඩා අවධානය යොමු කළ යුතු යැයි මා සිතනවා. ඔවුන්ගේ සේවා ඇගයීම් කළ යුතුයි. එම පරමාර්ථයෙන් 2013 වර්ෂයේ සිට "සුපසන් ගුරු පවුර" වැඩ සටහන ක්‍රියාත්මක කර ඇත. 2013 වර්ෂයේ දෙසැම්බර් මස සිට පියවරයන් 15 ක් ඔස්සේ මෙම වැඩ සටහන ක්‍රියාත්මක කරන අතර මේ යටතේ තෝරා ගත් විදුහල්පතිවරුන්ට සහ ගුරුභවතුන්ට විදේශීය රටවලදී පුහුණුවීම් සඳහා ශිෂ්‍යත්ව ලබා දීමට මා බලාපොරොත්තු වෙනවා. දැනටමත් ඒ වෙනුවෙන් රටවල් කිහිපයක් තෝරා ගෙන තිබෙනවා.

ඉහත දැක්වූ සියලු කාර්යයන් වෙනුවෙන් 2013 වර්ෂයේදී රුපියල් මිලියන 16,690 ක් වෙන් කර තිබෙන අතර 2014 වර්ෂයේදී රුපියල් මිලියන 17,936 ක ප්‍රතිපාදන මෙම මුදල් ප්‍රකාශයෙන් සලසා දීමට මා යෝජනා කරනවා. එය 2013 වර්ෂයට වෙන් කළ මුදලට වඩා සියයට 7.46 ක වැඩි වීමක් වන අතර 2014 වර්ෂයේ පළාත් සභාවේ සමස්ථ වියදමින් සියයට 41.04 ක් වෙනවා.

අප පළාත් සභාව විශාල මුදලක් පළාතේ අධ්‍යාපනය වෙනුවෙන් වියදම් කරන විට රජය ද විශාල මුදලක් අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කරනවා. රජය, පළාත් සභා සහ පෞද්ගලික අංශය මෙලෙස වර්ෂයක අධ්‍යාපනය වෙනුවෙන් රුපියල් බිලියන 300 ක් පමණ වියදම් කරනවා. මෙය දළ ජාතික නිෂ්පාදනයෙන් සියයට 4.7 ක්. රටක අනාගතය දරු පරපුරයි. එම නිසා මෙම වියදම් අනාගත ආයෝජන වියදම් වශයෙන් මා සලකනවා.

අප පළාතේ විශේෂ අධ්‍යාපනය ලබන දරුවන් 2,167 ක් පමණ සිටිනවා. එම දරුවන් කෙරෙහි අපගේ විශේෂ අවධානය යොමු කළ යුතුයි. අනෙකුත් දරුවන්ට වඩා එම දරුවන් කෙරෙහි විශේෂ දයාවක්, කරුණාවක් සහ ආදරයක් අප දැක්විය යුතුයි. එසේම මව සහ පියා යන දෙදෙනාම හෝ ඉන් එක් අයෙකු නොමැති පාසල් යන දරුවන් 3,199 ක් පමණ අප පළාතේ සිටිනවා. එවැනි දරුවකු කොපමණ අසරණ ද, ඔවුන් කොපමණ මානසික පීඩාවන්ට ලක්වනවා ද යන්න මා අමුතුවෙන් කිව යුතු නැහැ. එහෙයින් විශේෂ අධ්‍යාපනය ලබන දිළිඳු පවුල්වල, එවැනි දරුවකුට රුපියල් 500 ක මාසික ආධාර මුදලක් 2014 වර්ෂයේ සිට ලබා දීමට මා යෝජනා කරනවා.

**සරුදම් අරුණැල්ල වැඩ සටහන**
SARUDAM ARUNELLA PROGRAMME

පසුගිය වර්ෂය තුළ සරුදම් අරුණැල්ල වැඩ සටහන යටතේ දහම් පාසල් 2,016 ක් සඳහා රුපියල් ලක්‍ෂය බැගින් ලබා දුන්නා. මෙම වැඩ සටහන ක්‍රියාත්මක වන විට ඒ සඳහා ලැබූ ජනතා ප්‍රසාදය කොතරම්ද යන්න ගරු මන්ත්‍රීතුමන්ලා දන්නවා. සමහර දහම් පාසැල්වලට අපි රුපියල් ලක්‍ෂයක් දෙන විට තවත් රුපියල් ලක්‍ෂ තුනක්, හතරක් සොයා ගෙන නොයෙක් ව්‍යාපෘති ක්‍රියාත්මක කළා. ඒ මගින් දහම් පාසල්වල පැවති නොයෙක් අඩුපාඩු සම්පූර්ණ කර ගැනීමට

හැකි වුණා. මෙම වැඩසටහන තවදුරටත් ක්‍රියාත්මක කරන ලෙස පළාතේ ගරුතර ස්වාමීන්වහන්සේලා, පූජකතුමන්ලා දිගින් දිගටම මගෙන් ඉල්ලීම් කරනවා. පවතින ප්‍රතිපාදන සැලකිල්ලට ගෙන ඉදිරි වර්ෂය තුළද මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට මා බලාපොරොත්තු වෙනවා.

## පළාත් පාලන කටයුතු
LOCAL GOVERNMENT

ගරු සභාපතිතුමනි, මහජනතාවට ඉතාමත් සමීපතම සහ පැරණිම පරිපාලන ආයතනය පළාත් පාලන ආයතනයි. කිසිවෙකුගේ අවධානයට, ඇගයීමට ලක් නොවුණද පළාත් පාලන ආයතනවලින් ජනතාවට සිදුවන සේවය ඉතා විශිෂ්ටයි. එක් දිනක් හෝ මෙම ආයතනයක් අක්‍රීය වුවහොත් එය විශාල වශයෙන් ජනතාවට දැනෙනවා. සිය ප්‍රජාවට සේවාවන් සැපයීම සඳහා අවශ්‍ය වන්නා වූ ආදායම් උපයා ගැනීමට මෙම ආයතනවලට ඉමහත් හැකියාවක් ඇත. ඒ සඳහා අප උදව් කළ යුතුයි. පළාතේ පවතින පළාත් පාලන ආයතන 48 න් වර්ෂයක් තුළ එකතු කර ගත යුතු බදු සහ ගාස්තු ආදායම රුපියල් මිලියන 4,600 ක් පමණ වුවත් ඉන් සියයට 68 කට වඩා එම වර්ෂය තුළ එකතු වන්නේ නැහැ. මෙම හේතුවෙන් වැටුප් ගෙවීම ඇතුළු නඩත්තු කටයුතු සඳහා රුපියල් මිලියන 5,000 කට වඩා වැඩි මුදලක් වාර්ෂිකව පළාත් පාලන ආයතන වෙත ලබා දීමට සිදු වී ඇත. ලැබිය යුතු බදු සහ ගාස්තු නිසි පරිදි එකතු කර ගැනීම සඳහා ඔවුන් වෙත තාක්ෂණික දැනුම සහ පහසුකම් ලබා දිය යුතු යැයි මා විශ්වාස කරනවා. මේ සඳහා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයද එක්ව අවශ්‍ය කටයුතු කිරීමට දැනටමත් සැලසුම් කර ඇත.

වර්ෂයකට රුපියල් මිලියන 10 ට වඩා අඩු ආදායම් ලබන පළාත් පාලන ආයතන 5 ක් අප පළාතේ තිබෙනවා. ආදායම් අඩු නිසා එම ප්‍රදේශයේ ජනතාව බලාපොරොත්තු වන නිසි සේවය සැපයීමට එම ආයතන අපොහොසත් වී තිබෙනවා. එම නිසා විශේෂයෙන් එම පළාත් පාලන ආයතනවලට මුදල් ලබා දීමට වැඩ පිළිවෙළක් ලබන වර්ෂය තුළ යෙදවීමට මා බලාපොරොත්තු වෙනවා. එම පළාත්වල සති පොළවල්, මාතෘ සායන, කුඩා බෙහෙත් ශාලා සහ ත්‍රී රෝද රථ ගාල් වැනි ස්ථානවල පහසුකම් වැඩි දියුණු කළ යුතුයි.

වර්තමානයේ සිය බල ප්‍රදේශයේ කසළ අපහරණය නාගරික පළාත් පාලන ආයතනවලට ප්‍රබල ගැටළුවක් වී තිබෙන අතර ඒ සඳහා විශාල මුදලක් ඔවුන්ට වියදම් කිරීමට සිදු වී තිබෙනවා. මෙම කාර්යය එම ආයතනවලට කිසිසේත්ම තනිව කර ගත නොහැකි බව මා දන්නවා. ඒ සඳහා අප සහාය දිය යුතුයි. ඒ වෙනුවෙන් මෙම මුදල් ප්‍රකාශයෙන් මුදල් වෙන් කිරීමට සැලසුම් කර ඇත.

පළාත් පාලන ආයතන 12 ක අඩක් නිම කළ ආදාහනාගාර පැවති අතර එම ආයතනවලට මුදල් නොමැතිකමින් ඒවා අතරමග නැවතී තිබුණා. භාණ්ඩාගාරය සමග සාකච්ඡා කර රුපියල් මිලියන 67 ක් ලබාගත් අතර මෙම වර්ෂය අවසන් වීමට පෙර ඒවා සියල්ලගේ වැඩ අවසන් කිරීම අපේ ඉලක්කයයි.

## සම්පතක් වන අපද්‍රව්‍ය
WASTE AS A RESOURCE

ගරු සභාපතිතුමනි, අපද්‍රව්‍ය බැහැර කිරීමේ කාර්යය ඍජුවම පළාත් පාලන ආයතනවල කාර්යභාරයක් වුවද, පළාත් සභාවට ද ඒ සම්බන්ධ වගකීමක් පවතිනවා. වර්තමානයේදී අපද්‍රව්‍ය කරදරකාරි දෙයක් යැයි සැලකීම නිවැරදි යැයි මා දකින්නේ නැහැ. අපද්‍රව්‍ය යනු සම්පතක්. එම සම්පත නිසි පරිදි කළමනාකරණය කළහොත් විදේශ විනිමය පවා උපයා ගන්න පුළුවන්. අපද්‍රව්‍යවලින් විදුලිය නිපදවා ගැනීමට, කොම්පෝස්ට් නිපදවා ගැනීමට, ජීව වායුව නිපදවා ගැනීමට හැකි නම් එය සම්පතක් නොවන්නේ කෙසේද යන්න අප තීරණය කළ යුතුයි. මේ සඳහා වඩාත් වැදගත් වන්නේ කසළ කළමනාකරණයයි. කසළ වෙන් කිරීම, නැවත භාවිතයට ගැනීම සහ ප්‍රතිචක්‍රීකරණය මෙහිදී ඉතා වැදගත් මේ සම්බන්ධයෙන් ප්‍රජාව දැනුවත් කර ඔවුන්ගේ දායකත්වය ලබා ගත යුතුයි. එකී කාර්යය පාසල් ළමුන්ගෙන් ආරම්භ කළ යුතු යැයි මා අදහස් කරනවා.

"පිවිතුරු පුර" වැඩ සටහන මගින් ප්‍රජාව විශේෂයෙන් පාසල් ළමුන් දැනුවත් කිරීමට බලාපොරොත්තු වෙනවා. මෙම කාර්යය ද ඇතුළුව අපද්‍රව්‍ය වර්ග කිරීම, එකතු කිරීම සහ අපද්‍රව්‍ය ප්‍රවාහනය වැඩිදියුණු කිරීම යන කාර්යයන් සඳහා 2013 වර්ෂයේ රුපියල් මිලියන 125 ක් වෙන් කර ඇති අතර 2014 වර්ෂයේ රුපියල් මිලියන 228 ක් වෙන් කිරීමට සැලසුම් කර තිබෙනවා.

කොම්පෝස්ට් නිපදවීම ගෘහස්ථ සහ පළාත් පාලන ආයතන මට්ටමින් කරන්න පුළුවන්. දැනට පළාත් පාලන

ආයතන 24 ක් කොම්පෝස්ට් මෙට්‍රික් ටොන් 10,950 ක් වර්ෂයකට නිෂ්පාදනය කරනවා. එමඟින් එම ආයතන වර්ෂයකට රුපියල් මිලියන 87 ක ආදායමක් උපයනවා. ඉදිරි වර්ෂ දෙක තුළ කොම්පෝස්ට් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 18,250 දක්වා වර්ධනය කිරීම අපේ ඉලක්කයයි. එමඟින් රුපියල් මිලියන 146 ක පමණ ආදායමක් ඉපයීම අපේ අරමුණයි.

වර්තමානයේ ගෘහස්ථ කොම්පෝස්ට් සෑදීම සියයට 6 ක් පමණ වන අතර වසර 2016 වන විට එය සියයට 15 දක්වා වැඩි කළ යුතුයි. දැනට රුපියල් මිලියන 200 ක් වියදම් කර කොම්පෝස්ට් නිපදවීමේ නිෂ්පාදනාගාරයක් කරදියාන ව්‍යාපෘතියේ ඉදිවෙමින් පවතින අතර මෙම වර්ෂය අවසන් වීමට පෙර එහි කොම්පෝස්ට් නිපදවීමේ කටයුතු ආරම්භ කරනවා. එමඟින් දිනකට කසළ ටොන් 50 ක් කොම්පෝස්ට් සඳහා යෙදවීමටත් කොම්පෝස්ට් මෙට්ට්‍රික් ටොන් 12 ක පමණ නිමවුමක් ලබා ගැනීමටත් බලාපොරොත්තු වෙනවා.

### විදුලිබල හා බලශක්ති කටයුතු
ELECTRICITY AND POWER

ගරු සභාපතිතුමනි, විදුලිබල හා බලශක්ති ක්ෂේත්‍රයේ විශාල පිබිදීමක් ඇති වීමට බලපෑ ප්‍රධානම හේතුව වූයේ ජල විදුලිබලාගාර ඉදි කිරීමයි. ඒ අනුව ජලාශ ආශ්‍රිතව ඉදි වූ විදුලි බලාගාර මඟින් සමස්ථ ශ්‍රී ලංකාවටම විදුලිය සපයා දීමේ හැකියාවක් ලැබී ඇති අතර අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පයක් වන "විදුලමු ශ්‍රී ලංකා" වැඩ සටහන මේ වන විට පොදුවේ සැමට විදුලිබල පහසුකම් සපයනු ලබන ජාතික මෙහෙවරක් බවට පත්ව තිබෙනවා.

2014 වර්ෂයේදී විකල්ප බලශක්ති ප්‍රභවයන් හඳුනා ගැනීම හා වැඩිදියුණු කිරීම, බලශක්ති තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම, පාසල්වලට ජීව වායු ඒකක හඳුන්වාදීම සහ බලශක්ති ඉතිරි කිරීමේ උපකරණ හඳුන්වා දීම වැනි වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 13 ක් වෙන් කිරීමට සැලසුම් කර ඇත. විදුලිය අරපිරිමැස්මෙන් භාවිතා කිරීම සහ සංරක්ෂණය කිරීමට පළාත් සභා මට්ටමින් සුදුසු ක්‍රියා මාර්ග ගත යුතුයි. විදුලි බල හා බලශක්ති විෂයය සම්බන්ධයෙන් ප්‍රඥප්තියක් සම්පාදනය කොට බලාත්මක කිරීම මඟින් බලශක්ති සංරක්ෂණය සහ සංවර්ධනය වෙනුවෙන් මධ්‍යම රජය ගෙන යන වැඩ පිළිවෙළට පළාත් මට්ටමින් ද ඵලදායි දායකත්වයක් ලබා දීමට අපේක්ෂා කරනවා.

ගරු සභාපතිතුමනි, පළාත් සභාවේ ආයතනවලට ආරක්ෂක සේවා ලබා ගැනීම සඳහා මසකට ලක්ෂ 100 කට ආසන්න මුදලක් පසුගිය කාලයේ වියදම් කරනු ලැබුවා. නමුත් ලැබූ සේවයේ ගුණාත්මකභාවය හොඳ තත්ත්වයක තිබුණේ නැහැ. "වෙස්ප්‍රෝ ආරක්ෂක සේවය" ආරම්භ කිරීමත් සමග එම තත්ත්වය වෙනස් වුණා. සේවකයන් 460 දෙනෙකුට ස්ථිර රැකියා සපයමින් ගුණාත්මක සේවයක් ලබා දීමට එම ආයතනය සමත් වී තිබෙනවා. එපමණක් නොවෙයි. එම ආයතනය පසුගිය වර්ෂයේ රුපියල් මිලියන 12 ක ලාභයක් ද උපයා තිබෙනවා. එහෙයින් අපගේ සේවාවන් මෙවැනි ආයතන මගින් ලබා ගැනීම සුදුසු යැයි මා අදහස් කරනවා.

### සෞඛ්‍ය සම්පන්න දිවිපෙවෙතක්
HEALTHY LIFESTYLE

ගරු සභාපතිතුමනි, ශ්‍රී ලංකාව, සෞඛ්‍ය සේවා පහසුකම් ලබා දීම අතින් ප්‍රශංසනීය ප්‍රගතියක් අත්කර ගෙන තිබෙන අතර එය ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමට ලක් වී තිබෙනවා. ලෝකයේ පවතින රටවල් 206 න් නිදහස් සෞඛ්‍ය සේවය පවතින රටවල් 11 න් එක් රටක් අපගේ රට වීම පිළිබඳව අප ආඩම්බර විය යුතුයි. නිදහස් සෞඛ්‍ය සේවය සුරැකීම සෞඛ්‍ය පිළිබඳ මහින්ද චින්තනයේ මූලික පදනම වන අතර එය රජයේ වගකීමක් ද වෙනවා. පළාතේ එය සුරැකීම මාගේ වගකීමක් සේ සලකනවා. එම අරමුණින් නිදහස් සෞඛ්‍ය සේවය වෙනුවෙන් රුපියල් මිලියන 7,823 ක් 2014 වර්ෂයේ වෙන් කර තිබෙනවා. එය 2013 වර්ෂයේ වෙන් කළ මුදලට වඩා සියයට 17.68 ක වැඩිවීමක්.

කොළඹ නගරයට කේන්ද්‍රගතව තිබූ දියුණු සෞඛ්‍ය සේවය පසුගිය වර්ෂ කිහිපය තුළ ගම්පහ, මීගමුව, කළුතර, පානදුර, හොරණ සහ අවිස්සාවේල්ල යන ප්‍රදේශවලට ව්‍යාප්ත වී තිබෙනවා. එහි ප්‍රතිඵලයක් වශයෙන් වෙන පළාත්වල ජනතාවට ද අපට සෞඛ්‍ය සේවය සැපයීමට සිදු වී තිබෙන අතර, ඒ සඳහා අපගේ මුදල් වෙන් කිරීමට සිදු වී ඇත. වර්ෂ කිහිපයක් තුළ ඉහත නගරවල පැවති සෑම රෝහලක්ම අංග සම්පූර්ණ රෝහල් බවට පත්කර තිබීම එයට හේතුවයි. පානදුර රෝහලට පමණක් පසුගිය වර්ෂ දෙක තුළ රුපියල් මිලියන 145 ක මුදලක් වියදම් කර පහසුකම් සලසා දී ඇත.

පසුගිය වර්ෂ දෙක තුළ අයවැය යෝජනා මගින් ගිලන් රථ මිලදී ගැනීමට මා මුදල් වෙන් කරනු ලැබුවා. රජයේ ද සහාය ඇතිව ගිලන් රථ 40 ක් එම වර්ෂ දෙක තුළ මිලදී ගත්තා. දැනට අප අනුගමනය කරන ශල්‍යකර්ම කිරීමේ ක්‍රමයන්ට වඩා දියුණු වූ ක්‍රම ලෝකයේ පවතිනවා. ඒවා අප ද අනුගමනය කළ යුතු යැයි මාගේ විශ්වාසයයි. අපගේ වෛද්‍යවරු ඒ සඳහා පුහුණුව ලබා තිබෙනවා. එහෙයින් දියුණු ශල්‍යකර්ම කිරීමේ යන්ත්‍ර මිලදී ගැනීම සඳහා රුපියල් මිලියන 50 ක් මෙම අයවැයෙන් වෙන් කිරීමට මා යෝජනා කරනවා.

සෞඛ්‍ය සේවය දියුණු වුවත් අප හඳුනාගත් මූලික ගැටළුවක් තිබෙනවා. රෝගීන් ප්‍රාථමික සෞඛ්‍ය සේවා සපයන්නන්ගෙන් සේවය ලබා නොගෙන උසස් මට්ටමේ රෝහල්වලින් සහ පෞද්ගලික විශේෂඥ වෛද්‍යවරුන්ගෙන් සේවා ලබා ගැනීම එම තත්ත්වයයි. සෞඛ්‍ය සේවය සඳහා දරන වියදම ඉහළ යෑමට එය හේතු වෙලා තියෙනවා. මෙයට පිළියමක් වශයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය "සෑමට සාධාරණ ප්‍රවේශයක් ඇති කිරීමේ සැලැස්මක්" සකසා ඇත. ඒ යටතේ සෑම ප්‍රාදේශීය රෝහලකම මූලික ප්‍රතිකාර ඒකක - Primary Care Unit සහ හදිසි ප්‍රතිකාර ඒකක - Emergency Treatment Unit ආරම්භ කිරීමට දැනටමත් කටයුතු කර තිබෙනවා.

## දේශීය වෛද්‍ය සේවය
INDIGENOUS MEDICINE

දියවැඩියාව, අධිරුධිර පීඩනය, කොලෙස්ටරෝල් වැනි බෝ නොවන රෝග වර්ධනය වීම වර්තමාන සමාජයේ විශේෂයෙන් දැකිය හැකි තත්ත්වයක්. වැඩිවියට පත්වූ අයට පමණක් නොවෙයි, තරුණ කොටස්වලටද මෙවැනි රෝග තත්ත්වයන් පැවතීම කනගාටුදායක කරුණක්. මෙයට ප්‍රධාන හේතුව "විෂම ආහාර රටාවයි." දේශීය වෛද්‍ය ක්‍රමය යටතේ බෝ නොවන රෝග නිවාරණය සම්බන්ධව විශාල කාර්යභාරයක් කළ හැකි බව සහ එසේ කළ යුතු බව මාගේ විශ්වාසයයි.

මෙම තත්ත්වය තේරුම්ගත් අපගේ ආයුර්වේද දෙපාර්තමේන්තුව සමාජයේ නොයෙක් ජන කොට්ඨාශ ඉලක්ක කර ගනිමින් විවිධ තේමා යටතේ දැනුවත් කිරීමේ වැඩ සටහන් 1,500 කට වඩා පැවැත්වීමට සැලසුම් කර තිබෙනවා. එම වැඩ සටහන්වලින් සියයට 50 කට වඩා දැනටමත් අවසන් කර ඇත. විශේෂයෙන් පාසල් ළමුන් ඉලක්ක කර ගනිමින් වැඩ සටහන් 200 ක් සැලසුම් කළා. ඉන් 100 ක් දැනටමත් පවත්වා අවසන්. එම වැඩ සටහන්වලින් දින චර්යාව, ආහාර පුරුදු සහ ආයුර්වේද අධ්‍යාපනය පිළිබඳ දැනුම ලබා දෙනවා.

මෙම වර්ෂය තුළදී ලුනාව, නැබඩ හා මීගොඩ ආයුර්වේද රෝහල් සහ ඔසු සංවර්ධන කටයුතු සඳහා රුපියල් මිලියන 47 ක් පමණ වැය කර තිබෙනවා. ඒ අයුරින් උපාය මාර්ගික සංවර්ධන සැලැස්ම යටතේ රුපියල් මිලියන 138 ක් වැය කර මීගොඩ ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරයක් ඇරඹීමට සැලසුම් කර ඇත. දැනට පවතින සෞඛ්‍ය සේවා කාර්යාල මෙන් කොළඹ, ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්කවල දේශීය සෞඛ්‍ය සේවා කාර්යාල පිහිටුවීමට අප බලාපොරොත්තු වෙනවා. එමගින් දේශීය සෞඛ්‍ය සේවය පළාත තුළ තවදුරටත් ප්‍රචලිත කිරීම අපගේ මූලික ඉලක්කයයි.

## සමාජ සේවා කටයුතු
SOCIAL SERVICE FUNCTIONS

ගරු සභාපතිතුමනි, සමාජ සේවා විෂයය සම්පූර්ණයෙන් පළාත් සභා වෙත පැවරී ඇති කාර්යයක්. දිළිඳු අසරණ ජන කොටස් සඳහා සහන සැලසීම, අනාථ සහ අන්ත දුගී පවුල් පුනරුත්ථාපනය, ආබාධිත සුභසාධනය, බරපතළ රෝගාබාධවලින් පෙළෙන්නන්ට ආධාර සැපයීම ඇතුළු සමාජ සේවා රැසක් අප වෙත පැවරී තිබෙනවා. මේ සඳහා 2014 වර්ෂයට රුපියල් මිලියන 416 ක් වෙන් කර ඇති අතර, එය 2013 වර්ෂයේ වෙන් කළ මුදලට වඩා සියයට 4.7 ක වැඩි වීමක්.

වර්ෂයකට රුපියල් මිලියන 230 කට වඩා වැඩි මුදල් ප්‍රමාණයක් ප්‍රතිලාභීන් 65,000 ක පමණ සංඛ්‍යාවකට මහජන ආධාර වශයෙන් ලබා දෙනවා. පසුගිය වර්ෂවලදී ප්‍රතිලාභීන් 82,000 කට පමණ මහජන ආධාර ලබා දුන් අතර, එය පළාතේ ජනගහනයෙන් සියයට 1.6 ක් බවත්, එය සියයට 1 දක්වා අඩු කර ගත යුතු බවත් පසුගිය අයවැයේදී මා ප්‍රකාශ කළා. එම ඉලක්කය කරා අප ළඟා වී තිබෙනවා. කෙසේ වුවත් එක් අයෙකු ලබන මහජන ආධාර මුදල රුපියල් 250 සිට රුපියල් 1,500 දක්වා පරාසයක පවතිනවා. එය ප්‍රමාණවත් නොවන බව මාගේ අදහසයි. එම නිසා ඉදිරියේදී රජය සමග ද සාකච්ඡා කර එක් අයෙකු ලබන ආධාර මුදල වැඩි කිරීමට අදහස් කරනවා.

අප රටේ ජනතාව සමාජ සත්කාර සඳහා විශාල උනන්දුවක්, කැප කිරීමක් දක්වනවා. මෙය තේරුම් ගත් අපගේ සමාජ සේවා දෙපාර්තමේන්තුව රජයේ වියදමින් තොරව ප්‍රජා සහභාගීත්වයෙන් ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කරනවා. 2012 සහ 2013 වර්ෂ දෙක තුළ රුපියල් මිලියන 273 ක පමණ ප්‍රජා දායකත්වයක් ලබා ගෙන තිබෙනවා. රුපියල් මිලියන 1 කට වඩා වැඩි වටිනාකමක් පවතින නිවාස 21 ක් සාදා අසරණ පිරිස් වෙත ලබා දීමට කටයුතු කළා. තවත් නිවාස 13 ක වැඩ කරමින් පවතිනවා. මෙම වර්ෂය අවසන් වීමට පෙර ඒවා ද නිම කිරීම අපේ බලාපොරොත්තුවයි.

දැනටමත් නිවර්තන නිවාස තුළ ළමුන් සහ වැඩිහිටි අය 510 ක් පමණ නේවාසිකව නඩත්තු වෙනවා. නමුත් මන්ද මානසික පිරිමි ළමුන් වෙනුවෙන් නිවාසයක් මෙතෙක් තිබුණේ නැහැ. මීරිගම වැඩිහිටි නිවාස භූමියේ දැනටමත් මේ සඳහා නිවසක් ඉදි වන අතර මෙම වර්ෂය තුළ සම්පූර්ණයෙන්ම එහි වැඩ අවසන් කරනවා.

**පරිවාස හා ළමා රක්ෂක කටයුතු**
PROBATION AND CHILD CARE AFFAIRS

ගරු සභාපතිතුමනි, රටක උතුම්ම සම්පත දරු සම්පත වුවත් අනාථ, අත්හල, අසරණ සහ අපයෝජනයට ලක් වූ දරුවන් 4,800 කට පමණ රැකවරණය සැලසීමට අපට සිදු වී ඇත. අප පළාතේ දරුවන්ට පමණක් සීමා නොවී මුළු රටේම අනාථ දරුවන් අපගේ රැකවරණය ලබනවා. මෙම දරුවන් සමාජගත කළ යුතු වුවත් එය ඉතා සෙමින්, ඉවසීමකින්, ක්‍රමානුකූලව කළ යුතු අභියෝගයක්. 2012 වර්ෂයේදී ළමුන් 92 ක් පමණක් සමාජගත කර තිබීමෙන් මෙම තත්ත්වය කොතරම් අසීරුද යන්න අප තේරුම් ගත යුතුයි.

එම නිසා මෙම ළමුන් රැක බලා ගෙන ක්‍රමයෙන් සමාජගත කිරීමට විශාල මුදලක් වෙන් කිරීමට සිදු වෙනවා. 2013 වර්ෂයේ මේ සඳහා රුපියල් මිලියන 161 ක් වෙන් කළ අතර, 2014 වර්ෂයට රුපියල් මිලියන 181 ක් වෙන් කර තිබෙනවා.

මෙකී කාර්යය පමණක් නොව පවුල් ගැටළු නිරාකරණය, ළමුන් පිළිබඳ තීරණ ගැනීමේදී අධිකරණයට සහාය වීම, අඩු ආදායම් ලබන පවුල්වල ළමුන්ට ශිෂ්‍යත්ව ලබා දීම ආදී නොයෙක් කාර්යයන් අප වෙත පැවරී තිබෙනවා. මෙම වර්ෂය තුළ පවුල් ගැටුම් 267 ක් නිරාකරණය කර ඇති අතර ළමුන් 1,631 ක් සඳහා ශිෂ්‍යත්ව ලබා දී ඇත.

ගරු සභාපතිතුමනි, පසුගිය වර්ෂයේ අයවැය විවාදයේදී මෙම පරිවාස මධ්‍යස්ථානවල අධීක්ෂණ කටයුතු ද ප්‍රමාණවත් නොවන බවට ගරු මන්ත්‍රීතුමන්ලා අදහස් දැක්වූවා. ඒ අනුව පරිවාස නිලධාරීන්ට සහ ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්ට අධීක්ෂණ කටයුතු පවරා තිබෙනවා. ඔත්තේ මාසවලදී පරිවාස නිලධාරීන් ද ඉරට්ටේ මාසවලදී ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් ද අධීක්ෂණ කටයුතු කරන බවට මම මෙම සභාවට ගෞරවයෙන් දන්වා සිටිනවා.

**වනිතාවන්ට ස්වයං රැකියා**
SELF- EMPLOYMENT FOR WOMEN

බස්නාහිර පළාතේ මුළු ජනගහනයෙන් සියයට 51 ක් කාන්තාවන්. ඔවුන් අතුරින් රැකියා විරහිත අඩු ආදායම්ලාභී කාන්තාවන්ගේ හැකියාවන් හා දක්ෂතා නංවාලීමට දැනුම හා පහසුකම් ලබා දීම අපගේ ඉලක්කයයි. ඒ සඳහා රූපලාවන්‍ය, ජංගම දුරකථන අළුත්වැඩියාව, පරිගණක එකලස් කිරීම, ඡායාරූපකරණය හා වීඩියෝ කැමරාකරණය සහ විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය වැනි වෘත්තීය පාඨමාලා ක්‍රියාත්මක කරමින් පවතිනවා. සාර්ථකව පාඨමාලා නිම කර ස්වයං රැකියා ආරම්භ කිරීමට බලාපොරොත්තු වන කාන්තාවන් සඳහා උපකරණ ආධාර ලබා දී තිබෙනවා.

එසේම 2013 අයවැය කථාවේදී මා පැවසූ පරිදි අඩු ආදායම්ලාභී කාන්තාවන් 300 දෙනෙකු සඳහා තේ වගාවට අවශ්‍ය පැළ, පොහොර, තාක්ෂණික දැනුම ලබා දී පර්චස් 20 ට අඩු ඉඩම්වල තේ වගා කිරීමට අවශ්‍ය සම්පූර්ණ සහාය ලබා දී තිබෙනවා. මෙම ව්‍යාපෘතිය තවදුරටත් 2014 වර්ෂය තුළ ද ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වෙනවා.

**නවීන මාර්ග පද්ධතියක්**
MODERN ROAD SYSTEM

ගරු සභාපතිතුමනි, ඕනෑම රටක සංවර්ධනයේ නියමුවා දියුණු මාර්ග පද්ධතියයි. මැලේසියාව, සිංගප්පූරුව වැනි රටවල් දියුණු යැයි අප සලකනුයේ දියුණු නවීන මාර්ග

පද්ධතිය නිසයි. සමස්ත මගී ප්‍රවාහනයෙන් සියයට 90 ක් සහ සමස්ත භාණ්ඩ ප්‍රවාහනයෙන් සියයට 98 ක් සිදු වන්නේ මාර්ග භාවිතයෙන්. මෙය තේරුම් ගත් අපගේ රජය පසුගිය වර්ෂ කිහිපය තුළ මාර්ග සංවර්ධනය වෙනුවෙන් විශාල ආයෝජනයක් කර තිබෙනවා. දැනට වසර 10 කට පමණ පෙර පැවති මාර්ගවල තත්ත්වය සහ වර්තමානයේ පවතින මාර්ගවල තත්ත්වය සංසන්දනය කර අව්‍යාජව ඒ දෙස බලන මෙන් විපක්ෂයෙන් මා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. 2005 දී සියයට 25 ක් පමණ වූ “මාර්ගවල තත්ත්වයන්හි වර්ධන ප්‍රතිශතය” 2012 වන විට සියයට 55 ක් දක්වා වැඩි වී ඇත. 2020 දී එය සියයට සියය දක්වා සංවර්ධනය කර ගැනීම අපගේ ඉලක්කයයි.

මේ වන විට “රන් අරුණ එක, දෙක, තුන” යන වැඩ සටහන් යටතේ රුපියල් මිලියන 12,000 ක් පමණ වැය කර පළාතේ මාර්ග කිලෝ මීටර් 1,248 ක් කාපට් කර ඇත. අයවැය යෝජනා යටතේ රුපියල් මිලියන 8,998 ක් වැය කර පළාත් මාර්ග කිලෝ මීටර් 691 ක් කාපට් කර අවසන්. ඒ අනුව දැනට මාර්ග කිලෝ මීටර් 1,939 ක් රුපියල් මිලියන 20,998 ක් ආයෝජනය කර කාපට් කර තිබෙනවා. ඒ වාගේම මේ වන විට පළාත් සභාව සතු මාර්ග කිලෝ මීටර් 1,952 න් කිලෝ මීටර් 1,353 ක් කාපට් කර ඉවරයි. එය පළාත් සභාව සතු මාර්ගවලින් සියයට 70 ක් වෙනවා. ඉතිරි සියයට 30 ද ඉදිරි වර්ෂ දෙක තුළ කාපට් කිරීම අපේ ඉලක්කයයි. මෙම ආයෝජනවල ප්‍රතිඵල ලබන්නේ පළාතේ ජනතාව පමණක් නොවෙයි. මුළු රටේම ජනතාව ප්‍රතිලාභ ලබනවා.

මෙම සියලු කාර්යයන් කිරීමේදී පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විශේෂ වූ කාර්යභාරයක් කරන බව අප කවුරුත් දන්නා වූ කරුණක්. මාර්ග ඉදි කිරීම පමණක් නොවෙයි, වෙනත් කාර්යයන් සඳහා ද පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය යොමු වී තිබෙනවා. ශරීර සුවතා මංතීරු ඉදි කිරීම, මාතෘ සායන ඉදි කිරීම, සති පොළවල් ඉදි කිරීම වැනි ව්‍යාපෘති රාශියක් කරන අතර දැනටමත් ශරීර සුවතා මංතීරු 4 ක්, මාතෘ සායන 10 ක් සහ සති පොළ 8 ක් ඉදි කර ජනතා අයිතියට පවරා දී ඇත. මෙම සෑම කාර්යයකම අරමුණ පළාතේ ජනතාවට සේවය කිරීමයි.

**පශු සම්පත්වලින් ස්වයංපෝෂිත වීම**
SELF-SUFFICIENCY IN LIVESTOCK PRODUCTION

ගරු සභාපතිතුමනි, ග්‍රාමීය ජනතාවගේ ආදායම් ඉහළ නැංවීම සහ ඔවුන්ගේ රැකියා උත්පාදනය සඳහා පශු සම්පත් සංවර්ධනය ඉතා වැදගත්. පශු සම්පත් අංශය ප්‍රධාන වශයෙන් කිරි ගව පට්ටි පාලනය සහ කුකුල් පාලනය යන අංශ දෙකකින් සමන්විත වෙනවා. ග්‍රාමීය ප්‍රදේශවල මෙම අංශ දෙක දියුණු කිරීම අපගේ මූලික අභිප්‍රායයි.

දිවි නැගුම වැඩ සටහන යටතේ 2012 වසර තුළ රුපියල් මිලියන 38 ක් වැය කර පවුල් 10,664 ක් අතරේ කිකිළි පැටවුන් එක් ලක්ෂ හයදහස් හයසියයක් බෙදා දී ඇත. 2014 වර්ෂයේ කිකිළි පැටවුන් ලක්ෂයක් පමණ බෙදා හැරීමට අපේක්ෂා කරනවා. ඒ සඳහා රුපියල් මිලියන 40 ක් වෙන් කිරීමට මා යෝජනා කරනවා.

2012 වසර අවසන් වන විට දේශීය කිරි අවශ්‍යතාවයෙන් සියයට 10 කට වඩා වැඩි ප්‍රමාණයක් එනම් ලීටර් මිලියන 29 ක් බස්නාහිර පළාත තුළ නිපදවා ඇත. ඉදිරි වර්ෂ දෙක තුළ මෙය සියයට 15 කින් වැඩි කර ගැනීම අපගේ ඉලක්කයයි. ඒ සඳහා කිරි ගවයින් ලබා දීම, කිරි ගම්මාන ඇති කිරීම, ගවගාල් ඇති කිරීම, දියුණු කරන ලද තෘණ වර්ග හඳුන්වා දීම සහ කිරි අලෙවි මධ්‍යස්ථාන ඉදිකිරීම ආදී කාර්යයන් රාශියක් සිදු කළ යුතු වෙනවා. මෙම ව්‍යාපෘති සඳහා 2014 වර්ෂය තුළ ද මුදල් වෙන් කිරීමට මා බලාපොරොත්තු වෙනවා.

කිරි නිෂ්පාදනය වැඩි කිරීමට නම් බිහිවන ගව පැටවුන්ගෙන් වැඩි සංඛ්‍යාවක් ගැහැණු පැටවුන් වීම අවශ්‍යයි. නමුත් වර්තමානයේ ස්වභාවික ක්‍රියාවලියට අනුව බිහිවන පැටවුන්ගෙන් සියයට 50 කට වැඩි ප්‍රමාණයක් පිරිමි පැටවුන්. මෙය වළක්වා ගැනීම සඳහා කෘත්‍රිම සිංචනය මගින් පැටවුන් බිහි කිරීමට අප කටයුතු කළ අතර එය සාර්ථක වී තිබෙනවා. මේ සඳහා ගව ශුක්‍ර ආනයනය කළ යුතු වන අතර 2014 වර්ෂය තුළ ඒ වෙනුවෙන් ද මුදල් වෙන් කිරීම අපගේ සැලසුමයි.

**ධීවර කර්මාන්ත කටයුතු**
FISHERIES

ගරු සභාපතිතුමනි, ධීවර කර්මාන්තය සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම, පුහුණුව සහ ආම්පන්න ලබා දීම, මිරිදිය

හා කිවුල් දිය මත්ස්‍ය ගොවිපලවල් සංවර්ධනය, ධීවර ප්‍රදේශවල යටිතල පහසුකම් සැපයීම, ධීවර කාන්තාවන් සවිබල ගැන්වීම ආදී කාර්යයන් ධීවර කර්මාන්තය පිළිබඳ උපාය මාර්ග සංවර්ධන සැලැස්මේ මූලික පරාසයන් වෙනවා. මේවා ඉටු කර ගැනීම සඳහා 2012 වර්ෂයේ රුපියල් මිලියන 122 ක් වැය කරමින් ව්‍යාපෘති 65 ක් ක්‍රියාත්මක කර ඇත. 2013 වර්ෂයේදී මේ සඳහා රුපියල් මිලියන 102 ක් වෙන් කර ඇති අතර ඒ යටතේ ධීවර ව්‍යවසායකයින් නගා සිටුවීම සඳහා බෝට්ටු 65 ක්, එන්ජින් 218 ක්, ඔරු සහ තෙප්පන් 178 ක්, දැල් කට්ටල් 1020 ක් ලබා දී තිබෙනවා. මේ සඳහා රුපියල් මිලියන 62 ක ප්‍රතිලාභීන්ගේ දායකත්වය ද ලබා ගත්තා. ධීවර කාන්තාවන් සවිබල ගැන්වීම යටතේ ගෘහස්ථ, ජුකී, සිග්සැග් සහ ඕවර්ලොක් මැෂින් 572 ක් ලබා දී තිබෙනවා.

ධීවර කර්මාන්තය තුළ පසු අස්වනු හානිය සියයට තිහකට ආසන්න වෙනවා. මෙය අවම කර ගැනීම සඳහා නව මත්ස්‍ය පරිහරණ ක්‍රමයන් හඳුනා ගත යුතුයි. නවීණ ගබඩා හා ප්‍රවාහණ පහසුකම් හඳුන්වා දිය යුතුයි. ඒ සඳහා ද ලබන වර්ෂය තුළ මුදල් වෙන් කිරීමට මා බලාපොරොත්තු වෙනවා.

## නිවාස සංවර්ධන කටයුතු
HOUSING DEVELOPMENT AFFAIRS

ගරු සභාපතිතුමනි, වර්ෂ හයක් තුළ නිවාස ලක්ෂ 6 ක් ඉදිකිරීම මහින්ද චින්තනයේ නිවාස පිළිබඳ අභිමතාර්ථයයි. සෑම පවුලකම මූලික බලාපොරොත්තුව එම පවුලට අයත් නිවසක් පැවතීමයි. ඉසුරුමත් පවුලක් වීමට නම් පදිංචියට සුදුසු නිවසක් එම පවුලට හිමි විය යුතු යැයි මා විශ්වාස කරනවා.

2012 වර්ෂයේ රුපියල් මිලියන 23 ක් වැය කර ප්‍රතිලාභීන් 1,284 කට නිවාස ආධාර ලබා දී තිබෙනවා. 2013 වර්ෂයේදී මේ සඳහා වෙන් කර ඇති මුදල රුපියල් මිලියන 67 ක් වන අතර එමගින් ප්‍රතිලාභීන් 2800 කට නිවාස ආධාර ලබා දීමට සැලසුම් සකස් කර ඇත. දැනට පවුලකට ලබා දෙන උපරිම නිවාස ආධාර මුදල රුපියල් 40,000 යි. මෙය ප්‍රමාණවත් නොවන බව මාගේ අදහසයි. එම නිසා මෙකී ආධාර මුදල රුපියල් 60,000 ක් දක්වා වැඩි කිරීමට මා යෝජනා කරනවා.

නිවාස සඳහා ආධාර දීම පමණක් නොවේ. නිවාසලාභීයාගේ ද දායකත්වය ඇතිව නිවාස ඉදිකර දීම කෙරෙහිද අපගේ අවධානය යොමු වී ඇත. එයට අනුගත වෙමින් මෙම වර්ෂය තුළ නිවාස 10 ක් ඉදි කිරිමට කටයුතු කරනවා. ලබන වර්ෂය තුළ මීට වඩා පුළුල්ව මෙම කාර්යය කිරීම අපගේ බලාපොරොත්තුවයි.

## සංචාරක ප්‍රවර්ධන කටයුතු
TOURISM

"පරිසර හිතකාමී සංචාරක කර්මාන්තයක්" යන මහින්ද චින්තනයට අනුගත වෙමින් සංචාරක කර්මාන්තය මෙහෙයවීම අපේ අරමුණයි. ආකර්ෂණීය ස්ථාන ආශ්‍රිතව යටිතල පහසුකම් සංවර්ධනය, වෘත්තීය නිපුණත්වය ඉහළ නැංවීම සහ සේවා සපයන ආයතනවල ප්‍රමිතීන් ඉහළ නැංවීම සඳහා මෙම වර්ෂයේ රුපියල් මිලියන 121 ක ප්‍රතිපාදන සලසා තිබෙනවා. රට තුළ ගොඩ නැගී ඇති සාමකාමී වාතාවරණය තුළ 2014 වර්ෂයේදී රාජ්‍ය හා පෞද්ගලික අංශය ඒකාබද්ධව නොයෙක් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන අතර ඒ සඳහා මෙම මුදල් ප්‍රකාශයෙන් ප්‍රතිපාදන සලසනවා.

## කෘෂිකාර්මික සංවර්ධන කටයුතු
AGRICULTURAL DEVELOPMENT AFFAIRS

ගරු සභාපතිතුමනි, අපේ රටේ ග්‍රාමීය ජනතාවගෙන් වැඩි සංඛ්‍යාවක් කෘෂිකර්මාන්තයේ නියැලෙන්නන්. එහි සේවා නියුක්තිය සියයට 33 ක් වෙනවා. මුළු වගා කළ හැකි බිම් ප්‍රමාණයෙන් සියයට 65 ක් කෘෂිකාර්මික බෝග යටතේ පවතින අතර එම බිම් ප්‍රමාණයෙන් සියයට 40 ක් පවතින්නේ වී වගාව යටතේ ය. තවමත් අපේ රටේ ජනතාවගෙන් වැඩි ප්‍රමාණයක් තුන් වේලටම ගන්නේ සහල් ආශ්‍රිත ආහාරයි. ඒ නිසා පළාතේ වී වගාව දියුණු කිරීමට අපි දායක විය යුතුයි. මෙහිදී අප මුහුණ දෙන ප්‍රධානතම ගැටළුව වන්නේ අතීතයේ වගා කළ මුත් වර්තමානයේ වගා නොකරන කුඹුරු විශාල ප්‍රමාණයක් පැවතීමයි. පසුගිය වර්ෂ තුන තුළ පළාතේ පුරන් කුඹුරු හෙක්ටයාර් 1,395 ක් නැවත වගා කරවීමට අපට හැකි වුණා. පුරන් කුඹුරු වගාවෙන් පසු නැවත පුරන් වීමේ ප්‍රතිශතය සියයට 15 ක් පමණ වෙනවා. එයද අඩුකර ගනිමින් ඉදිරි වර්ෂ හතර තුළ සියලු පුරන් කුඹුරු අස්වැද්දීම අපගේ ඉලක්කයයි. 2014 වර්ෂය තුළ මේ සඳහා රුපියල් මිලියන 35 ක් යෙදවීමට මා යෝජනා කරනවා.

පළාතේ තරුණ පුරපුර කෘෂිකර්මයට නැඹුරු කිරීම හා ඒ පිළිබඳ ලැදියාවක් ඇති කිරීම ඉතා වැදගත්. එම අරමුණින් පාසල් කෘෂි සමාජ පිහිටුවීම ආරම්භ කළ අතර මේ වනවිට පාසල් 632 ක කෘෂි සමාජ ආරම්භ කර තිබෙනවා. සෑම කෘෂි සමාජයකටම රුපියල් 50,000 ක් වටිනා කෘෂි උපකරණ සහ බීජ ලබා දෙන අතර සෑම පාසලකම කෘෂි ගෙවත්තක් සැකසීම එහි අරමුණයි. 2014 වර්ෂය තුළ තවදුරටත් කෘෂි සමාජ 213 ක් පිහිටුවීමට බලාපොරොත්තු වන අතර ඒ සඳහා රුපියල් මිලියන 14 ක් වෙන් කර ඇත.

කෘෂිකාර්මික කටයුතු කෙරෙහි යොමු වන ශ්‍රමය හිඟ වීම සහ ශ්‍රමයේ මිල අධික වීම බස්නාහිර පළාතේ ගොවීන් මුහුණ පාන ප්‍රබල ගැටළුවක්. මෙයට පිළියමක් වශයෙන් රුපියල් මිලියන 26 ක වියදමින් ගොවි සංවිධාන 88 කට රෝද දෙකේ අත් ට්‍රැක්ටර් 88 ක් ලබා දී තිබෙනවා. මෙම ව්‍යාපෘතිය ඉදිරි වර්ෂය තුළ ද ක්‍රියාත්මක කිරීම අපගේ ඉලක්කයයි.

"මනරම් වැව්" ව්‍යාපෘතිය යටතේ කැස්බෑව, ගම්මන්පිල, මත්තේගොඩ සහ රෙමුණ යන වැව් 4 සම්පූර්ණයෙන් ප්‍රතිසංස්කරණය කරනවා. මේ සඳහා ඇස්තමේන්තුව රුපියල් මිලියන 25 යි. වැව්වල ජල ධාරිතාව ඉහළ නැංවීම, වැව් රක්ෂිත හා පරිසර පද්ධති සංරක්ෂණය සහ ජනතාවගේ මානසික සුවය වර්ධනය සඳහා වැව් ආශ්‍රිත ප්‍රදේශවල උද්‍යාන ඇති කිරීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණයි.

**සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත**
SMALL AND MIDDLE SCALE INDUSTRIES

ශ්‍රී ලංකාවේ මුළු ව්‍යාපාර සංඛ්‍යාවෙන් සියයට 80 ක් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තයි. වාර්ෂික පිරිවැටුම රුපියල් මිලියන 100 ට අඩු, ස්ථාවර වත්කම්වල වටිනාකම රුපියල් මිලියන 10 ට අඩු ව්‍යාපාර සුළු පරිමාණ කර්මාන්ත ලෙස සලකනවා. එම කර්මාන්තකරුවන් රැක ගැනීම සහ ඔවුන්ට අතහිත දීම අපගේ කාර්යයයි.

සමස්ත කර්මාන්ත ක්ෂේත්‍රයෙන් සියයට 43 ක් රෙදිපිළි හා ඇඟළුම් ආශ්‍රිත කර්මාන්තයි. කොපමණ නිමි ඇඳුම් වෙළඳපොලේ පැවතිය ද අත් යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදනය සඳහා විශාල ඉල්ලුමක් පවතිනවා. විශේෂයෙන් කාන්තා සාරි ද ඇතුළුව හීන් නූල් නිෂ්පාදනයන්හි ඉල්ලුම සපුරාලීමට අපට නොහැකි වී ඇත. පළාතේ පවතින පේෂ කර්මාන්ත මධ්‍යස්ථාන 54 න් හීන් නූල් මධ්‍යස්ථාන තිබුණේ 7 යි. එම මධ්‍යස්ථාන සංඛ්‍යාව 25 දක්වා වැඩි කර තිබෙනවා. එම නිසා හීන් නූල් නිෂ්පාදනය සියයට 50 කින් වැඩි වෙලා.

මේ සඳහා පසුගිය වර්ෂ දෙක තුළ රුපියල් මිලියන 41 ක් වැය කර මේවා අංග සම්පූර්ණ මධ්‍යස්ථාන බවට පත් කළා. එසේ වුවත් සම්පූර්ණ ඉල්ලුම සපුරාලීමට අපට නොහැකි වී ඇත. එම නිසා 2014 වර්ෂය තුළ තවත් මධ්‍යස්ථාන 6 ක් හීන් නූල් නිෂ්පාදන මධ්‍යස්ථාන බවට පත් කිරීමට මා යෝජනා කරනවා. හීන් නූල් නිෂ්පාදනය වැඩි වුවත් ඒ සඳහා දායක වන ශ්‍රමිකයකුගේ දෛනික වැටුප් ප්‍රමාණවත් නොවන බව මාගේ අදහසයි. දැනට එවැනි අයෙකුගේ දෛනික වැටුප රුපියල් 350 ක් වෙනවා. මෙය කිසිසේත් ප්‍රමාණවත් නැහැ. ඒ නිසා ශ්‍රමිකයෙකුගේ දෛනික වැටුප රුපියල් 600 දක්වා වැඩි කිරීමට මා යෝජනා කරනවා.

2011 වර්ෂයේ ආරම්භ කරන ලද පාසල්වල අබලන් වූ ලී බඩු අලුත්වැඩියා කිරීමේ "බිඳුණු පුටුවට - දැතේ සවිය" ව්‍යාපෘතිය යටතේ දැනට රුපියල් මිලියන 31 ක් වැය කර පාසල් 725 ක අබලන් වූ ලී බඩු අලුත්වැඩියා කර තිබෙන අතර ඒවායේ නිමවුම් වටිනාකම රුපියල් මිලියන 187 ක් පමණ වෙනවා. 2014 වර්ෂයේදී ද මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

**ජල කළමනාකරණය**
WATER MANAGEMENT

ගරු සභාපතිතුමනි, කෘෂිකාර්මික සංවර්ධනයේ ප්‍රධානතම මෙහෙයුම් බලය වාරි අංශයයි. ජලය විශ්වසනීය අන්දමින්, ප්‍රමාණවත් ලෙස, සමාකාර බෙදා හැරීමක් කළ යුතුයි. වාරිමාර්ග අංශයේ ප්‍රධාන කාර්යභාරය එයයි. මේ සඳහා අප විශාල වැඩ කොටසක් කර තිබෙන අතර, කළ යුතු වැඩ කොටස ඊට වඩා වැඩියි.

2012 සහ 2013 යන වර්ෂ දෙක තුළ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය, ට්‍රැක්ටර් පැන්නුම් ඉදිකිරීම, පැති බැම් සහ නව අමුණු ඉදි කිරීම යන අංශ වෙනුවෙන් ව්‍යාපෘති 223 ක් ක්‍රියාත්මක කළා. ඒ සඳහා වැය කර ඇති මුදල රුපියල් මිලියන 77 ක් වෙනවා. මෙමගින් පෝෂණය කරන අක්කර ප්‍රමාණය 6,868 ක් වන අතර, ප්‍රතිලාභීත්වය ලබන ගොවි පවුල් සංඛ්‍යාව 5,000 කට වැඩියි.

වාරි කටයුතු සඳහා ද තාක්ෂණය යොදා ගැනීම ඉතාම වැදගත් සේ මා දකිනවා. ඒ අනුව භූ තාක්ෂණික සමීක්ෂණ ක්‍රමවේදය උපයෝගී කර ගෙන - GPS පළාතේ සියලු වාරිමාර්ග ආශ්‍රිත තොරතුරු සිතියම් ගත කිරීමේ වැඩ සටහන දැනටමත් ආරම්භ කර ඇත. මෙමගින් වාරි තොරතුරුවල මෘදුකාංග සිතියමක් සකසා ගැනීම අපේ බලාපොරොත්තුවයි.

මෙම සියලු කාර්යයන්ගෙන් අප බලාපොරොත්තු වන්නේ, ජල සම්පත ග්‍රාමීය ජනතාවගේ ජීවිකාව සුරක්ෂිත කිරීමට යෙදවීමයි. කෙසේ වුවත්, ජල භාවිතය පිළිබඳ සමස්ත ඉල්ලුම මේ වන විට සීඝ්‍රයෙන් වෙනස් වෙමින් පවතිනවා. කෘෂිකාර්මික අංශයට අමතරව කෘෂිකාර්මික නොවන අංශවලට ද ජලය සඳහා වන ඉල්ලුම සීඝ්‍ර ලෙස වැඩි වෙමින් තිබෙනවා. ඉදිරියේදී ඇති වන මෙම තත්ත්වය ද තේරුම් ගෙන උපාය මාර්ගික සැලසුම් සකස් කළ යුතුයි.

**පාරිසරික කටයුතු**
ENVIRONMENTAL AFFAIRS

ගරු සභාපතිතුමනි, පරිසරය පිළිබඳව මහින්ද චින්තනය වන "මතු පරපුරටද අපේ හරිත උරුමය දායාද කර දිය යුතුයි" යන තේමාව යටතේ පරිසරය පිළිබඳ නොයෙක් ව්‍යාපෘති ක්‍රියාත්මක කළා. දුර්ලභ ගණයේ ශාක සංරක්ෂණය, පොලිතීන් වෙනුවට විකල්ප භාවිතය සඳහා ජනතාව හුරු කරවීම, අපද්‍රව්‍ය ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය, බලශක්ති සංරක්ෂණයේ වැදගත්කම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම එවැනි ව්‍යාපෘතීන්ගෙන් කිහිපයක්.

පොලිතීන් භාවිතය හේතුවෙන් මිනිසාගේ මෙන්ම සතුන්ගේ පැවැත්මටද අහිතකර බලපෑමක් ඇති වී තිබෙනවා. පොලිතීන් දිරාපත් වීමට වසර 50 සිට වසර 400 දක්වා කාලයක් ගත වෙනවා. පොලිතීන් භාවිතය අවම කිරීම සඳහා වන විකල්ප ක්‍රම යටතේ රුපියල් මිලියන 23 ක් වැය කර සුදු රෙදි පාලම් කොඩි 994 ක් හා සුදු රෙදි සැරසිලි කට්ටල් 3,100 ක් පමණ පළාතේ අවමංගල්‍යාධාර සමිතිවලට සහ ශාසනාරක්ෂක බල මණ්ඩල වෙත ලබා දී ඇත.

"බලශක්ති සංරක්ෂණය" යටතේ මේ වන විට රුපියල් මිලියන 17 ක් වැය කර CFL විදුලි පහන් 18,000 ක් ජනතාවට ලබා දී තිබෙනවා.

දුර්ලභ ගණයේ ශාක සංරක්ෂණ යටතේ ක්‍රියාත්මක කරන ලද "අටවිසි බෝධි වෘක්ෂ" වැඩ සටහන විශේෂ වූ ව්‍යාපෘතියක් සේ මා දකිනවා. විශේෂයෙන් වඳ වී යන ශාක රැක ගැනීම අපගේ වගකීමක්. ඒ සඳහා 2014 වර්ෂය තුළ ද මුදල් වෙන් කිරීමට මා යෝජනා කරනවා.

**මගී ප්‍රවාහන කටයුතු**
PASSENGER TRANSPORT AFFAIRS

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාතේ ලක්ෂ 58 කට වැඩි ජනගහනයක් ජීවත් වන අතර, ලක්ෂ 30 කට වැඩි සංඛ්‍යාවක් ප්‍රවාහන පහසුකම් සලසා ගන්නේ පෞද්ගලික බස් රථවලින්. මෙම පෞද්ගලික බස් රථ ධාවනය විධිමත්ව කළමනාකරණය කිරීම අපගේ ප්‍රධාන කාර්යභාරයයි. ඒ සඳහා ධාවන සැලසුම් සකස් කිරීම, යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සහ මානව සම්පත් සංවර්ධනය යන අංශ තුන යටතේ අපගේ කටයුතු ක්‍රියාත්මක කළ යුතුයි.

පළාත තුළ බස් ධාවනය කරන මාර්ග 431 ක් වන අතර ඉන් මාර්ග 197 ක ලංගම සහ පෞද්ගලික බස් රථ දෙවර්ගයම ධාවනය වෙනවා. ඉතිරි මාර්ග 234 හි ධාවනය වන්නේ පෞද්ගලික බස් රථ පමණයි. ඒ අනුව මාර්ග 197 ක් සඳහා ඒකාබද්ධ කාල සටහන් සකස් කළ යුතුයි. ඉන් මාර්ග 103 ක ඒකාබද්ධ කාල සටහන් මේ වන විට සකස් කර අවසන්. ඉතිරි මාර්ග 94 හි ඒකාබද්ධ කාල සටහන් දැනට සකස් කරමින් පවතිනවා. කාල සටහන් අනුව බස් රථ ධාවනය තවදුරටත් කාර්යක්ෂම කිරීම සඳහා GPS තාක්ෂණය යොදා ගැනීමට සැලසුම් කර තිබෙනවා.

බස්නාහිර පළාත තුළ පාසල් යන ළමුන්ගෙන් සියයට 80 කට වැඩි සංඛ්‍යාවක් පාසල වෙත ගමන් කරන්නේ ප්‍රවාහන ක්‍රමයන් උපයෝගී කරගෙනයි. ප්‍රමාණවත් පාසල් බස් රථ නොමැති නිසා බොහෝ දෙමව්පියන් වැඩි මුදලක් ගෙවා පෞද්ගලික වෑන් මගින් තම දරුවන් පාසල වෙත එවීමට පුරුදු වී සිටිනවා. මේ නිසා දිනකට වෑන් රථ 6,000 ක් පමණ කොළඹ නගරයට එනවා. මෙම පාසල්

වෑන් රථ නිසා නාගරික ප්‍රදේශයේ විශාල වාහන තදබදයක් පවතිනවා. "සිසු සැරිය ව්‍යාපෘතිය" යටතේ බස් රථ යෙදවීමෙන් දෙමව්පියන්ට විශාල සහනයක් සැලසෙනවා. මේ යටතේ දරුවෙකුගෙන් අය කරන්නේ ටිකට් පත් ගාස්තුවෙන් සියයට 50 ක් පමණයි. ඒ අනුව මාසිකව වෑන් රථයකට රුපියල් 4,000 ක් පමණ වියදම් කළ යුතු දෙමව්පියෙකුගේ වියදම රුපියල් 800 ක් දක්වා අඩු වී තිබෙනවා. ඒ වාගේම වාහන තදබදය අඩු කිරීම ද එමගින් බලාපොරොත්තු වෙනවා. මෙම ව්‍යාපෘතිය යටතේ පාසල් ළමුන් ප්‍රවාහනය සඳහා මේ වන විට බස් රථ 80 ක් යොදවා තිබෙන අතර වෑන් රථ හයකින් ප්‍රවාහනය කරන දරුවන් එක් බස් රථයකින් ප්‍රවාහනය කරන්න පුළුවන්. මෙම වර්ෂය අවසන් වන විට බස් රථ 150 ක් මේ සඳහා යෙදවීමට බලාපොරොත්තු වෙනවා.

පසුගිය වර්ෂ 3 තුළ ප්‍රධාන බස් නැවතුම්පොළවල් 10 ක් සම්පූර්ණයෙන් ඉදි කර මහජනතාවට භාර දී තිබෙනවා. මේ සඳහා වැය කර ඇති මුදල රුපියල් මිලියන 419 ක්. 2014 වර්ෂයේදී තවත් බස් නැවතුම් පොළවල් හතක් සංවර්ධනය කිරීමට සැලසුම් කර තිබෙන අතර ඒ සඳහා ද මෙම මුදල් ප්‍රකාශයෙන් ප්‍රතිපාදන සලසනවා.

ගරු සභාපතිතුමනි, මගී ප්‍රවාහන කාර්යයන්හි නියැලෙන මානව සම්පත කෙරෙහි අපගේ අවධානය යොමු කළ යුතුයි. සිය ජීවිත කාලයම බස් රථයකට කැප කරන අයෙකු සිය සැඳෑ සමයේදී රැක බලා ගැනීම ද අපගේ වගකීමක් සේ මා දකිනවා. එම නිසා විශේෂයෙන් රියදුරු සහ රියදුරු සහායක මහතුන්ට විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දීමට මා යෝජනා කරනවා. එය ඉදිරි වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීම අපගේ බලාපොරොත්තුවයි.

## සමූපකාර සංවර්ධන කටයුතු
CO-OPERATIVE DEVELOPMENT ACTIVITIES

ගරු සභාපතිතුමනි, කෙතරම් දියුණු වෙළඳ පොලක් පැවතියත්, දියුණු සාප්පු සංකීර්ණ පැවතියත් තවමත් අපේ ග්‍රාමීය ජනතාව සමූපකාරය වටා ගොනු වී සිටිනවා. ඒ කෙරෙහි ඔවුන්ගේ විශාල විශ්වාසයක් පවතිනවා. ග්‍රාමීය ප්‍රජාව සවිබල ගැන්වීම සඳහා සමූපකාර ක්‍රමය ප්‍රබල පිටිවහලක්. අපගේ උපාය මාර්ගික සංවර්ධන සැලැස්ම අනුව වසර 2016 වන විට සමූපකාර ගම්මාන 38 ක් ස්ථාපිත කිරීම, කෝප් සිටි ප්‍රාදේශීය වෙළඳ සැල් 250 ක් නවීකරණය කිරීම, අලෙවි මධ්‍යස්ථාන 10 ක් හා ආර්ථික මධ්‍යස්ථාන 3 ක් ආරම්භ කිරීම මූලික සැලැස්මයි.

රාජ්‍ය සේවකයන්ට මෙන් විශ්‍රාම වැටුප් ක්‍රමයක් සමූපකාර සේවකයන්ට තිබුණේ නැහැ. ප්‍රඥප්තියක් ද සම්මත කර ඔවුන් වෙනුවෙන් විශ්‍රාම වැටුප් ක්‍රමයක් ආරම්භ කළා. මේ වන විට සේවකයන් 2,200 ක් එම අරමුදලේ සාමාජිකයන් වී හිමිකම් පත්‍ර ලබා ගෙන ඇත. විශ්‍රාම ගිය සමූපකාර සේවකයන් 125 දෙනෙකුට විශ්‍රාම වැටුප් ද ප්‍රදානය කර තිබෙනවා. දැන් ඔවුන් මාසික විශ්‍රාම වැටුප් ලබනවා. මෙය තවත් ශක්තිමත්ව පවත්වාගෙන යෑම අපේ බලාපොරොත්තුවයි.

සමූපකාර ග්‍රාමීය බැංකු කෙරෙහි අපගේ විශේෂ අවධානය යොමු කළ යුතු වෙනවා. මේවායේ කාර්යභාරයන් තවදුරටත් පුළුල් කළ යුතුයි. මෙම බැංකුවල පවතින මුදල් එහි සාමාජිකයන්ගේ ජීවන තත්ත්වය දියුණු කිරීම සඳහා යෙදවිය යුතුයි. විශේෂයෙන් ස්වයං රැකියා ව්‍යාපෘති ආරම්භ කිරීමට අතහිත දීම සඳහා මෙම බැංකුවල මුදල් ආයෝජනය කළ යුතු යැයි මා විශ්වාස කරනවා. ලබන වර්ෂය තුළ සමූපකාර දෙපාර්තමේන්තුව මගින් ඒ සඳහා අවශ්‍ය කටයුතු කිරීමට මා යෝජනා කරනවා.

අතීතයේ සමූපකාර ක්‍රමය පැවතියේ වෙළඳ කටයුතු සඳහා පමණක් නොවේ. කෘෂිකාර්මික, කර්මාන්ත හා පශු නිෂ්පාදන කටයුතු සඳහා සමූපකාර ක්‍රමය යොමු වී තිබුණා. නමුත් වර්තමානයේ ඒවා සමාජයෙන් ක්‍රමයෙන් ගිලිහී යන බවක් පෙනෙනවා. එම නිසා වෙළඳ කටයුතු හැර වෙනත් සමූපකාර සමිති වර්ධනය කිරීම සඳහා ඉදිරි වර්ෂය තුළ මුදල් වෙන් කිරීමට ද මා බලාපොරොත්තු වෙනවා.

## සංස්කෘතික සහ ජාතික උරුමයන්
CULTURAL AND NATIONAL HERITAGE

ගරු සභාපතිතුමනි, රටවල් ගෝලීය සංස්කෘතිය සමඟ බද්ධ වීමේ වේගය වැඩි වන විට එම රටවල සංස්කෘතීන් සහ කලාවන් අභාවයට යනබව පොදු පිළිගැනීමයි. නමුත් එය ඒ ආකාරයෙන් සිදු වීමට ඉඩ නොදී අභාවයට යන සංස්කෘතික අංගයන් රැක ගැනීම, ආරක්ෂා කර ගැනීම සහ ඒවා ප්‍රචලිත කිරීම අපගේ වගකීමක් සහ යුතුකමක් වෙනවා. එම පරමාර්ථය උදෙසා 2014 වර්ෂයේ රුපියල් මිලියන 30 ක් මේ සඳහා වෙන් කර තිබෙනවා.

කලාව සහ සංස්කෘතිය ඉදිරියට ගෙන යෑමේ කාර්යභාරය රාජ්‍ය අංශයට පමණක් කළ හැකි දෙයක් සේ මා දකින්නේ නැහැ. ඒ සඳහා පෞද්ගලික කලා ශිල්පීන්ගේ දායකත්වය ඉතා වැදගත්. විශේෂයෙන් කලා ආයතනයන් සඳහා අපගේ අනුග්‍රහය සහ දායකත්වය ලබා දීම ඉතා වැදගත් වෙනවා. එය පෙරදැරි කර ගෙන මෙම වර්ෂයේදී කලායතන 40 ක් සඳහා වාද්‍ය භාණ්ඩ ලබා දී ඇත.

බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතනය අප පළාතට තිබෙන විශාල සම්පතක්. කොළඹ නගර මධ්‍යයේ පිහිටා තිබුණත් මනරම් භූමිභාගයක තිබෙන ඉතාම අලංකාර ආයතනයක්. මෙම ආයතනය කලාකරුවන් අතර ඉතා ජනප්‍රිය වී තිබෙනවා. එසේම මෙම ආයතනය සඳහා විශාල ඉල්ලුමක් ද පවතිනවා. කලාවේ සහ සංස්කෘතියේ යහපත වෙනුවෙන් මෙහි උපරිම ප්‍රයෝජන ගත යුතු යැයි මා විශ්වාස කරනවා. එහෙයින් ඉදිරි වර්ෂය තුළ මෙම ආයතනයේ විවිධාංගීකරණය වූ විශේෂ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන අතර, ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ද මෙම අයවැයෙන් වෙන් කරනවා.

**ක්‍රීඩාව තුළින් ක්‍රියාශීලී ජන සමාජයක්**
ACTIVE COMMUNITY THROUGH SPORTS

ගරු සභාපතිතුමනි, නූතන ලෝකයේ ක්‍රීඩාව තරුණයන්ට පමණක් අයත් වූවක් නොවෙයි. බාල මහලු සෑම දෙනාටම විවෘත දෙයක්. ක්‍රීඩාව සංවර්ධනය කිරීම යනු අනාගත පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය වන්නා වූ ආයෝජනයක් බව මාගේ විශ්වාසයයි.

එයට අනුගත වෙමින් පසුගිය වර්ෂ දෙක තුළ රුපියල් මිලියන 53 ක් වැය කර ක්‍රීඩා පිටි 44 ක් සංවර්ධනය කළා. මෙම වර්ෂය තුළ දිස්ත්‍රික්ක තුනෙහි පිහිනුම් තටාක 3 ක් ඉදි කිරීම සඳහා වැඩ ආරම්භ කර ඇත. එසේම රුපියල් මිලියන 4.5 ක් වැය කර ශක්ති වර්ධන හා කාය වර්ධන මධ්‍යස්ථාන 12 ක් ඉදි කිරීම ආරම්භ කර තිබෙනවා.

2017 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ පැවැත්වෙන පොදු රාජ්‍ය මණ්ඩලයීය තරග සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන් සංචිත ගත කර පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කළ යුතු වෙනවා. 2013 වර්ෂයට ඒ සඳහා රුපියල් මිලියන 5 ක් පමණ වෙන් කළා. 2014 වර්ෂයේදී ද ඒ සඳහා මුදල් වෙන් කිරීමට මෙම මුදල් ප්‍රකාශයෙන් ප්‍රතිපාදන සලසනවා. නගරයට පමණක් ක්‍රීඩාව කේන්ද්‍රගත නොකර ග්‍රාමීය අංශයට ද එය ව්‍යාප්ත කළ යුතුයි. ග්‍රාමීය ක්‍රීඩාව සංවර්ධනය කිරීමේ කටයුතු සඳහා මෙම වර්ෂයේ රුපියල් මිලියන 4.5 ක් වෙන් කර තිබෙනවා.

ක්‍රීඩාවේ භෞතික සංවර්ධනය පමණක් නොවෙයි ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම ද කළ යුතුයි. සමහර ක්‍රීඩාවන් සඳහා භාවිතා කරන සපත්තු කුට්ටමක මිල රුපියල් 30,000 ක් පමණ වෙනවා. ක්‍රීඩකයන්ට එය දරා ගැනීම අපහසුයි. දැනට අප ලබා දෙන මූල්‍ය ආධාර මුදල එක් ක්‍රීඩකයකු වෙනුවෙන් රුපියල් 3,000 ක් හා රුපියල් 10,000 ක පරාසයක පවතිනවා. එය කිසිසේත් ප්‍රමාණවත් නැහැ. එහෙයින් ලබන වර්ෂයේ සිට මෙම ලබා දෙන මූල්‍ය ආධාර මුදල වැඩි කළ යුතු යැයි මා අදහස් කරනවා. මෙම ආධාර මුදල රුපියල් 5,000 සිට රුපියල් 15,000 ක පරාසයක් දක්වා වැඩි කිරීමට මා යෝජනා කරනවා.

**ග්‍රාම සංවර්ධන කටයුතු**
RURAL DEVELOPMENT AFFAIRS

ගරු සභාපතිතුමනි, සංවර්ධනය හා නාගරිකකරණය අතින් ප්‍රමුඛ ස්ථානයක් ගන්නා බස්නාහිර පළාතේ මුළු ජනගහනයෙන් සියයට 52 ක් ග්‍රාමීය ජනගහනය වන අතර එහි වැඩිම ප්‍රතිශතයක් වාර්තා වන්නේ කළුතර දිස්ත්‍රික්කයෙන්. එම ග්‍රාමීය ජනතාව ඒකාබද්ධ කර ඔවුන්ගේ සමාජයීය, ආර්ථික හා සංස්කෘතිමය අංශයන් වර්ධනය කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් සපුරා ගැනීම සඳහා ඔවුන්ට අවශ්‍ය මූල්‍යමය ශක්තිය ලබා දීම ග්‍රාම සංවර්ධන අංශයේ අභිප්‍රායයි. 2014 වර්ෂයට ද මෙකී කටයුතු සඳහා රුපියල් මිලියන 42 ක් වෙන් කර තිබෙනවා.

දිස්ත්‍රික්ක තුන පුරා විහිදී ගිය සාමාජිකයන් 100,000 ක් පමණ සිටින ක්‍රියාකාරී ග්‍රාම සංවර්ධන සමිති 1,500 කට ආසන්න ප්‍රමාණයක් පළාතේ පවතින අතර, ඒවායේ පවතින මුළු වත්කම් ප්‍රමාණය රුපියල් මිලියන 100 ඉක්මවනවා. ග්‍රාමීය සහ නාගරික පද්ධතිය අතර ඇති අසමතුලිතතාව අවම කිරීම සඳහා එම වත්කම් යොදා ගන්න පුළුවන්. ගම් මට්ටමෙන් සැලසුම් සකස් කර ගම් මට්ටමින්ම ඒවා ක්‍රියාත්මක කළ යුතුයි. ඒ සඳහා ග්‍රාම සංවර්ධන සමිතිවල දායකත්වය ලබා ගැනීම ඉතා වැදගත්.

මෙම වර්ෂයේ සම්මත කරන ලද ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තියෙන් මේ සඳහා අවශ්‍ය පදනම සකසා තිබෙන අතර එය ඉදිරියේ ක්‍රියාත්මක කිරීම තුළින් ඉහත අරමුණු ඉටු කර ගැනීම අපගේ අපේක්ෂාවයි.

## මෝටර් රථ ප්‍රවාහන කටයුතු
MOTOR TRAFFIC AFFAIRS

ගරු සභාපතිතුමනි, පළාත් සභා ආදායම් මාර්ග අතර ප්‍රධානතම ආදායම් මාර්ගය මෝටර් රථ බලපත්‍ර නිකුත් කිරීමෙන් ලැබෙන ආදායමයි. මෝටර් වාහනවලින් අය කරන දඩ මුදල් ද ඇතුළුව 2011 සහ 2012 වර්ෂවල ආදායම රුපියල් මිලියන 2,208 ක් හා 2,513 ක් වූ අතර 2014 වර්ෂයේදී රුපියල් මිලියන 3,170 ක් එකතු කිරීමට බලාපොරොත්තු වෙනවා.

2013 අයවැය ඉදිරිපත් කරමින් මා සඳහන් කළ ඉලක්කය දැන් අපි සපුරා ගෙන ඇත. මේ වන විට කොළඹ, ගම්පහ සහ කළුතර යන දිස්ත්‍රික්ක තුනේම සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය ජාලගත කිරීම අවසන්. බස්නාහිර පළාතේ ඕනෑම වාහන හිමියෙකුට පළාත තුළ තමන් කැමැති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් තම වාහනයේ ආදායම් බලපත්‍රය ලබා ගන්න පුළුවන්. ඒ වාගේම වෙබ් අඩවියට පිවිස අන්තර්ජාලය ඔස්සේ තම ආදායම් බලපත්‍රය ලබා ගන්නද පුළුවන්. ඉදිරි වර්ෂය තුළදී ජංගම දුරකථන මගින් ගෙවීම් කර බලපත්‍රය ලබා ගැනීමේ පහසුකම සලසා දීමට කටයුතු කිරීම අපේ ඉලක්කයයි.

දැනට පවතින හිඟ මෝටර් රථ බලපත්‍ර ආදායම රුපියල් මිලියන 2,000 ක් පමණ වෙනවා. මෙවා එකතු කර ගැනීමට නොයෙක් ක්‍රමවේද අනුගමනය කරනවා. හිඟ ආදායම එකතු කර ගන්නවා සේම ඉදිරියේදී හිඟ ඇති වීම වළක්වා ගැනීම සඳහා ද අවශ්‍ය කටයුතු කිරීම අපගේ වගකීමක් සේ මා දකිනවා. වාහන බලපත්‍ර හිමියන් වෙත තම ආදායම් බලපත්‍රය අවලංගු වීමට දින 3 කට පෙර කෙටි දුරකථන පණිවුඩයක් (SMS) මගින් එය දැනුම් දීමත්, ආදායම් බලපත්‍ර අවලංගු වී මාසයක් ඉකුත් වී ඇති වාහන හිමියන් වෙත කෙටි දුරකථන පණිවුඩ හා ලිඛිතව සිහි කැඳවීම් යැවීමත් ඉදිරි වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අප බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමනි, අවසාන වශයෙන් මා විශේෂ යමක් සඳහන් කිරීමට කැමැතියි. පළාත් සභාවට ස්ථිර නිවහනක් නොමැති වීම නිසා අපට නොයෙක් දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදු වුණා. මෙම අඩුව සම්පූර්ණ කරමින් මහල් 15 කින් යුත් අංග සම්පූර්ණ ගොඩනැගිල්ලක් ඉදි කිරීමට අවශ්‍ය සියලු කටයුතු සැලසුම් කර තිබෙනවා. මෙම වර්ෂය අවසන් කිරීමට පෙර එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම අපේ අරමුණයි. මේ සඳහා ඇස්තමේන්තු මුදල රුපියල් මිලියන 4,600 ක් පමණ වන අතර ලබන වර්ෂයට අවශ්‍ය මුදල වන රුපියල් මිලියන 1,000 ක් මෙම මුදල් ප්‍රකාශයෙන් වෙන් කරනවා.

## ස්තූතිය
THANKING

මෙතෙක් වේලා අයවැය කථාවට සවන් දුන් ඔබ සියලු දෙනාටම මගේ ගෞරවනීය ස්තූතිය පුද කරනවා. 2014 මුදල් ප්‍රකාශය පිළියෙල කිරීමේදී මහත් කැපවීමෙන් කටයුතු කළ ප්‍රධාන ලේකම්තුමිය ඇතුළු පළාත් භාණ්ඩාගාරයේ අයවැය අංශයේ සියලුම නිලධාරීන්ටද, පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්ටද, පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට ද, අනෙකුත් කාර්යාලවල ආයතන ප්‍රධානීන්ට ද මාගේ හෘදයාංගම ස්තූතිය මේ අවස්ථාවේදී පුද කර සිටිනවා. එමෙන්ම වාර්තා කිරීමේ යෙදී සිටි ජනමාධ්‍යවේදීන්ටද, සංවිධාන කටයුතු සහ පහසුකම් සැපයූ සභා ලේකම් ඇතුළු එම කාර්ය මණ්ඩලයටද නන් අයුරින් මේ සඳහා දායක වූ සියලු දෙනාටද මාගේ අවංක ස්තූතිය පුද කරනවා.

ගරු සභාපතිතුමනි, ඉදිරි වර්ෂයේදී අලුත් පළාත් සභාවක් තුළ අප සියලු දෙනාටම එකට කටයුතු කරමින් පළාතේ ජනතාවට සේවය කිරීමට හැකියාව ලැබේවා යැයි ප්‍රාර්ථනා කරමින් 2014 වසරේ අයවැය කථාව මා මෙතැනින් අවසන් කරනවා.

## පළමුවන උපලේඛනය
## පුනරාවර්තන වියදම් සාරාංශය

| කාණ්ඩ වර්ගීකරණය | 2012 සත්‍ය වියදම | 2013 ඇස්තමේන්තුව | 2014 ඇස්තමේන්තුව | |
|---|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 | මුළු ගණනින් ප්‍රතිශතය |
| පුද්ගල පඩිනඩි | 20,231,015 | 22,314,412 | 24,651,897 | 64.766 |
| ගමන් වියදම් | 165,598 | 180,930 | 213,638 | 0.561 |
| සැපයීම් | 680,615 | 758,828 | 785,333 | 2.062 |
| නඩත්තු වියදම් | 639,481 | 647,817 | 616,172 | 1.619 |
| ගිවිසුම්ගත සේවා | 705,116 | 852,857 | 964,841 | 2.535 |
| මාරු කිරීම් හා ප්‍රදාන | 8,724,606 | 10,077,347 | 10,598,534 | 27.845 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 212,024 | 238,757 | 232,810 | 0.612 |
| **මුළු පුනරාවර්තන වියදම් එකතුව** | **31,358,455** | **35,070,948** | **38,063,225** | **100.000** |

## දෙවන උපලේඛනය
## ආදායම් ශීර්ෂ අනුව 2012 එකතු කරන ලද ආදායම හා 2013, 2014 ආදායම් ඇස්තමේන්තුව

රු. '000

| අංක | ආදායම් විස්තර | ආදායම් ශීර්ෂය | එකතු කරන ලද ආදායම 2012 | සංශෝධිත ඇස්තමේන්තුව 2013 | ඇස්තමේන්තුව 2014 |
|---|---|---|---|---|---|
| 1. | රා තැබෑරුම් රේන්ද | 10.02.04.03 | 42,448 | 36,000 | 40,000 |
| 2. | රා මැදීමේ බලපත්‍ර ගාස්තු | 10.02.04.04 | 30 | 25 | 25 |
| 3. | මෙරට මත්පැන් බලපත්‍ර ගාස්තු | 10.02.04.05 | 247,110 | 250,000 | 250,000 |
| 4. | පිටරට මත්පැන් තැබෑරුම් රේන්දය | 10.02.04.06 | 5,189 | 5,000 | 5,000 |
| 5. | මුද්දර ගාස්තු (2011 අංක 13 දරන පළාත් සභා (මුද්දර ගාස්තු මාරු කිරීම) පනත යටතේ) | 10.02.07.00 | 3,137,118 | 3,600,000 | 4,000,000 |
| 6. | තැපැල් හා උසාවි කටයුතු හැරුණු විට ඇති ගිවිසුම් ගාස්තු ඇතුළු මුද්දර ගාස්තු | 10.02.07.01 | 6,913,349 | 6,000,000 | 7,600,000 |
| 7. | උසාවි ලේඛන යටතේ මුද්දර ගාස්තු | 10.02.07.02 | | 55,000 | 55,000 |
| 8. | පිරිවැටුම් බද්ද | 10.02.09.00 | 87,353 | 60,000 | 60,000 |
| 9. | ජාතිය ගොඩනැගීමේ බද්ද | 10.02.12.00 | 9,099,006 | 14,640,000 | 12,800,000 |
| 10. | මෝටර් වාහන බලපත්‍ර ගාස්තු | 10.03.01.01 | 2,373,192 | 2,450,000 | 3,000,000 |
| 11. | පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේ ගාස්තු | 10.03.07.01 | | 3,000 | 3,500 |
| 12. | බඩු උකස් ගන්නන්ගෙන් අය කරන වාර්ෂික බලපත්‍ර ගාස්තු | 10.03.07.10 | 2,485 | 3,000 | 3,000 |
| 13. | තෑගි තරග බදු | 10.03.07.11 | 248,997 | 200,000 | 240,000 |
| 14. | රජයේ ගොඩනැගිලි බදු කුලී | 20.02.01.01 | 12,176 | 12,000 | 12,000 |
| 15. | රජයේ කැලෑවලින් ලැබෙන ආදායම් | 20.02.01.02 | 568 | 1,000 | 1,000 |
| 16. | ඉඩම් හා අනෙකුත් බදු කුලී | 20.02.01.03 | 96,879 | 110,000 | 130,000 |
| 17. | පොළී - රජයේ නිලධාරීන්ගේ ණය හා අත්තිකාරම් | 20.02.02.02 | 209,929 | 200,000 | 222,209 |
| 18. | පොළී - ආයෝජන | 20.02.02.03 | 1,266,069 | 875,000 | 650,000 |
| 19. | මෝටර් රථ ප්‍රවාහන පනත යටතේ අය කරන ගාස්තු හා අනෙකුත් ලැබීම් | 20.03.02.14 | 806,672 | 700,000 | 800,000 |
| 20. | කෘෂිකර්ම කටයුතු | 20.03.02.18 | 4,964 | 5,200 | 6,000 |
| 21. | සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය කටයුතු | 20.03.02.23 | 7,837 | 9,000 | 9,000 |
| 22. | සෞඛ්‍ය සේවාවන් | 20.03.02.24 | 3,179 | 3,000 | 3,500 |
| 23. | ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ කටයුතු | 20.03.02.29 | 27,261 | 33,600 | 45,000 |
| 24. | ඛණිජ බදු | 20.03.02.30 | | 5,000 | 5,000 |
| 25. | විවිධ | 20.03.02.99 | 664,902 | 72,430 | 100,000 |
| 26. | උසාවි දඩ | 20.03.03.01 | 687,142 | 600,000 | 700,000 |
| 27. | පෞද්ගලික බස් රථ පනත යටතේ අය කරන ගාස්තු | 20.03.03.03 | 15,113 | 33,000 | 35,000 |
| 28. | මෝටර් වාහනවලින් අය කරන දඩ මුදල් | 20.03.03.04 | 139,548 | 150,000 | 170,000 |
| 29. | ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ ප්‍රඥප්තිය යටතේ වන්දි ලැබීම් | 20.03.03.05 | 4,991 | 5,000 | 7,000 |
| 30. | විවිධ ප්‍රාග්ධන වත්කම් විකිණීම | 20.06.02.00 | | 1,000 | 30 |
| | **එකතුව** | | **26,103,507** | **30,117,255** | **30,952,264** |

### තුන්වන උපලේඛනය
### රජයෙන් ලැබීමට අපේක්ෂිත ප්‍රදාන

රු. *'000*

| | 2013 | 2014 |
|---|---|---|
| පුනරාවර්තන ප්‍රදාන | 8,501,755 | 9,000,000 |
| පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 1,266,000 | 1,270,000 |
| විශේෂ ව්‍යාපෘති යටතේ ප්‍රදාන | 435,000 | 1,510,000 |
| උපමාන පාදක ප්‍රදාන | 370,000 | 475,000 |
| රජයෙන් අපේක්ෂිත ප්‍රදාන | | 500,000 |
| එකතුව | **10,572,755** | **12,755,000** |

### හතරවන උපලේඛනය
### සමස්ත අයවැයෙන් ප්‍රාග්ධන වියදම් ප්‍රතිශතය

රු. *'000*

| | 2011 | 2012 | 2013 |
|---|---|---|---|
| වර්ෂය මුල ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තුව | 20,011,305 | 5,203,458 | 5,119,062 |
| වර්ෂය අග ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තුව | 3,452,996 | 6,078,458 | 5,912,062 |
| වර්ෂය මුල ප්‍රාග්ධන වියදම් ප්‍රතිශතය | 6.35 | 14.09 | 12.74 |
| වර්ෂය අග ප්‍රාග්ධන වියදම් ප්‍රතිශතය | 9.94 | 15.84 | 14.21 |

## 2014 වාර්ෂික මුදල් ප්‍රකාශයට අදාළ විසර්ජන ප්‍රඥප්තිය :
## APPROPRIATION STATUTE RELEVANT TO THE FINANCIAL STATEMENT OF 2014

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

*"2014 වර්ෂය වෙනුවෙන් වූ මුදල් ප්‍රකාශයට අදාළ විසර්ජන ප්‍රඥප්තිය අනුමත කළ යුතුය."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමාට බෙහෙවින්ම ස්තූතිවන්ත වෙනවා, 2014 වර්ෂයට වෙන් වූ මුදල් ප්‍රකාශය සහ ඊට අදාළ විසර්ජන ප්‍රඥප්තිය ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන්. ඒ වාගේම මෙම මුදල් ප්‍රකාශය පිළිබඳ සියලු අමාත්‍යාංශ වැය ශීර්ෂයන් පිළිබඳ සාකච්ඡාව 2013 දෙසැම්බර් මස 03, 04, 05 සහ 06 යන දිනයන්හිදී උදෑසන 09.00 සිට පස්වරු 05.00 දක්වා මෙම සභා ගර්භයේදී පැවැත්වෙනවා. ඒ නිසා මම ගරු මන්ත්‍රීතුමන්ලාට ඉතාමත්ම ගෞරවයෙන් ආරාධනා කරනවා. එම කාලය තුළ ගණ පූර්ණය ආරක්ෂා කර ගනිමින් මේ සභා ගර්භය තුළ රැඳී සිටින ලෙස.

## කල් තැබීමේ යෝජනාව
## ADJOURNMENT

**ගරු සුනිල් ජයමිණි - සභානායකතුමා**
Hon. Hon. Sunil Jayamini - Leader of the House

*ගරු සභාපතිතුමනි, "දැන් මම මෙම සභාව කල් තැබිය යුතු යැයි" යෝජනා කරනවා.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 12.40 ට, 2013 දෙසැම්බර් මස 03 වන දින පූ.භා. 09.00 වන තෙක් කල් ගියේය.***
*Sitting, accordingly adjourned at 12.40 p.m till 09.00 a.m. on 03.12.2013*